90 වන කාණ්ඩය
15 වන කලාපය

බ්‍රහස්පතින්දා
1970 සැප්තැම්බර් 10

පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

තියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

නිල වාතීාව

අන්තර්ගත ප්‍රධාන කරුණු

ඔඩිටර් ජනරාල්ගේ වාර්තාව [නී. 1705]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [නී.1708]

ශුභ ප්‍රාර්ථනා : වැඩ බලන රාජ්‍ය නායක ගරු මෛත්‍රිපාල සේනානායක [නී. 1723]

නිවැසියන් ආරක්ෂා කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත [නී. 1726]

පළමුවන වර කියවන ලදී.

අතුරු සම්මත ගිණුම (1970-71) [නී. 1727]

විවාදය කල් තබන ලදී.

පරිපූරක මුදල් [නී. 1775]

කල් තැබීමේ යෝජනාව [නී. 1860]

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු [නී. 1873]

පරිශිෂ්ට [නී. 1879]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 90
இல. 15

வியாழக்கிழமை
10 செப்டெம்பர் 1970

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

பிரதிநிதிகள் சபை

அதிகார அறிக்கை

பிரதான உள்ளடக்கம்

கணக்காளர் நாயகத்தின் அறிக்கை [ப. 1705]

வினுக்களுக்கு வாய்மூல விடைகள் [ப. 1708]

நல்வாழ்த்து : பதில் அரசாங்கத்தலைவர் கௌரவ மைத்திரிபால சேனநாயக்க [ப. 1723]

வாடகைக் குடியிருப்பாளர் பாதுகாப்பு (சிறப்பேற்பாடுகள்) மசோதா : [ப. 1726]
முதன்முறை மதிப்பிடப்பட்டது

கணக்கு வாக்குப்பணம் (1970-71) [ப. 1727]
விவாதம் ஒத்திவைக்கப்பட்டது

குறை நிரப்புத் தொகை [ப. 1775]

ஒத்திவைப்புப் பிரேரணை [ப. 1860]

வினுக்களுக்கு எழுத்துமூல விடைகள் [ப. 1873]

அநுபந்தங்கள் [ப. 1879]

Volume 90
No. 15

Thursday
10th September 1970

PARLIAMENTARY DEBATES

(HANSARD)

HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

PRINCIPAL CONTENTS

AUDITOR-GENERAL'S REPORT [Col. 1705]

ORAL ANSWERS TO QUESTIONS [Col. 1708]

FELICITATIONS : THE HON. MAITHRIPALA SENANAYEKE, ACTING HEAD OF THE GOVERNMENT [Col. 1723]

PROTECTION OF TENANTS (SPECIAL PROVISIONS) BILL : [Col. 1726]
Read the First Time

VOTE ON ACCOUNT (1970-71) [Col. 1727]
Debate adjourned

SUPPLEMENTARY SUPPLY [Col. 1775]

ADJOURNMENT MOTION [Col. 1860]

WRITTEN ANSWERS TO QUESTIONS [Col. 1873]

APPENDICES [Col. 1879]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඔඩිටර් ජනරාල්ගේ වාර්තාව

නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

பிரதிநிதிகள் சபை

House of Representatives

1970 සැප්තැම්බර් 10 වන බ්‍රහස්පතින්දා

வியாழக்கிழமை, 10 செப்ரெம்பர் 1970

Thursday, 10th September 1970

අ. භා. 2 ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය. කථානායකතුමා [ගරු ස්ටැන්ලි තිලකරත්න] මූලාසනාරූඪ විය.

சபை, பி. ப. 2 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [கௌரவ ஸ்ரன்லி திலகரத்ன] தலைமை தாங்கினர்கள்.

The House met at 2 P.M., Mr. Speaker [The Hon. Stanley Tillekeratne] in the Chair.

ඔඩිටර් ජනරාල්ගේ වාර්තාව

கணக்காளர் நாயகத்தின் அறிக்கை

Auditor-General's Report

කථානායකතුමා

(சபாநாயகர் அவர்கள்)

(Mr. Speaker)

1946 සහ 1947 ලංකා ආණ්ඩු ක්‍රම හා ස්වාධීනතා රාජ සභා ආඥාවල 71(2) වැනි ඡේදය අනුව 1968-69 මුදල් වර්ෂයේ ලංකා ආණ්ඩුවේ ගිනුමේ පළමුවැනි කොටස පිළිබඳ ඔඩිටර් ජනරාල් වරයාගේ වාර්තාවේ 4 වැනි කොටස මම ඉදිරිපත් කරමි.

ගරු මෛත්‍රීපාල සේනානායක (වාරිමාර්ග, විදුලි බලය හා මහාමාර්ග ඇමති, වැඩ බලන රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු ඇමති සහ සභානායක)

(கௌரவ மைத்திரிபால சேனநாயக்க— நீர்ப்பாசன, மின்சக்தி, பெருவீதிகள் அமைச்சரும், பதில் பாதுகாப்பு, வெளிவிவகார அமைச்சரும், சபை முதல்வரும்)

(The Hon. Maithripala Senanayeke—Minister of Irrigation, Power & Highways and Acting Minister of Defence & External Affairs and Leader of the House)

1946 සහ 1947 ලංකා ආණ්ඩු ක්‍රම හා ස්වාධීනතා රාජ සභා ආඥාවල 71(2) වැනි ඡේදයට අනුව 1968-69 මුදල් වර්ෂයේ

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම

ලංකා ආණ්ඩුවේ ගිණුමේ පළමුවැනි කොටස පිළිබඳ ඔඩිටර් ජනරාල්වරයාගේ වාර්තාවේ 4 වැනි කොටස මුද්‍රණය කළ යුතු යයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින් සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Question put, and agreed to.

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.

அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.

Ordered that the Report be printed.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම

சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்

Papers Presented

1967.10.1 දින සිට 1968.9.30 දින තෙක් වූ කාල පරිච්ඡේදය සඳහා ජල සම්පත් මණ්ඩලයේ වාර්තාව. —[ගරු මෛත්‍රීපාල සේනානායක]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.

சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.

Ordered to lie upon the Table.

1969 අංක 1 දරණ ආනයන හා අපනයන (පාලන) පනතේ 4(3) සහ 14(ආ) වැනි වගන්ති යටතේ පනවන ලද නියෝගය.—[ගරු පී. ආර්. රත්නායක]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.

சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.

Ordered to lie upon the Table.

1969-70 අංක 12 දරණ පරිපූරක ඇස්තමේන්තුව. —[ගරු එස්. එස්. කුලතිලක]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.

சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.

Ordered to lie upon the Table.

1969-70 අංක 10 දරණ පරිපූරක ඇස්තමේන්තුව. —[වැවිලි කර්මාන්ත ඇමති සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු ඇමති වෙනුවට ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.

சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.

Ordered to lie upon the Table.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

1969-70 අංක 15 දරණ පරිපූරක ඇස්තමේන්තුව. —[ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදි.

சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.

Ordered to lie upon the Table.

ජනතා කමිටු පිහිටුවීම පිළිබඳ යෝජනාවලිය ඇතුළත් ධවල පත්‍රිකාව.—[ගරු නිල්ද අල්විස්]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදි.

சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.

Ordered to lie upon the Table.

1969-70 අංක 11 සහ 13 දරණ පරිපූරක ඇස්තමේන්තු.—[අධ්‍යාපන ඇමති වෙනුවට ගරු එම්. පී. ද සෙයිසා සිරිවර්ධන]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදි.

சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.

Ordered to lie upon the Table.

1969-70 අංක 14 දරණ පරිපූරක ඇස්තමේන්තුව. —[ගරු එස්. ඩී. ආර්. ජයරත්න]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදි.

சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.

Ordered to lie upon the Table.

(1) 1963 අංක 6 දරණ ගිනිකුරු නිෂ්පාදනය (විධිමත් කිරීමේ) පනතේ 3(3) වැනි වගන්තිය යටතේ කර්මාන්ත හා සිවර ඇමති විසින් පනවන ලද නිවේදන දෙකක්; සහ

(2) 1964-65 වර්ෂය සඳහා ලංකා සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලයේ වාර්තාව.—[ගරු පී. බී. සුබසිංහ]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදි.

சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.

Ordered to lie upon the Table.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

கிளுக்கலுக்கு வாய்மூல விடைகள்

ORAL ANSWERS TO QUESTIONS

වාහන ආනයනය

வாகன இறக்குமதி

VEHICLE IMPORTS

1. එම්. තෙන්නකෝන් මයා. (නිකවැරටිය)

(திரு. எம். தென்னகோன்—நிக்கவரட்டிய)

(Mr. M. Tennakoon—Nikaweratiya)

විදේශීය හා දේශීය වෙළඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) පසුගිය අවුරුදු 5 ඇතුළත මෙරටට ගෙන්වූ නොයෙකුත් වාහන වෙනුවෙන් වැයවී ඇති මුදල කොපමණද? (ආ) එය විස්තර සහිතව ඉදිරිපත් කරනවාද? (ඉ) එම වාහන ගෙන්වූයේ කවුද?

வெளிநாட்டு உள்நாட்டு வர்த்தக அமைச்சரைக் கேட்ட வினா: (அ) கடந்த 5 ஆண்டுகளில் இந்நாட்டில் இறக்குமதி செய்யப்பட்ட வாகனங்களுக்கு எவ்வளவு பணம் செலவிடப்பட்டது? (ஆ) அவ்விபரங்களைச் சமர்ப்பிப்பாரா? (இ) அவ்வாகனங்களை இறக்குமதி செய்தவர் யார்?

asked the Minister of Foreign and Internal Trade: (*a*) How much has been expended on the import of various vehicles during the past 5 years? (*b*) Will he give details of such imports? (*c*) Who imported such vehicles?

ගරු පී. ආර්. රත්නායක (වැඩබලන විදේශීය හා දේශීය වෙළඳ ඇමති)

(கௌரவ பீ. ஆர். ரத்நாயக்க—பதில் வெளிநாட்டு, உள்நாட்டு வர்த்தக அமைச்சர்)

(The Hon. P. R. Ratnayake—Acting Minister of Foreign and Internal Trade)

(අ) 1965-1969 කාල පරිච්ඡේදය තුළ ආනයන හා අපනයන පාලක විසින් නිකුත් කරන ලද බලපත්‍රවල සම්පූර්ණ වටිනාකම රුපියල් 2,17,54,313.24 කි. කර්මාන්ත හා විද්‍යාකටයුතු පිළිබඳ අමාත්‍යාංශය මාර්ගයෙන් රාජ්‍ය සංස්ථා විසින් මෙම කාලපරිච්ඡේදය තුළ ආනයනය කරන ලද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාහනවල වටිනාකම රුපියල් 1,91,07,031.40. (ආ) සහ (ඉ) ආනයන සහ අපනයන පාලක විසින් නිකුත් කරන ලද බලපත්‍ර මත වාහන ආනයනය කළ අයගේ නම් සහ ආනයනයන් පිළිබඳ විස්තර I වැනි උපලේඛනයේ දැක්වේ.* කර්මාන්ත හා විද්‍යා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය මාර්ග යෙන් රාජ්‍ය සංස්ථා විසින් ආනයනය කරන ලද වාහන පිළිබඳ විස්තර II වැනි උපලේඛනයේ දැක්වේ.*

ගොවි යන්ත්‍රෝපකරණ ආනයනය
விவசாய யந்திரங்கள் இறக்குமதி
AGRICULTURAL MACHINERY IMPORTS

2. එම්. තෙන්නකෝන් මයා.
(திரு. எம். தென்னகோன்)
(Mr. M. Tennakoon)

විදේශීය හා දේශීය වෙළඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) පසුගිය අවුරුදු 5 ඇතුළත කොපමණ ගොවිතැනට අවශ්‍ය යන්ත්‍ර මෙරටට ගෙන්වා තිබේද? (ආ) ඒවායේ වටිනාකම කොපමණද? (ඉ) ඒවා ගෙන් වූයේ කවුද?

வெளிநாட்டு, உள்நாட்டு வர்த்தக அமைச்சரைக் கேட்ட வினா: (அ) கடந்த 5 ஆண்டுகளில் விவசாயத்திற்குத் தேவையான யந்திரங்கள் எவ்வளவு இந்நாட்டில் இறக்குமதி செய்யப்பட்டுள்ளன? (ஆ) அவற்றின் பெறுமதி எவ்வளவு? (இ) அவற்றை இறக்குமதி செய்தவர் யார்?

asked the Minister of Foreign and Internal Trade: (*a*) Will he state what quantity of agricultural machinery has been imported during the past 5 years? (*b*) What is the value of such machinery? (*c*) Who imported the machinery?

ගරු පී. ආර්. රත්නායක
(கௌரவ பீ. ஆர். ரத்நாயக்க)
(The Hon. P. R. Ratnayake)

(අ) ව්‍යාපාරික පංගු බලපත්‍ර මත ආනයනය කැරෙන කෘෂිකාර්මික යන්ත්‍ර සම්බන්ධයෙන් ප්‍රමාණානුසාරව සැකසූ වාර්තා ආනයන හා අපනයන පාලක කාර්යාලයේ තබා නැත. ප්‍රමාණයන් පිළිබඳ විස්තර ලබා ගත හැක්කේ ඒකාන්ත පරිහරණ බලපත්‍ර යටතේ ආනයනය කැරෙන බඩු සම්බන්ධයෙන් පමණි. මෙම ආනයනයන් පිළිබඳ විස්තර මෙයට අමුනා ඇති 1 වැනි උපලේඛනයෙහි දැක්වේ.* (ආ) 7,25,98,489. (ඉ) ඒකාන්ත පරිහරණය ආනයනකයන්ගේ නම් I වැනි උපලේඛනයෙහි ද ව්‍යාපාරික පංගු බලපත්‍ර යටතේ එන ආනයනකයන්ගේ නම් II වැනි උපලේඛනයෙහිද දැක්වේ.*

එම්. තෙන්නකෝන් මයා.
(திரு. எம். தென்னகோன்)
(Mr. M. Tennakoon)

පළමු වැනි, දෙවැනි, තුන් වැනි වශයෙන් මේවා වැඩියෙන්ම ගෙන්වා තිබෙන සමාගම් තුන මොනවාදැයි ගරු ඇමතිතුමා කියනවාද?

ගරු පී. ආර්. රත්නායක
(கௌரவ பீ. ஆர். ரத்நாயக்க)
(The Hon. P. R. Ratnayake)

සීමාසහිත බවර් සහ සමාගම—

එම්. තෙන්නකෝන් මයා.
(திரு. எம். தென்னகோன்)
(Mr. M. Tennakoon)

වටිනාකම කොච්චරද?

ගරු පී. ආර්. රත්නායක
(கௌரவ பீ. ஆர். ரத்நாயக்க)
(The Hon. P. R. Ratnayake)

24,000 යි. හැබැයි මේ ලැයිස්තුවේ පළමු වැනි, දෙවැනි, තුන්වැනි ආදී වශයෙන් සඳහන් කර නැහැ. මේ ඉදිරිපත් කර තිබෙන ලැයිස්තුව කියෙව්වාම ගරු මන්ත්‍රීතුමාට විස්තර දැන ගන්නට පුළුවනි.

PUBLIC LIBRARY JAFFNA.

---

* අද දින නිල වාර්තාවෙහි I වන පරිශිෂ්ටයෙහි මෙම ලේඛන පළ කර ඇත.
* இவ்வறிக்கை, இன்றைய அதிகார அறிக்கைக்கான அநுபந்தம் I இல் தரப்படுகின்றது.
* *These statements appear in Appendix I to this Day's Official Report.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

දුම්රිය දෙපාර්තමේන්තුවේ විදින මැෂින් ක්‍රියාකරු කේ. ඒ. ප්‍රනාන්දු මහතා

புகையிரதத்திணைக்கள துளைகருவி இயக்குனர் திரு. கே. ஏ. பெர்னாந்து

MR. K. A. FERNANDO, DRILLING MACHINE OPERATOR, RAILWAY

3. **ආර්. ප්‍රේමදාස මයා.** (මෘදු කොළඹ පළමුවන)

(திரு. ஆர். பிரேமதாச—கொழும்பு மத்தி முதலாம் அங்கத்தவர்)

(Mr. R. Premadasa—First Colombo Central)

ප්‍රවාහණ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) දුම්රිය දෙපාර්තමේන්තුවේ, දුම්රිය මාර්ග හා කර්මාන්ත උප දෙපාර්තමේන්තුවේ කොළඹ මාර්ග පෝමන් කර්මාන්ත ශාලාවේ විදින මැෂින් ක්‍රියාකරු හා සමස්ත ලංකා දුම්රිය මාර්ග හා කර්මාන්ත එක්සත් කම්කරු සමිතියේ ප්‍රධාන ලේකම් කේ. ඒ. ප්‍රනාන්දු මහතාට එම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු එන්. එස්. සිල්වා මහතා ඇතුළු කණ්ඩායමක් විසින් තර්ජනය කිරීම නිසා 1970 මැයි මස 30 වැනිදා සිට 1970 ජූනි මස 10 වැනිදා දක්වා රාජකාරියට පැමිණීමට ඔහුට නොහැකිවූ බව එතුමා දන්නවාද? (ආ) 1970 ජූනි මස 10 වැනිදා ඔහු රාජකාරියට පැමිණි විට එන්. එස්. සිල්වා ඇතුළු කණ්ඩායමක් ඔහු මැරීමට තර්ජනය කළ බවත්, මේ ගැන ඔහු එතැන සිට පෝමන් වරුන් වන විලී පොන්සේකා හා නිමල් ප්‍රනාන්දු යන මහතුන්ට පැමිණිලි කළ බවත් එතුමා දන්නවාද? (ඉ) එදිනම මේ ගැන ඔහු මරදාන පොලිසියට පැමිණිලි කළ අතර දුම්රිය සාමාන්‍යාධිකාරිතැනට ලිපියකින් පැමිණිලි කළ බව එතුමා දන්නවාද? (ඊ) මෙම පැමිණිල්ල ගැන දුම්රිය සාමාන්‍යාධිකාරි තැන ක්‍රියා නොකළ හෙයින් එදිනම තවත් ලිපියකින් ඔහු තම ජීවිතාරක්ෂාව සඳහා මීගමුවට මාරුවීමක් දුම්රිය සාමාන්‍යාධිකාරී තැනගෙන් ඉල්ලා සිටි බව එතුමා දන්නවාද? (උ) ඉහත සඳහන් පැමිණිලි ගැන හෝ මාරුවීමක් ඉල්ලා යැවූ අභියාචනය ගැන හෝ දුම්රිය සාමාන්‍යාධිකාරී මෙතෙක් ක්‍රියා කොට නොමැති බව එතුමා දන්නවාද? (ඌ) කේ. ඒ. ප්‍රනාන්දු මහතාට මැයි මාසය සඳහා ජූනි මාසයේදී ගෙවිය යුතු වේතනය මෙතෙක් ගෙවා නැති බව එතුමා දන්නවාද? (එ) මෙම පැමිණිලි, අභියාචනය හා ඔහුගේ වේතනය ගෙවීම සම්බන්ධයෙන් නිසි පියවර ගැනීමට එතුමා ක්‍රියා කරනවාද?

වාචික පිළිතුරු

போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா: (அ) புகையிரதத் திணைக்களத்தின் புகையிரதப் பாதை, தொழிற் பகுதியின் கொழும்பு பாதை போமன் தொழிற்சாலையின் துளை கருவி இயக்குனரும் அகில இலங்கை புகையிரதப்பாதை, தொழில் ஐக்கிய தொழிலாளர் சங்கத்தின் பொதுச் செயலாளருமான கே. ஏ. பெர்னாந்து அவர்களை அத்திணைக்களத்தைச் சேர்ந்த என். எஸ். சில்வா அவர்கள் உட்பட ஒரு குழுவினர் பயமுறுத்தியதனால் 1970 மே மாதம் 30 ஆம் தேதி தொடக்கம் 1970 யூன் மாதம் 10 ஆம் தேதி வரை கடமைபுரிய அவருக்கு இயலவில்லை என்பதை அவர் அறிவாரா? (ஆ) 1970 யூன் மாதம் 10 ஆம் தேதி அவர் கடமைபுரிய வந்தபோது என். எஸ். சில்வா அவர்கள் உட்பட ஒரு குழுவினர் அவரைக் கொல்வதாகப் பயமுறுத்தியதையும், இதுபற்றி அவ்விடமிருந்த திரு. வில்லி பொன்சேக்கா, திரு. நிமல் பெர்னாந்து ஆகியோரிடம் முறையிட்டதையும் அவர் அறிவாரா? (இ) அன்றே, இது பற்றி மருதானைப் பொலிசில் முறையிட்டதோடு புகையிரத பொது மூகாமையாளருக்கும் கடிதம் மூலம் முறையிட்டதையும் அவர் அறிவாரா? (ஈ) இம் முறைப்பாடு பற்றி புகையிரத பொது மூகாமையாளர் நடவடிக்கை எடுக்காமையால் அன்றே வேறொரு கடிதம் மூலம் அவர் தமது பாதுகாப்பிற்காக நீர்கொழும்பிற்கு மாற்றும்படி புகையிரத பொது மூகாமையாளரைக் கேட்டுக்கொண்டதையும் அவர் அறிவாரா? (உ) மேற்குறிப்பிட்ட முறைப்பாடு பற்றியோ, மாற்றங்கோரி அனுப்பிய வேண்டுகோள் பற்றியோ இது வரை புகையிரத பொது மூகாமையாளர் நடவடிக்கை எடுக்கவில்லை என்பதையும் அவர் அறிவாரா? (ஊ) கே. ஏ. பெர்னாந்து அவர்களின் மே மாதத்திற்குரிய யூன் மாதத்தில் கொடுபடவேண்டிய சம்பளம் இதுவரை கொடுபடவில்லை என்பதையும் அவர் அறிவாரா? (எ) இம்முறைப்பாடு, வேண்டுகோள், அவருடைய சம்பளத்தை கொடுத்தல் ஆகியவைகள் பற்றி அவர் உரிய நடவடிக்கை எடுப்பாரா?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

asked the Minister of Communications : (*a*) Is he aware that Mr. K. A. Fernando, a drilling machine operator in the Way Foreman's Workshop in Colombo, in the Way and Works Sub-Department of the Railway Department, who is also the General Secretary of the All-Ceylon Way and Works United Workers' Union, was threatend by a group of persons including Mr. N. S. Silva of the same department and that as a result of this threat Mr. Fernando was compelled to be absent from duty during the period 30th May 1970 to 10th June 1970 ? (*b*) Is he aware that when he did report for duty on the 10th of June 1970 he was once again threatened with death by a group of persons including the said N. S. Silva and that he complained of this threat to two foremen, namely Mr. Willie Fonseka and Mr. Nimal Fernando, who were present on the spot ? (*c*) Is he aware that on the same day he made a complaint regarding this threat to the Maradana Police and that he also complained to the General Manager of Railways by letter ? (d) Is he aware that since the General Manager did not take action on his complaint he wrote a further letter to the General Manager requesting that he be transferred to Negombo so that his life may not be endangered ? (*e*) Is he aware that up to now the General Manager has taken no action regarding the complaint or the appeal for a transfer ? (*f*) Is he aware that salary for the month of May, payable in June, has not been paid to Mr. K. A. Fernando ? (*g*) Will he take appropriate action regarding the complaints, the appeal for a transfer, and also the payment of salary due to him ?

ටී. බී. එම්. හේරත් මයා. (ප්‍රවාහණ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)

(திரு. ரீ. பி. எம். ஹேரத்—போக்குவரத்து அமைச்சரின் பாராளுமன்றக் காரிய தரிசி)

(Mr. T. B. M. Herath—Parliamentary Secretary to the Minister of Communications)

(අ) නැත. කෙසේ වුවද කේ. ඒ ප්‍රනාන්දු මහතා 1970 මැයි මස 30 වැනිදා සිට ජූනි මස 10 වැනිදා දක්වා රාජකාරිය සඳහා නො පැමිණි බව නිවැරදිය. මෙම කාල පරිච්ඡේදය සඳහා ඔහුගේ නොපැමිණීම ආවරණය කිරීමට ආයුර්වේද වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කර ඇත. (ආ) තර්ජන කිරීමක් සම්බන්ධව කේ. ඒ. ප්‍රනාන්දු මහතා විසින් කිසිවකුට විරුද්ධව කළ පැමිණිල්ලක් ගැන මම නොදනිමි. ප්‍රනාන්දු මහතා ඇත්ත වශයෙන්ම 1970 ජූනි 10 වැනිදා නිල වශයෙන් රාජකාරිය සඳහා වාර්තා නොකළ නමුත්, කර්මාන්තශාලා භූමියෙහි සිටිනු පෝර්මන් තැන දැක ඇත. (ඉ) නොදනිමි. (ඊ) මීගමුවට ස්ථාන මාරු වීමක් ලබා ගැනීම සඳහා ප්‍රනාන්දු මහතා විසින් දුම්රිය සාමාන්‍යාධිකාරී සමග සාකච්ඡාවක් පැවැත්වූ බව නිවැරදිය. ඔහුගේ ශ්‍රේණියේ සේවකයකු සඳහා මීගමුවෙහි වහාම ඇතිවන පුරප්පාඩුවක් නොවූයෙන් දුම්රිය සාමාන්‍යාධිකාරී මැදිහත්වීම නිසා මාර්ග හා කර්මාන්ත ප්‍රධාන ඉංජිනේරු තැන විසින් ප්‍රනාන්දු මහතාට නාත්තන්ඩියට ස්ථාන මාරුවක් සලස්වා දී ඇත. (උ) (ඊ) හේතුකොටගෙන පැන නොනගී. (ඌ) 1970 මැයි මස සඳහා වූ වේතනය ප්‍රනාන්දු මහතාට ගෙවා ඇත. (එ) ප්‍රනාන්දු මහතාට ගෙවිය යුතු වේතනයක් නැත. මෙම නිලධාරියා මාරුකිරීම සම්බන්ධව කටයුතු කෙරෙනු ඇත.

සේවක අර්ථසාධක අරමුදල : ප්‍රතිලාභ ගෙවීම් පමාවීම

ஊ. சே. நி. பணம் வழங்குவதில் தாமதம்

DELAYS IN PAYMENT OF E.P.F. BENEFITS

5. ආචාර්ය ඩබ්ලිව්. දහනායක (ගාල්ල)

(கலாநிதி டபிள்யு. தஹநாயக்க—காலி)

(Dr. W. Dahanayake—Galle)

කම්කරු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවීම් ඇතැම් විට අවුරුදු දෙකකට වැඩි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

[ආචාර්ය ඩබ්ලිව්. දහනායක]

කාලයක්, නොනිසි ලෙස ප්‍රමාද කෙරෙන බව එතුමා දන්නේද? (ආ) මේ නිසා සේවකයින් අන්ත දුක්ඛිත තත්ත්වයකට පත්වන බව එතුමා දන්නේද? (ඉ) අනාගතයේදී ප්‍රමාදයන් වැළැක්වීමට එතුමා කවර පියවර ගන්නේද?

தொழில் அமைச்சரைக் கேட்ட வினா: (அ) ஊழியர் சேமலாபநிதியின் பணத்தைக் கொடுப்பதற்கு, சில சந்தர்ப்பங்களில் இரண்டு ஆண்டுகளுக்கு மேல், அநாவசியமாகத் தாமதப்படுத்துவதை அவர் அறிவாரா? (ஆ) இதனால், ஊழியர் கடும் துன்பத்திற்குள்ளாவதை அவர் அறிவாரா? (இ) எதிர்காலத்தில் இவ்வித தாமதத்தைத் தடுப்பதற்கு அவர் எவ்வித நடவடிக்கை எடுப்பார்?

asked the Minister of Labour: (*a*) Is he aware that the payment of Employees' Provident Fund benefits is being unduly delayed, sometimes for over two years? (*b*) Is he aware that employees are thereby reduced to abject misery? (*c*) What steps does he propose to take to avoid delays in the future?

හේමචන්ද්‍ර සිරිසේන මයා. (කම්කරු ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)

(திரு. ஹேமச்சந்திர சிறிசேன—தொழில் அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)

(Mr. Hemachandra Sirisena—Parliamentary Secretary to the Minister of Labour)

(අ) අතීතයේදී එවැනි ප්‍රමාදයන් තිබුණ බව මම දනිමි. (ආ) ඔව්. (ඉ). හැකි තාක් දුරට ප්‍රමාදයන් වළක්වාලීම සඳහා, 70.8.1 වැනි දින සිට අළුත් කාර්ය පරිපාටීන් ක්‍රියාත්මක කොට තිබේ.

වාචික පිළිතුරු

ගාල්ලේ, වක්වැල්ලේ පදිංචි එන්. ඩබ්ලිව්. ජී. සරනේලිස් අප්පු මහතාට සේවක අර්ථසාධක අරමුදලෙන් ලැබිය යුතු මුදල්

திரு. என். டபிள்யூ. ஜீ. சரனேலிஸ் அப்பு, காலி: தொ. ச. நி. பணம்

MR. N. W. G. SARANELISAPPU, WAKWELLA, GALLE: E.P.F. BENEFITS

6. **ආචාර්ය ඩබ්ලිව්. දහනායක**

(கலாநிதி டபிள்யூ. தஹநாயக்க)

(Dr. W. Dahanayake)

කම්කරු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ගාල්ලේ, වක්වැල්ලේ කොළඹ වත්තේ පදිංචි, 1967 ජනවාරි මාසයේදී විශ්‍රාම ලැබූ එන්. ඩබ්ලිව්. ජී. සරනේලිස් අප්පු මහතාට ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදලේ මුදල් (යොමු අංකය: 98/ජී/21) වහාම ගෙවීමට එතුමා නියෝග කරන්නේද? (ආ) මුදල් ගෙවීම දිගු කලක් ප්‍රමාදවීමට හේතුව කුමක්ද?

தொழில் அமைச்சரைக் கேட்ட வினா: (அ) 1967 ஜனவரியில் இளைப்பாறிய, காலி, வக்வல்லே திரு. என். டபிள்யூ. ஜீ. சரனேலிஸ் அப்பு குறிப்பு 98/G/21 என்பவருக்கு வழங்கப்பட வேண்டிய தொ. ச. நிதி கொடுப்பனவுகளை உடனடியாக வழங்கும்படி பணிப்பாரா? (ஆ) இக்கொடுப்பனவு நீண்ட காலத்திற்கு தாமதிக்கப்பட்டதேன்?

asked the Minister of Labour: (*a*) Will he order payment at once of the E. P. Fund moneys due to Mr. N. W. G. Saranelisappu of Colombawatte, Wakwella, Galle, who retired in January 1967—reference No. 98|G|21? (*b*) What is the reason for the long delay in payment?

හේමචන්ද්‍ර සිරිසේන මයා.

(திரு. ஹேமச்சந்திர சிறிசேன)

(Mr. Hemachandra Sirisena)

(අ) ඔව්. උපදෙස් දැනටමත් යවා ඇත. (ආ) එන්. ඩබ්ලිව්. ජී. සරනේලිස් අප්පු මහතා 67.1.12 වැනි දින දක්වා සේවයේ යෙදී ඇතත් සේවායා විසින් සේ. අ. අ. දායක මුදල් ගෙවා ඇත්තේ 1964 මාර්තු මාසය දක්වා පමණි. හිඟ ඇති දායක මුදල් එවන ලෙස සේවායාට උපදෙස් දී ඇතත් මේ දක්වා එම මුදල් ගෙවීමට සේවායා අපොහොසත් වී ඇති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හෙයින් නීති මාර්ගයෙන් එම මුදල් අය කර ගැනීම සඳහා විධිවිධාන යොදා ඇත. එකතු වී ඇති දායක මුදල් නීතිය මගින් ආපසු අයකර ගන්නා තෙක් 1964 මාර්තු මාසය දක්වා ඉහත සඳහන් සාමාජිකයා වෙනුවෙන් තැන්පත්ව ඇති සේ. අ. අ. ප්‍රතිලාභ ගෙවන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවට 70.8.26 වැනි දින දන්වා ඇත. මෙම හිඟ මුදල් ද ආපසු ලබාගත්තාසින් පසු ගෙවනවා ඇත.

asked the Minister of Labour: (*a*) Is he aware that, notwithstanding the sending up of all necessary documents, the moneys due to Mrs. G. V. P. Pisohamy of 29/8, Middle St. China Garden, Galle, who is the widow of Mr. A. G. Albert (E. P. F. No. 496|G|4), have been delayed for over a year? (*b*) Will he order immediate payment in this case? (*c*) What action will he take to avoid such delays in the future?

ගාල්ලේ ජී. වී. පී. පිසෝහාමි මහත්මියට සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවීම

திருமதி ஜீ. வி. பி. பிஸ்ஸோகாமி, காலி, தொ. ச. நி. பணம்

MRS. G. V. P. PISOHAMY, GALLE: E.P.F. BENEFITS

7. ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டபிள்யு. தஹநாயக்க)
(Dr. W. Dahanayake)

කම්කරු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) අවශ්‍ය ලියකියවිලි සියල්ලම ඉදිරිපත් කරන ලද නමුත්, ඒ. ජී. ඇල්බට් (සේවක අර්ථ සාධක අරමුදලේ අංකය 496/ජී/4) මහතාගේ වැන්දඹු බිරිඳ වන, ගාල්ලේ චීන කොටුවේ, මැද වීදියේ 29/8 හි පදිංචි ජී. වී. පී. පිසෝහාමි මහත්මියට ලැබිය යුතු මුදල් ගෙවීම වර්ෂයකට වැඩි කාලයක් පමා කර ඇති බව එතුමා දන්නේද? (ආ) මේ සම්බන්ධයෙන් වහාම මුදල් ගෙවන ලෙස එතුමා නියෝග කරන්නේද? (ඉ) මෙබඳු ප්‍රමාදයන් අනාගතයේදී සිදුවීම වැළැක්වීමට එතුමා කවර පියවර ගන්නේද?

தொழில் அமைச்சரைக் கேட்ட வினா: (அ) தொழில் ச. நிதி 496/G/4 இலக்கமுடைய திரு. எ. ஜீ. அல்பர்ட் என்பவரின் விதவையும் காலி, சீனன் தோட்டம் மத்தியவீதி 29/8 இல் உள்ள திருமதி ஜீ. வி. பி. பிஸ்ஸோகாமி, எல்லா பத்திரங்களையும் அனுப்பியுள்ள போதிலும் அவருக்குரிய கொடுப்பனவு ஒரு வருடமாக வழங்கப்படவில்லை யென்பதை அறிவாரா? (ஆ) உடனடியாக கொடுப்பனவை வழங்கும்படி பணிப்பாரா? (இ) எதிர் காலத்தில் இவ்வித தாமதமேற்படுவதைத் தடுக்க என்ன நடவடிக்கை எடுப்பார்?

හේමචන්ද්‍ර සිරිසේන මයා.
(திரு. ஹேமச்சந்திர சிறிசேன)
(Mr. Hemachandra Sirisena)

(අ) ඔව්. මෙම ප්‍රමාදය සිදුවී ඇත්තේ ප්‍රතිලාභ ගෙවීමට සිරිත් පරිදි සියල්ල සූදානම් කර තිබියදී සාමාජිකයා මියගිය නිසාත්, ඉන් පසුව ඉල්ලුම් කරන ලද ඔහුගේ බිරිඳගේ නමේත් කාර්යාලීය ලේඛනවල නම්කර තිබූ අයගේ නමේත් විෂමතාවයක් තිබූ හෙයිනි. (ආ) මුදල් ගෙවීම සඳහා දැනටමත් ක්‍රියාකොට ඇත. සේවායාගේ පිළිතුරු 70.8.24 දින ලැබී ඇති අතර, මියගිය සාමාජිකයාගේ බිරිඳ වන ජී. වී. පී. පිසෝහාමි මහත්මියට ප්‍රතිලාභ මුදල් ගෙවන ලෙස 70.8.26 වන දින ශ්‍රී ලංකා මහ බැංකුවට දන්වා ඇත. (ඉ) ප්‍රමාදයන් වැලැක්වීමට අවශ්‍යයයි හැඟෙන සෑම පියවරක්ම ගනු ලැබේ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
9 වැනි ප්‍රශ්නය.

ගරු පී. ආර්. රත්නායක
(கௌரவ பீ. ஆர். ரத்நாயக்க)
(The Hon. P. R. Ratnayake)

ඒ ප්‍රශ්නයට පිළිතුරු දීමට මාසයක් කල් ඕනෑ.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

வினா மற்றொரு தினத்தில் சமர்ப்பிக்க கட்டளை யிடப்பட்டது.

Question ordered to stand down.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

මැදපත්තුව මැද ගම්සභාවේ ගම්සභාපති ජේ. ඒ. සිරිසුමන මහතා

මෙතපත්තුව මෙත කි. ස. தலைவர் திரு. ஜே. ஏ. சிறிசுமன

MR. J. A. SIRISUMANA, CHAIRMAN, MEDAPATTUWA MEDA V.C.

4. එම්. තෙන්නකෝන් මයා. (ලීලා රත්න විජේසිංහ මයා.—පොළොන්නරුව—වෙනුවට)

(திரு. எம். தென்னகோன்—திரு. லீலா ரத்ன விஜேசிங்க—பொலன்னறுவை—சார்பாக)

(Mr. M. Tennakoon—on behalf of Mr. Leelaratne Wijesinghe—Polonnaruwa)

රාජ්‍ය පරිපාලන, පළාත්පාලන හා සව දේශ කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මැදපත්තුව මැද ගම්සභාවේ 1966-1967 වර්ෂයන්හි ගම්සභාපතිව සිටි ජයසිංහ ආරච්චිගේ සිරි සුමන මහතා දූෂණ, අක්‍රමිකතා හා අදක්ෂ පාලනය නිසා එවකට සිටි පළාත් පාලන ඇමති විසින් නෙරපන ලද බව එතුමා දන්නවාද? (ආ) ගම්සභාව සතු විශාල මුදලක් ඔහු විසින් වංචනිකව පරිහරණයකර ඇති බව එතුමා දන්නවාද? (ඉ) වංචා කරන ලද එම මුදල් ප්‍රමාණය කොතෙක් දැයි එතුමා සඳහන් කරනවාද? (ඊ) එම මුදල් අයකර ගැනීමට කිනම් මාර්ගයක් අනුගමනය කරන්නේද? (උ) මේ සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා ඇත්නම් චුදිතයා සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ගය කුමක්ද? (ඌ) මෙම දූෂණ හා අක්‍රමිකතා ගැන විධිමත් පරීක්ෂණ පවත්වන මෙන් මෙම ගම්සභාවේ නියෝජිතයෙකුවන පොළොන්නරුවේ පාර්ලිමේන්තු මන්ත්‍රී එවක් පටන් දැන්වුව මුත් කරුණු එළිදරව් නොකිරීමේ හේතු එතුමා සඳහන් කරනවාද? (එ) නො එසේනම්, ඒ මන්ද?

பொது நிர்வாகம், உள்ளூராட்சி, உள்நாட்டு அலுவல்கள் அமைச்சரைக் கேட்ட விஞ: (அ) பொலன்னறுவை மாவட்டத்திலுள்ள மெதபத்துவ மெத கிராம சபையில் 1966-1967 ஆம் ஆண்டுகளில் தலைவராயிருந்த ஜய சிங்க ஆரச்சிகே சிறிசுமன அவர்களின் ஊழல், ஒழுங்கீனம், திறமையற்ற நிர்வாகம் ஆகியவை காரணமாக அப்போதிருந்த

வாசிக பிழிதுரு

உள்ளூராட்சி அமைச்சர் அவரை பதவி நீக்கஞ் செய்ததை அவர் அறிவாரா? (ஆ) கிராம சபைக்குரிய பெருந்தொகையான பணத்தைக் கையாடினரென்பதை அவர் அறிவாரா? (இ) எவ்வளவு பணத்தைக் கையாடினரென்பதை அவர் குறிப்பிடுவாரா? (ஈ) அப்பணத்தை அறவிட எவ்வித நடவடிக்கை எடுக்கப்படும்? (உ) இது சம்பந்தமாக விசாரணை நடத்தியிருந்தால் குற்றஞ்சாட்டப்பட்டவர் மீது என்ன நடவடிக்கை எடுக்கப்படும்? (ஊ) இந்த ஊழல், ஒழுங்கீனம் குறித்து முறையான விசாரணை நடத்துமாறு இக்கிராமசபையின் உறுப்பினரான பொலன்னறுவை பாராளுமன்ற அங்கத்தவர் அன்று தொடக்கம் அறிவித்துவந்துள்ள போதிலும் விஷயங்களை வெளியிடாததற்கான காரணத்தை அவர் குறிப்பிடுவாரா? (எ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Local Government and Home Affairs: (*a*) Is he aware that Mr. Jayasinghe Aratchige Sirisumana, Chairman of the Medapattuwa Meda Village Council in the Polonnaruwa District during the years 1966-67, was removed from office by the then Minister of Local Government due to corruption, irregularities and maladministration? (*b*) Is he aware that he has misappropriated a large sum of money belonging to this village council? (*c*) Will he state the amount of money so misappropriated? (*d*) What action will he take to recover this money? (*e*) If inquiries have been held what action will he take regarding the person who has been charged? (*f*) Will he state why these facts were not revealed although the Member of Parliament for Polonnaruwa, who is a member of this village council, has been asking throughout this period for a proper inquiry into the corruption and irregularities? (*g*) If not, why?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු නීල් ද අල්විස් (වැඩ බලන රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති)

(கௌரவ நீல் த அல்விஸ்—பதில் பொது நிர்வாகம், உள்ளூராட்சி, உள்நாட்டு அலுவல்கள் அமைச்சர்)

(The Hon. Neal de Alwis—Acting Minister of Public Administration, Local Government and Home Affairs)

(අ) ඔව්. (ආ) ඔව්. (ඉ) රුපියල් 12,967.39. (ඊ) නීති මගින්. (උ) පරීක්ෂණ අවසන් කර නැත. (ඌ) මූලික විධිමත් පරීක්ෂණ පවත්වා එකී සභාපති නිලයෙන් පහකර ඇත. මීට අදාළ පොලිස් පරීක්ෂණ අත්හිටවා ඇති අතර පූර්ණ ගාස්තු වශයෙන් එම මුදල අය කිරීමේ කටයුතු තවම අවසාන කර නැත. (එ) පැන නොනගී.

වගා ව්‍යාපාරය සඳහා දුන් ඉඩම්වල දැවදඩු විකිණීම

உணவுற்பத்திக்கு ஒதுக்கப்பட்ட காணிகள்: மர விற்பனை

LANDS ALIENATED FOR FOOD DRIVE: SALE OF TIMBER

8. **එම්. තෙන්නකෝන් මයා.** (ප්‍රින්ස් ගුණසේකර මයා.—හබරාදූව—වෙනුවට)

(திரு. எம். தென்னகோன்—திரு. பிரின்ஸ் குணசேகர—ஹபரதுவ—சார்பாக)

(Mr. M. Tennakoon—on behalf of Mr. Prins Gunasekera—Habaraduwa)

කෘෂිකර්ම හා ඉඩම් ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) පසුගිය රජයේ වගා ව්‍යාපාරයේ මුවාවෙන් රටේ කැලෑ ඉඩම් ලබා ගෙන ඒවායේ දැවදඩු විකුණා මුදල් ලබාගත් පුද්ගලයින්ගෙන් මේ රට බේරා ගැනීමට එතුමා ගන්නා පියවර මොනවාද? (ආ) එතුමා එම ඉඩම් ආපසු රජයට ගෙන ඉඩම් නැති දුප්පතුන් අතර බෙදා දෙන වාද? (ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

விவசாயக் காணி அமைச்சரைக் கேட்ட வினா: (அ) மூந்திய அரசாங்கத்தினால் உணவு உற்பத்தி என்ற பெயரில் ஆரம்பிக்கப்பட்ட முயற்சியின் கீழ் மூடிக்குரிய காடுகளை வெட்டி மரங்களை விற்று பணமீட்டியவர்களிடமிருந்து இந்நாட்டைக் காப்பாற்றுவதற்காக எடுக்கப்படும் நடவடிக்கை என்ன? (ஆ) இக்காணிகளைத் திருப்பி எடுத்து காணியற்றவர்களுக்குக் கொடுப்பாரா? (இ) இல்லையெனில், ஏன்?

asked the Minister of Agriculture and Lands: (*a*) What steps will he take to save the country from the persons who made money by extracting timber from Crown forests that they had obtained and selling the timber in the guise of participating in the food drive initiated by the former Government? (*b*) Will he take back these lands and distribute them among landless persons? (*c*) If not, why?

එච්. එම්. නවරත්න මයා. (කෘෂිකර්ම හා ඉඩම් ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)

(திரு. எச். எம். நவரத்ன—விவசாய, காணி அமைச்சரின் பாராளுமன்றக் காரிய தரிசி)

(Mr. H. M. Nawaratne—Parliamentary Secretary to the Minister of Agriculture and Lands)

(අ) විශේෂ බදු ඉඩම්වලින් දැවදඩු ඉවත් කරගෙන යාම සඳහා අළුතින් බල පත්‍ර කිසිවක් නිකුත් නොකරන ලෙස දිසා පතීන් වෙත උපදෙස් නිකුත් කොට තිබේ. චක්‍රලේඛවල සඳහන් කර ඇති උපදෙස් කඩකර, රාජ්‍ය භාගය නොගෙවා දැවදඩු ඉවත් කරගෙන ඇති කිසියම් බදු කරුවන් පිළිබඳව කිව හැක්කේ, දැනට කරගෙන යන පරීක්ෂණ අවසන් වූ විට ඔවුන්ට විරුද්ධව ක්‍රියා කරන බවය. (ආ) සහ (ඉ) කිසිදු සංවර්ධනයක් නොසිදුවී ඇති හෝ ලැබිය යුතු බදු කුලී බදුකරුවන් විසින් නොගෙවනු ලැබ ඇති, විශේෂ බදු ඉඩම් අවලංගු කොට, ඒවා ඉඩම් නැති ගැමියන් අතර බෙදාදීම සඳහා රජයට ආපසු ගතයුතු බවට දැනටමත් තීරණයක් ගෙන ඇත. මෙම ඉඩම් දැනටමත් රජයට පවරාගෙන ඇත.

එම්. තෙන්නකෝන් මයා.

(திரு. எம். தென்னகோன்)

(Mr. M. Tennakoon)

ගරු කථානායකතුමනි, අතුරු ප්‍රශ්නයක් අසන්නට තිබෙනවා. මේ ඉඩම් බදු දෙන විට ඒවායේ තිබුණු දැව දඩුවල වටිනාකම තක්සේරු කළාද? එසේ තක්සේරු කර තිබෙනවා නම් ඒ සඳහා වන්දියක් ගන්නවාද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නොපැමිණීමේ අවසරය

එච්. එම්. නවරත්න මයා.
(திரு. எச். எம். நவரத்ன)
(Mr. H. M. Nawaratne)

වන්දියක් අය කිරීමට දැනට ක්‍රියා කර ගෙන යනවා.

නොපැමිණීමේ අවසරය: සී. රාජදුරෙයි මයා.

வராதிருக்க அனுமதி: திரு. சீ. இராஜதுரை

LEAVE OF ABSENCE: MR. C. RAJADURAI

සී. එක්ස්. මාටින් මයා. (යාපනය)
(திரு. சீ. எக்ஸ். மாட்டின்—யாழ்ப்பாணம்)
(Mr. C. X. Martyn—Jaffna)

I move,

"That Mr. C. Rajadurai, First Member for Batticaloa, be granted leave under Section 24 (1) (e) of the Ceylon (Constitution) Order in Council, 1946, to be absent from the Sittings of the House for a period of three months from 10th September 1970."

කා. පො. ඉරත්නිනම් මයා. (කයිට්ස්)
(திரு. கா. பொ. இரத்தினம்—ஊர்காவற் துறை)
(Mr. K. P. Ratnam—Kayts)

විසින් ස්ථිර කරන ලදී.
அனுமதித்தார்.
seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සහ සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ශුභ ප්‍රාර්ථනා: වැඩ බලන රාජ්‍ය නායක ගරු මෛත්‍රීපාල සේනානායක

நல்வாழ்த்து: பதில் அரசாங்கத் தலைவர் கௌரவ மைத்திரிபால சேனநாயக்க

FELICITATIONS: THE HON. MAITHRIPALA SENANAYEKE, ACTING HEAD OF GOVERNMENT

අ. භා. 2.20

ජේ. ආර්. ජයවර්ධන මයා. (දකුණු කොළඹ පළමුවන)
(திரு. ஜே. ஆர். ஜயவர்தன—கொழும்பு தெற்கு முதலாம் அங்கத்தவர்)
(Mr. J. R. Jayewardene—First Colombo South)

ගරු කථානායකතුමනි, තමුන්නාන්සේගේ අවසරය ඇතිව මා නැගිට සිටියේ ගරු අගමැතිනිය වෙනුවෙන් වැඩබලන

ශුභ ප්‍රාර්ථනා

රාජ්‍ය නායක ගරු මෛත්‍රීපාල සේනානායක ඇමතිතුමාට සුභ ප්‍රාර්ථනා කරන්නයි. එතුමා ප්‍රථමයෙන්ම පාර්ලිමේන්තුවට පැමිණියේ 1947 දී අපත් සමගයි. ඊට ප්‍රථම මා රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සිටියත් මේ ගරු සභාවට අපත් සමග එතුමා පැමිණියේ 1947 දීයි. එදා සිට අවුරුදු 23 ක් මේ ගරු සභාවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හැටියටත්, උප ඇමතිවරයෙක් හැටියටත්, ඇමතිවරයෙක් හැටියටත්, සභානායක හැටියටත්, විරුද්ධ පාර්ශ්වයේ නායකයා හැටියටත් එතුමා කටයුතු කර දැන් වැඩබලන රාජ්‍ය නායක හැටියට පත්වීම ගැන අපි කවුරුත් සන්තෝෂ වෙනවා. එතුමාගේ දේශපාලනය පටන් ගැනුනේ එක්සත් ජාතික පක්ෂයේ අත්තිවාරමෙයි. එවැනි ශක්තිමත් දේශපාලන අත්තිවාරමක් එතුමාට තිබුණු නිසායි, අඳත් දේශපාලනමය ගොඩනැඟිල්ලක් හදන්නට එතුමාට පුළුවන් වුණේ. අපි සියලු දෙනාම එතුමාට ශුභාශිංසනත්, හොඳ හිතත් පිරිනමනවා.

අ. භා. 2.21

එස්. ජේ. වී. චෙල්වනායකම් මයා. (කන්කසන්තුරෙයි)
(திரு. எஸ். ஜே. வி. செல்வநாயகம்—காங்கேசன்துறை)
(Mr. S. J. V. Chelvanayakam—Kankesanturai)

Mr. Speaker, I have great pleasure in associating myself with the sentiments expressed by the hon. Leader of the Opposition in congratulating the Hon. Minister of Irrigation, Power & Highways on being elevated to the post of Acting Head of the Government.

I have great pleasure also in recalling that he is an old student of the same college from which I come. He comes from the North-Central Province where parents took advantage of the sound education that was being imparted in Jaffna schools and sent their children to Jaffna schools. Whatever his U.N.P. foundations may have been, I have no doubt that the foundation laid at St. John's College,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Jaffna, has made him what he is today, and this is, no doubt, a proud moment for my old school.

In fact, he, and later on, his nephew Mr. K. B. Ratnayake, the Minister of Parliamentary Affairs, were educated in Jaffna. Both of them speak good Tamil. In fact, Mr. Ratnayake speaks Tamil like a Jaffna man including the Jaffna man's faults of speech.

I have great pleasure in associating myself with the sentiments expressed by the hon. Leader of the Opposition in congratulating Mr. Maithripala Senanayeke on his appointment as the Acting Head of the Government.

යාපනේ මා ඉගෙන ගත් පාඨශාලාවේ ආදි ශිෂ්‍යයකු වශයෙන් විශේෂයෙන් තමා ආඩම්බර වන බවත්, එතුමාගේ ශුභ ශිංසනය පිරිනමන බවත් ලේපඩරල් පක්ෂයේ නායක කන්කසන්තුරේ ගරු මන්ත්‍රීතුමා (එස්. ජේ. වී. චෙල්වනායගම් මයා.) ප්‍රකාශ කළා.

මට ශුභාශිංසන පිරිනැමූ ඒ ගරු මන්ත්‍රීවරුන් දෙපොළටත්, ඒවා අනුමත කළ අනෙකුත් ගරු මන්ත්‍රීවරුන්ටත් මේ අවස්ථාවේදී මගේ ස්තුතිය පළ කරනවා.

පණත් කෙටුම්පත් පිළිගැන්වීම

சமர்ப்பிக்கப்பட்ட மசோதாக்கள்

BILLS PRESENTED

නිවැසියන් ආරක්ෂා කිරීමේ (විශෙෂ විධිවිධාන) පනත් කෙටුම්පත

வாடகைக் குடியிருப்பாளர் பாதுகாப்பு (சிறப்பு ஏற்பாடுகள்) மசோதா

PROTECTION OF TENANTS (SPECIAL PROVISIONS) BILL

"to make special provision to prevent landlords from ejecting tenants by resort to threats, violence and harassment, by discontinuing or withholding amenities, by interfering in the use and occupation of premises or by other means, and to provide for matters incidental thereto or connected therewith."

පිළිගන්වන ලද්දේ නිවාස හා ඉඩකඩ ඇමති ගරු පී. ජී. බී. කෙනමන් විසිනි. 1970 සැප්තැම්බර් 11 වන සිකුරාදා දෙවන වර කියවිය යුතුයයිද, එය මුද්‍රණය කළ යුතුයයිද නියෝග කරන ලදී.

வீடமைப்பு, நிர்மாண அமைச்சர் கௌரவ பீ. ஜீ. பி. கெனமன் அவர்களால் சமர்ப்பிக்கப்பட்டது. 1970 செப்ரெம்பர் 11, வெள்ளிக்கிழமை இரண்டாம் முறையாக மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. P. G. B. Keuneman, Minister of Housing and Construction; to be read a Second time upon Friday, 11th September 1970, and to be printed.

අ. භා. 2.23

ගරු මෛත්‍රීපාල සේනානායක

(கௌரவ மைத்திரிபால சேனநாயக்க)

(The Hon. Maithripala Senanayeke)

කථානායකතුමනි, කිසිම පාර්ලිමේන්තු සම්ප්‍රදායකට අදාළ නොවන කථා දෙකක් මේ අවස්ථාවේදී කෙරුණු නිසාත්, ඒ කථා දෙකෙන් දෙවිධියක අදහස් ප්‍රකාශ වුණු නිසාත්, මටත් ඒ පිළිබඳව වචන ස්වල්පයක් කථා කිරීමට අවසර දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා සඳහන් කළා, මා දේශපාලනයට පිවිසුණු පක්ෂය ගැන. ඒ පක්ෂයේ අඩිතාලම හොඳ නිසා මා මෙවැනි තත්ත්වයකට පැමිණියාය කියාත් එතුමා කීවා. ඒ පක්ෂයේ දේශපාලන අඩිතාලමෙන් පටන් ගෙන මා අද මේ තත්ත්වයට පැමිණ සිටිනවා නම් එය අනුගමනය කරමින් මා පසු පස මේ පැත්තට එන ලෙස විරුද්ධ පාර්ශ්වයේ නායකතුමාටත්, ඒ පක්ෂයේ අනෙකුත් ගරු මන්ත්‍රීතුමන්ලාටත් මා ආරාධනා කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අතුරු සම්මත ගිණුම (1970-71)

கணக்கு வாக்குப் பணம், (1970-71)

VOTE ON ACCOUNT (1970-71)

අ. භා. 2.25

ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා (මුදල් ඇමති)
(கௌரவ கலாநிதி என். எம். பெரேரா— நிதி அமைச்சர்)
(The Hon. Dr. N. M. Perera—Minister of Finance)

ගරු කථානායකතුමනි, මා නමින් ඇති යෝජනාව මම ඉදිරිපත් කරනවා :

" (අ) 1970 ඔක්තෝබර් 1 වැනි දින ආරම්භ වී, 1970–71 මුදල් වර්ෂයේ සේවාව සඳහා ප්‍රතිපාදන සැලසෙන විසර්ජන පනත ආරම්භ වන දිනයට පෙරාතුවම වන දිනයෙන් අවසාන වන කාල සීමාව තුළ දී, (1969 හි අංක 30 දරන විසර්ජන පනතින් හා 1969–70 මුදල් වර්ෂයෙහි පරිපූරක ඇස්තමේන්තු මගින් ද ප්‍රතිපාදන සලසනු ලබන සේවාවන් වන) මෙම යෝජනාවේ පළමුවැනි උපලේඛනයේ නියමිත සේවාවන් සඳහා, රුපියල් හැත්තෑ නව කෝටි විසිහතර ලක්ෂ විසි දෙදහස් හයසිය හැත්තෑව (රු. 79,24,22,670) ක මුළු මුදලකට නොවැඩි මුදලක් ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් ගෙවිය යුතුය යයිද, එකී මුදල නියමිත ව ඇති ආකාරයට වියදම් කළ යුතු යැයි ද ;

(ආ) එකී කාලසීමාව තුළදී, මෙම යෝජනාවේ දෙවැනි උපලේඛනයේ I වැනි තීරුවේ නියමිත සේවාවන් සඳහා රුපියල් අනූ හතර කෝටි අනූ ලක්ෂ හැට අට දහස් පහ (රු. 94,90,68,005) ක මුළු මුදලකට නොවැඩි මුදලක් ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් දෙනු ලබන අත්තිකාරම් වශයෙන් ගෙවිය යුතුය යි ද එම කාලසීමාව තුළදී එම සේවාවන් සඳහා ඇති කෙරෙන හරයන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහන්වල නියමිත උපරිම සීමාවන් නො ඉක්මවිය යුතුය යි ද ; මේ සභාව තීරණය කරයි.

විසර්ජන

පළමුවැනි උපලේඛනය—සේවාවන්

			රු.
ශීර්ෂ 1.—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ			
සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා	...		83,640
සම්මතය අංක අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම්	...	...	64,500
ශීර්ෂ 2.—අග්‍රාමාත්‍ය			
සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා	...		81,469
සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම්	...	...	36,425
ශීර්ෂ 3.—ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරතුමන්			
සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා	...		1,79,287
සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම්	...	...	30,987
ශීර්ෂ 4.—කැබිනට් කාර්යාලය			
සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා	...		46,746
සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම්	...	...	5,675
ශීර්ෂ 5.—සෙනේට් මන්ත්‍රී මණ්ඩලය			
සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා	...		1,18,000
සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම්	...	...	51,500

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

	අතුරු සම්මත ගිණුම (1970-71)	අතුරු සම්මත ගිණුම (1970-71)
		රු.
ශීර්ෂ 6.—නියෝජිත මන්ත්‍රී මණ්ඩලය		
	සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා ...	2,55,950
	සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම් ...	4,53,713
ශීර්ෂ 7.—අධිකරණ සේවා කොමිෂන් සභාව		
	සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා ...	28,675
	සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම්	2,070
ශීර්ෂ 8.—රාජ්‍ය සේවා කොමිෂන් සභාව		
	සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා ...	83,929
	සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම්	8,675
ශීර්ෂ 9.—ගණන් පරීක්ෂක කාර්යාලය		
	සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා ...	11,12,350
	සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම්	1,49,450
ශීර්ෂ 10.—නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සභානායකගේ කාර්යාලය		
	සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා ...	27,150
	සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම්	1,625
ශීර්ෂ 11.—නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ විපක්ෂ නායකගේ කාර්යාලය		
	සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා ...	17,154
	සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම්	388
ශීර්ෂ 12.—මැතිවරණ දෙපාර්තමේන්තුව (පාර්ලිමේන්තු හා ප්‍රාදේශීය බලමණ්ඩල)		
	සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා ...	4,26,115
	සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම්	4,60,448
ශීර්ෂ 14.—රාජ්‍යාරක්ෂක සහ විශේෂ කටයුතු පිළිබඳ අමාත්‍යවරයා		
	සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා ...	1,36,97,500
	සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම්	45,40,897
	සම්මතය අංක 3.—පාලන ගාස්තු—මූලධන වියදම්	10,000
ශීර්ෂ 15.—යුද්ධ හමුදාව		
	සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා ...	88,61,175
	සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම්	34,11,709
	සම්මතය අංක 3.—පාලන ගාස්තු—මූලධන වියදම්	40,000
ශීර්ෂ 16.—රාජකීය ලංකා නාවුක හමුදාව		
	සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා ...	36,81,650
	සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම්	21,21,637
	සම්මතය අංක 3.—පාලන ගාස්තු—මූලධන වියදම්	10,000
ශීර්ෂ 17.—රාජකීය ලංකා ගුවන් හමුදාව		
	සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා ...	31,36,294
	සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම්	22,32,584
	සම්මතය අංක 3.—පාලන ගාස්තු—මූලධන වියදම්	10,000
ශීර්ෂ 18.—විදේශ බාහිර කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව		
	සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා ...	27,01,386
	සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම්	21,90,531
	සම්මතය අංක 3.—පාලන ගාස්තු—මූලධන වියදම්	6,04,000
	සම්මතය අංක 4.—දෙපාර්තමේන්තුව විසින් සපයන සේවා—පුනරාවර්තන වියදම් ...	165
ශීර්ෂ 22.—ක්‍රම සම්පාදන සහ රැකීරක්ෂා අමාත්‍යවරයා		
	සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා ...	7,13,000
	සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම්	8,06,000
	සම්මතය අංක 6.—ආර්ථික සංවර්ධනය—පුනරාවර්තන වියදම්	75,000
	සම්මතය අංක 7.—ආර්ථික සංවර්ධනය—මූලධන වියදම්	12,50,000
ශීර්ෂ 23.—ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව		
	සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා ...	7,25,000
	සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම්	14,00,000

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අතුරු සම්මත ගිණුම (1970-71) අතුරු සම්මත ගිණුම (1970-71)

රු.

ශීර්ෂ 27.—වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග අමාත්‍යවරයා

සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා	...	...	83,69,103
සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම	...	...	17,47,567
සම්මතය අංක 3.—පාලන ගාස්තු—මූලධන වියදම	...	...	3,92,480
සම්මතය අංක 4.—දෙපාර්තමේන්තුව විසින් සපයන සේවා—පුනරාවර්තන වියදම		...	7,65,400
සම්මතය අංක 5.—දෙපාර්තමේන්තුව විසින් සපයන සේවා—මූලධන වියදම		...	3,00,000
සම්මතය අංක 6.—ආර්ථික සංවර්ධනය—පුනරාවර්තන වියදම	...	...	1,19,06,077
සම්මතය අංක 7.—ආර්ථික සංවර්ධනය—මූලධන වියදම	...	...	3,10,67,500

ශීර්ෂ 28.—වාරිමාර්ග දෙපාර්තමේන්තුව

සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා		...	10,76,355
සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම	...	...	1,07,025
සම්මතය අංක 3.—පාලන ගාස්තු—මූලධන වියදම	...	...	10
සම්මතය අංක 6.—ආර්ථික සංවර්ධනය—පුනරාවර්තන වියදම	...	...	14,39,445
සම්මතය අංක 7.—ආර්ථික සංවර්ධනය—මූලධන වියදම	...	...	93,43,750

ශීර්ෂ 29.—ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා		...	2,41,457
සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම	...	...	18,625
සම්මතය අංක 6.—ආර්ථික සංවර්ධනය—පුනරාවර්තන වියදම	...	...	8,28,346
සම්මතය අංක 7.—ආර්ථික සංවර්ධනය—මූලධන වියදම	...	...	5,88,750

ශීර්ෂ 30.—විදුලි දෙපාර්තමේන්තුව

සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා		...	7,89,500
සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම	...	...	11,32,750
සම්මතය අංක 3.—පාලන ගාස්තු—මූලධන වියදම	...	...	1,00,000
සම්මතය අංක 4.—දෙපාර්තමේන්තුව විසින් සපයන සේවා—පුනරාවර්තන වියදම		...	2,90,750
සම්මතය අංක 5.—දෙපාර්තමේන්තුව විසින් සපයන සේවා—මූලධන වියදම		...	4,00,000

ශීර්ෂ 31.—මහා මාර්ග දෙපාර්තමේන්තුව

සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා		...	5,05,076
සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම	...	...	26,488
සම්මතය අංක 5.—දෙපාර්තමේන්තුව විසින් සපයන සේවා—මූලධන වියදම		...	50,000
සම්මතය අංක 6.—ආර්ථික සංවර්ධනය—පුනරාවර්තන වියදම	...	...	1,30,625
සම්මතය අංක 7.—ආර්ථික සංවර්ධනය—මූලධන වියදම	...	...	50,00,000

ශීර්ෂ 32.—ගොවි හමුදා කොමසාරිස්

සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා		...	19,36,300
සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම	...	...	3,34,200

ශීර්ෂ 33.—ජල සම්පාදන සහ ජලාපවහන දෙපාර්තමේන්තුව

සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා		...	3,91,881
සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම	...	...	33,637
සම්මතය අංක 3.—පාලන ගාස්තු—මූලධන වියදම	...	...	10
සම්මතය අංක 5.—දෙපාර්තමේන්තුව විසින් සපයන සේවා—මූලධන වියදම		...	32,00,000
සම්මතය අංක 6.—ආර්ථික සංවර්ධනය—පුනරාවර්තන වියදම	...	...	1,40,250

ශීර්ෂ 37.—විදේශීය සහ දේශීය වෙළඳ අමාත්‍යවරයා

සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා		...	1,30,374
සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම	...	...	26,000

ශීර්ෂ 38.—වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව

සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා		...	1,37,895
සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම	...	...	14,123

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අතුරු සම්මත ගිණුම (1970-71)		අතුරු සම්මත ගිණුම (1970-71)	
			රු.
ශීර්ෂ 39.—රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව			
සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා	...		5,35,875
සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම්	...	...	53,375
ශීර්ෂ 40.—ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව			
සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා	...		3,65,116
සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම්	...	...	60,030
ශීර්ෂ 41.—අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව			
සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා	...		2,96,100
සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම්	...	...	39,670
සම්මතය අංක 4.—දෙපාර්තමේන්තුව විසින් සපයන සේවා—පුනරාවර්තන වියදම්		...	3,25,000
සම්මතය අංක 6.—ආර්ථික සංවර්ධනය—පුනරාවර්තන වියදම්	...	...	39,200
සම්මතය අංක 7.—ආර්ථික සංවර්ධනය—මූලධන වියදම්	...	...	50,000
ශීර්ෂ 42.—ආහාර කොමසාරිස්			
සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා	...		29,50,000
සම්මතය අංක 2.—පාලන ගාස්තු-පුනරාවර්තන වියදම්	...	...	3,50,000
සම්මතය අංක 3.—පාලන ගාස්තු—මූලධන වියදම්	...	...	4,00,000
සම්මතය අංක 4.—දෙපාර්තමේන්තුව විසින් සපයන සේවා—පුනරාවර්තන වියදම්		...	9,75,00,000
ශීර්ෂ 43.—සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව			
සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා	...		29,25,591
සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම්	...	...	6,57,875
සම්මතය අංක 4.—දෙපාර්තමේන්තුව විසින් සපයන සේවා—පුනරාවර්තන වියදම්		...	500
සම්මතය අංක 7.—ආර්ථික සංවර්ධනය—මූලධන වියදම්	...	...	20,000
ශීර්ෂ 44.—වාණිජ දෙපාර්තමේන්තුව			
සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා	...		2,10,500
සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම්		...	2,75,281
ශීර්ෂ 48.—අධ්‍යාපන අමාත්‍යාවරයා			
සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා	...		32,99,940
සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම්	...	...	4,09,774
සම්මතය අංක 3.—පාලන ගාස්තු—මූලධන වියදම්	...	...	2,62,500
සම්මතය අංක 4.—දෙපාර්තමේන්තුව විසින් සපයන සේවා—පුනරාවර්තන වියදම්		...	11,27,54,184
සම්මතය අංක 5.—දෙපාර්තමේන්තුව විසින් සපයන සේවා—මූලධන වියදම්		...	55,80,000
සම්මතය අංක 6.—ආර්ථික සංවර්ධනය—පුනරාවර්තන වියදම්	...	...	42,500
ශීර්ෂ 49.—විභාග දෙපාර්තමේන්තුව			
සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා	...		4,09,600
සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම්	...	...	11,14,000
ශීර්ෂ 50.—අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව			
සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා	...		1,20,988
සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම්	...	...	15,400
ශීර්ෂ 51.—ජාතික උසස් අධ්‍යාපන සභාවට සහ විශ්ව විද්‍යාලවලට ආධාර			
සම්මතය අංක 4.—දෙපාර්තමේන්තුව විසින් සපයන සේවා—පුනරාවර්තන වියදම්		...	87,50,000
සම්මතය අංක 5.—දෙපාර්තමේන්තුව විසින් සපයන සේවා—මූලධන වියදම්		...	29,00,000
ශීර්ෂ 55.—නැව් කටයුතු සහ සංචාරක කටයුතු අමාත්‍යාවරයා			
සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා	...		1,02,423
සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම්	...	...	26,225
සම්මතය අංක 6.—ආර්ථික සංවර්ධනය—පුනරාවර්තන වියදම්	...	...	8,75,000
සම්මතය අංක 7.—ආර්ථික සංවර්ධනය—මූලධන වියදම්	...	...	10,00,000

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රු.

ශීර්ෂ 56.—වෙළඳ නැව් ගමනාගමන දෙපාර්තමේන්තුව

සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා	...	31,684
සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම	... ...	1,449

ශීර්ෂ 57.—වෙරළබඩ පහන් සේවය

සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා	...	22,000
සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම	... ...	12,125

ශීර්ෂ 58.—කොළඹ වරාය කොමිෂන් සභාව

සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා	...	19,16,350
සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම	... ...	47,89,700
සම්මතය අංක 3.—පාලන ගාස්තු—මූලධන වියදම	... ...	50,000
සම්මතය අංක 4.—දෙපාර්තමේන්තුව විසින් සපයන සේවා—පුනරාවර්තන වියදම	...	3,74,400
සම්මතය අංක 5.—දෙපාර්තමේන්තුව විසින් සපයන සේවා—මූලධන වියදම	...	25,000
සම්මතය අංක 6.—ආර්ථික සංවර්ධනය—පුනරාවර්තන වියදම	... ...	9,59,550
සම්මතය අංක 7.—ආර්ථික සංවර්ධනය—මූලධන වියදම	... ...	25,00,000

ශීර්ෂ 59.—වන සත්ව දෙපාර්තමේන්තුව

සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා	...	2,17,500
සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම	... ...	69,500
සම්මතය අංක 3.—පාලන ගාස්තු—මූලධන වියදම	... ...	40,000

ශීර්ෂ 60.—සත්වෝද්‍යානය

සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා	...	1,36,750
සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම	... ...	1,24,000
සම්මතය අංක 3.—පාලන ගාස්තු—මූලධන වියදම	... ...	25,000

ශීර්ෂ 62.—කම්කරු අමාත්‍යාවරයා

සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා	...	60,184
සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම	... ...	21,125
සම්මතය අංක 3.—පාලන ගාස්තු—මූලධන වියදම	... ...	10,00,000

ශීර්ෂ 63.—කම්කරු දෙපාර්තමේන්තුව

සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා	...	15,24,500
සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම	... ...	2,22,503
සම්මතය අංක 4.—දෙපාර්තමේන්තුව විසින් සපයන සේවා—පුනරාවර්තන වියදම	...	16,765
සම්මතය අංක 5.—දෙපාර්තමේන්තුව විසින් සපයන සේවා—මූලධන වියදම	...	4,50,000
සම්මතය අංක 6.—ආර්ථික සංවර්ධනය—පුනරාවර්තන වියදම	...	4,59,360

ශීර්ෂ 65.—රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාවරයා

සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා	...	2,00,550
සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම	... ...	49,575
සම්මතය අංක 4.—දෙපාර්තමේන්තුව විසින් සපයන සේවා—පුනරාවර්තන වියදම	...	87,750
සම්මතය අංක 5.—දෙපාර්තමේන්තුව විසින් සපයන සේවා—මූලධන වියදම	...	3,00,000

ශීර්ෂ 66.—රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුව

සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා	...	6,07,800
සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම	... ...	1,94,000
සම්මතය අංක 3.—පාලන ගාස්තු—මූලධන වියදම	... ...	55,000
සම්මතය අංක 4.—දෙපාර්තමේන්තුව විසින් සපයන සේවා—පුනරාවර්තන වියදම	...	1,55,000

ශීර්ෂ 69.—වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් කාර්යාලය

සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා	...	99,525
සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම	... ...	3,500

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

	අතුරු සම්මත ගිණුම (1970-71)		අතුරු සම්මත ගිණුම (1970-71)	
				රු.
ශීර්ෂ 70.—විශ්‍රාම වැටුප්				
	සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම	...	...	2,78,54,500
ශීර්ෂ 71.—ඒකාබද්ධ සේවා				
	සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා	...		1,72,500
	සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම	...	...	2,500
ශීර්ෂ 72.—රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව				
	සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා	...		1,64,250
	සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම	...	...	24,750
ශීර්ෂ 73.—පළාත් පාලන දෙපාර්තමේන්තුව				
	සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා	...		5,74,300
	සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම	...	...	1,42,80,150
	සම්මතය අංක 4.—දෙපාර්තමේන්තුව විසින් සපයන සේවා—පුනරාවර්තන වියදම		...	2,36,000
	සම්මතය අංක 5.—දෙපාර්තමේන්තුව විසින් සපයන සේවා—මූලධන වියදම්		...	7,67,500
ශීර්ෂ 74.—නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුව				
	සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා	...		1,68,400
	සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම	...	...	13,130
	සම්මතය අංක 3.—පාලන ගාස්තු—මූලධන වියදම	...	...	5,000
	සම්මතය අංක 5.—දෙපාර්තමේන්තුව විසින් සපයන සේවා—මූලධන වියදම්		...	2,50,000
ශීර්ෂ 75.—පළාත් පාලන සේවා කොමිෂන් සභාව				
	සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා	...		1,09,440
	සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම	...	...	1,72,400
ශීර්ෂ 76.—ප්‍රාදේශීය පාලනය				
	සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා	...		82,04,420
	සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම	...	...	8,20,085
	සම්මතය අංක 3.—පාලන ගාස්තු—මූලධන වියදම	...	...	1,00,000
	සම්මතය අංක 4.—දෙපාර්තමේන්තුව විසින් සපයන සේවා—පුනරාවර්තන වියදම		...	1,13,750
ශීර්ෂ 77.—රෙජිස්ට්‍රාර් ජනරාල්				
	සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා	...		11,78,750
	සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම	...	...	85,200
ශීර්ෂ 78.—ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව				
	සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා	...		4,46,000
	සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම	...	...	1,17,100
	සම්මතය අංක 4.—දෙපාර්තමේන්තුව විසින් සපයන සේවා—පුනරාවර්තන වියදම		...	2,47,000
	සම්මතය අංක 5.—දෙපාර්තමේන්තුව විසින් සපයන සේවා—මූලධන වියදම		...	2,00,000
	සම්මතය අංක 6.—ආර්ථික සංවර්ධනය—පුනරාවර්තන වියදම	...	...	11,250
ශීර්ෂ 79.—මුස්ලිම් පල්ලි හා මුස්ලිම් පුණ්‍යාධාර දෙපාර්තමේන්තුව				
	සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා	...		14,390
	සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම	...	...	5,325
ශීර්ෂ 82.—කර්මාන්ත සහ විද්‍යා කටයුතු අමාත්‍යවරයා				
	සම්මතය අංක 1.—කාර්ය මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා	...		1,04,600
	සම්මතය අංක 2.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම	...	...	3,200
	සම්මතය අංක 4.—දෙපාර්තමේන්තුව විසින් සපයන සේවා—පුනරාවර්තන වියදම		...	43,000
	සම්මතය අංක 6.—ආර්ථික සංවර්ධනය—පුනරාවර්තන වියදම	...	...	7,20,000
කර තිබෙනවා. ඒ සියලුම අදහස්වලින් පෙනී යන්නේ එක වැදගත් කාරණයක්. එනම් පසුගිය අවුරුදු දහය ඇතුළත නැත් නම් පහළොව ඇතුළත නිවාස ප්‍රශ්නය ක්‍රම ක්‍රමයෙන් උග්‍ර වූ බවයි; කිසිම රජයක් මේ ප්‍රශ්නය විසඳන්නට උත්සාහයක් ගෙන නැති බවයි. පසුගිය අවුරුදු දහය ගැන කථා කරනවා නම්, බලයට පත්ව තුබූ ආණ්ඩු දෙකක් එම කාල සීමාව තුළ නිවාස ප්‍රශ්නය විසඳීමට කටයුතු කර නැහැ; විසඳන්නට උත්සාහයක්වත් ගෙන නැහැ. ඒ ආණ්ඩුවලින් කෙරී තිබෙන්නේ වාර්තා සපයා ගෙන ඒ වාර්තා ගැන සෝදිසි කරමින් බලා සිටීම පමණයි. එම නිසා මේ ඉතාම කණගාටුදායක පරිච්ඡේදයේ අලුත් පිටුවක් පෙරළා ඉදිරියට තිබෙන අවුරුදු පහ ඇතුළත මේ ප්‍රශ්නය නියම විධියට විසඳන්නට අලුත් නිවාස ඇමතිතුමා කටයුතු කරනු ඇතැයි අප බලාපොරොත්තු වෙනවා.

මේ රටේ නිවාස ප්‍රශ්නය විසඳීමට නම් අලුත් ගෙවල් දස ලක්ෂයක් වුවමනාය කියා දැන් පිළිගෙන තිබෙනවා. මේ වුවමනා කරන ගෙවල් දස ලක්ෂය සාදන්නට අලුත් නිවාස ඇමතිතුමා කුමන වැඩ පිළිවෙළක් සකස් කරනවාද? මේ පිළිබඳව පස් අවුරුදු සැලැස්මක් පිළියෙළ කරන මෙන් මා අලුත් නිවාස ඇමතිතුමා ගෙන් ඉල්ලීමක් කරනවා. ඒ පස් අවුරුදු සැලැස්මෙන් අවුරුද්දෙන් අවුරුද්දට මේ ප්‍රශ්නය කොයි තරම් දුරට විසඳෙනවාද යන්න පෙනෙන්නට ඕනෑ. අයවැය ලේඛනය ඉදිරිපත් කරන අවස්ථාවේදී අවුරුදු 5 සැලැස්මක් අපට ඉදිරිපත් කරන්න ඕනෑ. මෙම ප්‍රශ්නය සම්පූර්ණයෙන් විසඳීම සඳහා අවුරුදු 10 ක සැලැස්මක් අවශ්‍ය බවක් ආලිංජ් වාර්තාවෙන් පෙන්නුම් කර තිබෙනවා. එම දස අවුරුදු සැලැස්මෙන් බාගයක් මෙම රජය මගින් ඉටු කිරීමට උත්සාහ ගන්නය කියා මා අලුත් නිවාස ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. එවැනි 5 අවුරුදු සැලැස්මක් ඇති කළොත් සමහර විට මෙම රජය මිළඟ මැතිවරණයට ඉදිරිපත් වන කාලය වන විට නිවාස ලක්ෂ 5 ක් සෑදී අවසාන වෙන්න පුළුවනි. ඒ විධියේ සැලැස්මක් ඉදිරිපත් කරන්නේ නැත්නම් නිවාස ඇමතිවරයෙක් පත් කිරීමෙන් හෝ නිවාස ගැන යම් යම් කටයුතු කිරීමෙන් කිසිම ප්‍රයෝජනයක් සිදු වන්නේ නැහැ. එහි කිසිම වැදගත් කමක් නැහැ. මට පෙනෙන හැටියට නම් නිවාස අමාත්‍යාංශයක් තබාගෙන මේ රට රවටනවා. නිවාස දෙපාර්තමේන්තුවක් තබාගෙන රට රවටනවා මිසක් නිවාස ප්‍රශ්නය විසඳීමක් කෙරෙන්නේ නැහැ. ඉදිරියටත් මෙම ප්‍රශ්නය විසඳීමට කටයුතු කරන්නේ නැත්නම් මෙම අමාත්‍යාංශය රට රැවටීම සඳහා පිහිටුවා තිබෙන බව සම්පූර්ණයෙන්ම අපි පිළිගන්න ඕනෑ. අවුරුදු 10 ක් 15 ක් තිස්සේම රට රවටා ගෙන එනවා.

ගරු කථානායකතුමනි, මෙහිදී එක් ප්‍රශ්නයක් මතු වෙනවා. 5 අවුරුදු සැලැස්මක් ඇති කිරීමේදී නිවාස සෑදීම සඳහා රජය විසින් පෞද්ගලික අංශයත් එකතු කර ගන්නවාද කියන ප්‍රශ්නය මතු වී තිබෙනවා. මට මතකයි, මීට ඉහතදී මේ ගැන වාද විවාද වෙන අවස්ථාවකදී පෞද්ගලික අංශයත් මෙයට එකතු කරගත යුතුය කියන අදහස විරුද්ධ පක්ෂයෙන් ඉදිරිපත් කළා. නමුත් මගේ අදහස නම් මේ 5 අවුරුදු සැලැස්මට පෞද්ගලික අංශය එකතු කර ගැනීමට වුවමනා නැති බවයි. මන්ද? අවශ්‍යතාවය අනුව පමණක් නොව, අයිතිවාසිකමක් අනුවද අපි නිවාස ලබා දෙන්න ඕනෑ. නිවාසයක් ලබා ගැනීමට සෑම වැසියෙකුටම අයිතිවාසිකමක් තිබෙනවා. අවශ්‍යතාවයටත් වඩා අයිතිවාසිකමක් තිබෙනවා. අවශ්‍යතාවයත් අපි පිළිගන්න ඕනෑ. සමාජවාදය අනුව අවශ්‍යතාවය අපි පිළිගන්න ඕනෑ. අයිතිවාසිකමට අනුව පවුලකට සිටින්න ගෙයක් දෙනවා නම් පෞද්ගලික අංශයත් එම වැඩ පිළිවෙළට එකතු කර ගන්න බැහැ. පෞද්ගලික අංශය ගෙවල් සාදනවා නම් සාදන්නේ එයින් යම්කිසි ලාභයක් ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන්. ලාභ බලාපොරොත්තුවෙන් ගෙවල් සාදන ආයතනයකට මෙවැනි කටයුත්තක්—ජාතික කටයුත්තක්—භාරදීම සුදුසු නැහැ. ඒ නිසා තමයි, අවුරුදු 5 ක සැලැස්මක් අනුව ගෙවල් ලක්ෂ 5 ක් සෑදීමේ කටයුත්ත රජය විසින්ම කළ යුතුය කියා මා කියන්නෙ. මෙම 5 අවුරුදු සැලැස්මෙන් පෞද්ගලික අංශය මගින් යම්කිසි ගෙවල් ප්‍රමාණයක් සෑදීමට නියම කර ගන්න වුවමනා නැහැ. මීට පෙරදී පෞද්ගලික අංශය මගින් මේ තරම් ගෙවල් ප්‍රමාණයක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය ඩබ්ලිව්. දහනායක]

සාදනවාය කියා කිව්වත්, මෙතෙක් කිසිම දෙයක් කර තිබෙන බවක් පෙනෙන්න නැහැ.

ඉදිරි අවුරුදු 5 දී ගෙවල් ලක්ෂ 5 ක් සෑදීමේ වැඩපිළිවෙළට අඩංගු කළ යුතු ඉතාමත් වැදගත් කරුණු ස්වල්පයක් මා මතක් කර දෙන්න කැමතියි. එක් කරුණක් නම් බොහොම පහසුවෙන් කරන්න පුළුවනි. එනම් රජයේ සේවකයින්ට නිවාස සපයා දීමයි. ලක්ෂ 3 ක් පමණ රජයේ සේවකයින් සිටිනවා. එම සියලුම රජයේ සේවකයින්ට පඩි ගෙවන විට ගෙවල් කුලී සඳහා අතිරේක දීමනාවක් ගෙවනවා. එම නිසා රජයේ සේවකයන් සියලු දෙනාටම ගෙයක් බැගින් දිය යුතුයි. ඒ කාරණාව මුලින්ම රජයෙන් ඉෂ්ට වෙන්න ඕනෑ. ගෙවල් හිඟය නිසා දැනට හැතැප්ම 70, 80, 90 දුර ප්‍රමාණවල සිට තම වැඩපලවල් වෙත දිනපතා ගමන් කරන රජයේ සේවකයන් සිටිනවා. ගාල්ලේ සිට කොළඹට එනවා; නුවර සිට කොළඹට එනවා; කුරුණෑගල සිට කොළඹට එනවා. ඔය විධියට බොහෝම ඈත ප්‍රදේශවල සිට ඔවුන් තම සේවය සඳහා දිනපතා ගමනාගමනයෙහි යෙදෙනවා. ඊට හේතුව තම වැඩපළවල් කිට්ටුව ගෙවල් නැතිකමයි. රජයේ සේවකයන්ට ගෙවල් සාදා දීම අමාරු වැඩක් නොවෙයි. කොළඹට හැතැප්ම 15 ක් 20 ක් ඇතින් පිහිටි සුදුසු ස්ථාන දැක්වා ගෙන රජයේ සේවකයන්ට ගෙවල් සාදා දෙන්න පුළුවනි. කොළඹ පමණක් නොවෙයි, රජයේ සේවකයන් බොහෝ දෙනකු සිටින අනිකුත් නගරවල —ගාල්ල, නුවර, කුරුණෑගල, යාපනේ ආදි නගරවල—එම සේවකයන්ට රජයෙන් නිවාස සාදා දෙන්න ඕනෑ. එහෙත් අද රජයෙන් එවැනි නිවාස සාදා දීමක් කෙරෙන්නෙ නැහැ.

මෙම ප්‍රශ්නය විශේෂයෙන්ම රජයේ ගුරුවරුන්ට බොහෝදුරට බලපාන ප්‍රශ්නයක්. 1960 දී සියලුම පාසල් රජයට ගැනීමෙන් පසුව ඒවායේ සේවය කරන සියලුම ගුරුවරුන්ට මාරුවීම් ලැබෙනවා. ගුරුවරුන්ට ඈත ප්‍රදේශවලට යන්න සිද්ධ වෙනවා. ඒ මන්ද? සුදුසුකම් තිබෙන හොඳ ගුරුවරුන් ඈත ගම්බද ප්‍රදේශවල පාසල්වලටත් අවශ්‍ය නිසයි. එහෙත් නිවාස ප්‍රශ්නය හේතුකොටගෙන ගුරුවරුන් එවැනි ප්‍රදේශවලට යවන්න අමාරුයි. එම නිසා ගුරුවරුන්ගේ නිවාස ප්‍රශ්නය ඉතාමත් විශෙෂ අංශයක් හැටියට සලකන්න ඕනෑ. ගුරුවරුන් පිළිබඳ එම නිවාස ප්‍රශ්නය විසඳන තුරු හොඳ ගුරුවරුන් ඈත ප්‍රදේශවලට යවන්නට බොහොම අමාරු වේවි. කොහොම වුණත් මම කල්පනා කරනවා, රජයේ සේවකයන්ගේ නිවාස ප්‍රශ්නය කල් දමන්නේ නැතුව සැලකිල්ලට ගත යුතු ප්‍රශ්නයක් කියා.

අනික් කාරණය නම් සියලුම ප්‍රධාන නගරවල දැනට උද්ගත වී තිබෙන ප්‍රධාන ප්‍රශ්න දෙකයි. ඉන් එක ප්‍රශ්නයක් පැල්පත් ප්‍රශ්නය. අනික් ප්‍රශ්නය මුඩුක්කු ප්‍රශ්නය. මුඩුක්කු ප්‍රශ්නයත් පැල්පත් ප්‍රශ්නයත් පසු ගිය අවුරුදු 10 ඇතුළත ඉතාමත් භයානක පිළිවෙළට උග්‍ර වී තිබෙනවා. කොළඹ නගරයේ පමණක් මම හිතනවා පැල්පත් 25,000ක් පමණ තිබෙනවාය කියා.

වී. ඒ. සුගතදාස මයා., එම්.බී.ඊ. (උතුරු කොළඹ)

(திரு. வீ. ஏ. சுகததாச, எம். பி. ஈ.— கொழும்பு வடக்கு)

(Mr. V. A. Sugathadasa, M.B.E.— Colombo North)

වැඩියි, වැඩියි.

ආචාර්ය ඩබ්ලිව්. දහනායක

(கலாநிதி டபிள்யு. தஹநாயக்க)

(Dr. W. Dahanayake)

හොඳයි අපි හිතමු, 30,000ක් පමණ තිබෙනවාය කියා. එක පැල්පතක 5 දෙනෙක් බැගින් සිටියත් කොළඹ නගරයේ පැලපත් ජනගහනය ලක්ෂ එකහමාරක් පමණ වෙනවා. එතකොට කොළඹ නගරයේ ඇතුළු නගරය පැල්පත් නගරයක්. කිසිම සෞඛ්‍ය තත්ත්වයක් නැහැ. ළමයින්ගේ පාසල් යෑමක් නැහැ. ඒ පැල්පත්වල සිටින අයගෙන් බොහෝ දෙනකුට රැකියාවක් නැහැ. ඔවුන් පුවත්පතක් සඟරාවක් කියවන්නෙ නැහැ. ඒ ඒ දවස මාසයේ මොන දවසදැයි කවුරුවත් දන්නේ නැහැ. ලක්ෂ දෙකක් වූ කොළඹ නගරයේ පැල්පත් වාසීන් පුදුම විධියට තමන්ගේ ජීවිත ගත කරනවා. අප සියලු දෙනාම මේ තත්ත්වය ගැන ලජ්ජා වන්නට ඕනෑ. ඒ තරම් විශාල සංඛ්‍යාවක් කිසිම අනාගත බලාපොරොත්තුවක් නැතිව කොළඹ නගර ජීවත් වීම ආණ්ඩුවට පමණක් නොව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අප කාටත් ලජ්ජාවට කාරණයක්. ඔවුන්ට අවශ්‍ය වන පළමුවැනි දේ නම් පදිංචි වීම සඳහා නිවාසයි. පැල්පත් නැතිකර දැමීම සඳහා රජය ගන්නා පියවර කුමක්ද? පැල්පත් වාසින්ගේ නිවැස ප්‍රශ්නය විසඳීමට අප සියලු දෙනාම උත්සාහ කරන්නට ඕනෑ. පැල්පත් වාසින්ට නිවාස ලබා දීම සඳහා මේ ආණ්ඩුව කුමන පියවරක් ගන්නට බලාපොරොත්තු වෙනවාද?

පැල්පත් ප්‍රශ්නය ළඟට මුඩුක්කු ප්‍රශ්නය තිබෙනවා. ඒක කාලයක් තිස්සේ ඇති වූ එකක්. ඒ ප්‍රශ්නය විසඳීම සඳහා විටින් විට උත්සාහ ගෙන ඇතත් තවමත් ඒ ප්‍රශ්නය විසඳීමට කිසිම ක්‍රමානුකූල වැඩ පිළිවෙළක් සකස් කර නැහැ. මුඩුක්කු ප්‍රශ්නය ඇති සියලුම නගරවල නගර සභා මඟින් සුදුසු නිවාස ක්‍රම ඇති කරනු ලැබීමත් සමඟම ඒ නිවාස සංඛ්‍යාවට සමාන වන මුඩුක්කු නිවාස සංඛ්‍යාවක් නැති කිරීමේ ක්‍රමයක් ඇති කරන්නට ඕනෑ. එක් නගරයක ගෙවල් සියක් සාදා මුඩුක්කු නිවාස සියක පදිංචි අය ඒ අලුත් නිවාස සියේ පදිංචි කරවන විට අර මුඩුක්කු නිවාස සිය නැති කර දමන්නට ඕනෑ. මේ විධියට ක්‍රියා කිරීමෙන් මේ අවුරුදු පහ තුළ අඩු ගාණේ මුඩුක්කු ප්‍රශ්නයෙන් භාගයක්වත් විසඳන්නට ගරු ඇමතිතුමා බලාපොරොත්තු වෙනවා ඇතැයි මා හිතනවා.

තවත් වැදගත් ප්‍රශ්නයක් තිබෙනවා. කොළඹ නගරයේත් තවත් නගරවලත් ගෙවල් කුලියට ගෙන පදිංචි වූවන් සිටිනවා. ගරු ඇමතිතුමා ඒ අයගේ ප්‍රශ්නය විසඳීම සඳහා ඉතා ඕනෑකමින් උත්සාහ කර තිබෙනවා. ඒ අතරම මතක් කළ යුතු කාරණයක්ද තිබෙනවා. මා මොරීන් සෙනෙවිරත්න කොමිටියේ වාර්තාව සම්පූර්ණයෙන්ම කියවා නැහැ. මා හිතන්නේ ඒ වාර්තාවේ හුඟක් හොඳ යෝජනා තිබෙනවා කියලයි. එහෙත් ප්‍රවෘත්ති පත්‍රවල පළ වූ ඇතැම් ලිපි අනුව නම් ඒ සමහර යෝජනා කෲරයි. මොරීන් සෙනෙවිරත්න කොමිටියේ වාර්තාව මෙම ගරු සභාවට ඉදිරිපත් කිරීම ප්‍රමාද වී ඇතත් එය දැන් වත් මෙම ගරු සභාවට ඉදිරිපත් කර අපට ලැබෙන්නට සලස්වනවාදැයි මා දැන ගන්නට කැමතියි. ප්‍රවෘත්ති පත්‍රවල තිබුණු අන්දමට නම් යම්කිසි ගෙයක් අයිතිකරුවකු නොදැනුවත්ව යම් දෙයක් රජයට නොදැන්වුවහොත් ඔහුට හිර දඬුවම් ලබන්නට සිදු වෙනවා. යම් කෙනකුගේ නිවසේ කාමරයක් අල්ලා කෙනකුට දීමෙන් පසුව ඒ බව රජයට දන්වන්නට බැරි වුණත් දඬුවමක් ලැබෙනවා. වෙනත් දඬුවමක් නැතිව හිර දඬුවම්ක්ම ලැබෙනවා. මේ විධියට පුද්ගලයන්ට හිර දඬුවම් දෙන්නට ගියහොත් හිර ගෙවල් ඉඩකඩ මදකමින් තවත් නිවාස ප්‍රශ්නයක් ඇති වෙනවා. ඒ කෙසේ වුණත් මොරීන් සෙනෙවිරත්න වාර්තාවේ සඳහන් යෝජනාවලින් වැඩි කොටසක් හොඳ ඒවා යයි මා හිතනවා. ඒ වාර්තාවේ ඒ හොඳ යෝජනා අනුව ගරු ඇමතිතුමා ක්‍රියා කර නැයි මා බලාපොරොත්තු වෙනවා. ගෙවල් හිමියන් වැරදි සහගත පිළිවෙළට කටයුතු කරන බව අප පිළිගන්නවා. එම නිසා, ඒ කරුණ අනුව ගරු ඇමතිතුමා ගන්න සියලුම පියවරවල් අනුමත කරන්නට අපි කැමතියි.

ඒ ප්‍රශ්නය අනුවම තවත් වැදගත් ප්‍රශ්නයක් තිබෙනවා. එනම්, ශිෂ්‍යයින්ගේ නිවාස ප්‍රශ්නයයි. විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයින්ට නිවාස ඇත්තේ නැහැ. පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සමහර ශිෂ්‍යයින් තේකඩවල සහ බේකරිවල පදිංචි වී සිටිනවා. එමෙන්ම කොළඹ විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයින්ටත් සුදුසු නිවාස ඇත්තේ නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඔය කියන්නේ ගරු අධ්‍යාපන ඇමතිතුමාටද ගරු නිවාස ඇමතිතුමාටද?

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டபிள்யு. தஹநாயக்க)
(Dr. W. Dahanayake)

මෙයත් නිවාස ඇමතිතුමාට. ඒ ප්‍රශ්නයත් විසඳිය යුත්තේ ගරු නිවාස ඇමතිතුමාය කියා මා කල්පනා කරනවා. පසගිය කාලයේ ඒ ප්‍රශ්නය විසඳුණේ නැතිව අද එය උග්‍ර වී තිබෙනවා. විශ්ව විද්‍යාල ශිෂ්‍යයින් මෙන්ම වෙනත් නොයෙකුත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය ඩබ්ලිව්. දහනායක]

ආයතනවල හා විද්‍යාලවල ශිෂ්‍යයින් රාශියකුත් කොළඹ නගරයේ නැවතීමට ස්ථාන නැතිව සිටිනවා. එම නිසා පවුල්වලට අමුත්තන් නැත්නම් "බෝර්ඩර්ස්ලා" ගැනීමේ ක්‍රමයක් කොළඹ නගරයේ ඇති වී තිබෙනවා. ඒ ප්‍රශ්නය ගැනත් කල්පනා කර ඊට සුදුසු පිළියම් යොදන හැටියට මා ඉල්ලා සිටිනවා.

අද ඇති වී තිබෙන තත්ත්වය අනුව කුරුඳුවත්තේ තිබෙන "මාළිගාව" නමැති ඔබේසේකර නිවස බලහත්කාරයෙන් ගන්නට කොළඹ විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයින් උත්සාහයක් ගත්තාය කියා අපට ආරංචියි. එසේ එය ගැනීමේ වරදක් තිබෙනවාය කියා මා නම් හිතන්නේ නැහැ. මන්ද කියනවා නම්, ඒ විධියේ පනහකට ඉන්නට පුළුවන්, එහෙත් දෙතුන් දෙනෙක් පමණක් සිටින, නිවාස බොහොමයක් කුරුඳුවත්තේ තිබෙනවා. එවැනි නිවාස රජයට පවරා ගන්නට ගරු ඇමතිතුමාට යුතුකමක් තිබෙනවා. එවැනි නිවාස රජයට පවරා ගන්නට බැරි දෑයි කියා මා අහනවා. දෙසියයකට පමණ ඉන්නට පුළුවන් විශ්ව විද්‍යාලයට කිට්ටුව මාළිගා වැනි විශාල නිවාස නිකම් තිබෙනවා නම්, නැත්නම් ඉන්නේ දෙතුන් දෙනා නම්, ඒවා පැය 12 කින් රජයට පවරා ගන්නට බැරි ඇයි කියා මා අහනවා. එවැනි නිවාස අල්ලා ගන්නට විශ්ව විද්‍යාල ශිෂ්‍යයින් තුළ කල්පනාවක් තිබුණාය, පොලිසියෙන් එය නවත්වා තිබෙනවාය කියා මට ආරංචියි. එවැනි අදහසක් තිබෙනවා නම් එය නවත්වන්නට එපාය කියා මා කියනවා. එක්කෝ තමුන්නාන්සේ එවැනි නිවාස රජයට පවරා ගන්නට ඕනෑ; නැත්නම් ඒ අයට ගන්නට ඉඩ දෙන්න ඕනෑ. නිකම්ම හිස්ව තිබෙන නිවාස රාශියක් කොළඹ හතේ තිබෙනවා. මා කියන්නේ නැහැ බලහත්කාරයෙන් ගන්නය කියා. ඇක්විසිෂන්—acquisition—ක්‍රමයට එවැනි නිවාස රජයට පවරා ගන්නට පුළුවන්කම තිබෙනවා. [බාධාකිරීමක්] ඇයි පොදු වැඩවලටය කියා, ජාතික නිවාස ක්‍රමයක් ඇති කිරීමටය කියා, ගන්නට පුළුවන්නේ. ඒ කෙසේ වුවත්, ඒවා ගන්නට බැරි නම් ඉක්මණින් නිවාස හදා දෙන්න. දැන් අප සියලුදෙනාම බලා පොරොත්තු වන්නේ ඔක්තෝබර් 26 වැනි දා අයවැය ලේඛනය මගින් එවැනි සැලැස්මක් ඉදිරිපත් කරනවා ඇත කියලයි. මේ අවස්ථාවේ එවැන්නක් අපි බලාපොරොත්තු වන්නේ නැහැ. එහෙත් ඔක්තෝබර් 26 වැනි දා එවැනි සැලැස්මක් ඇතිවේය කියා අපි බලාපොරොත්තු වෙනවා. මේ සියලුම කරුණු ගැන කල්පනා කර බලා ලක්ෂ 10ක ප්‍රශ්නයක් වන, එමෙන් ම ඉතා බැරෑරුම් ප්‍රශ්නයක් වන, මේ නිවාස ප්‍රශ්නයෙන් බාගයක්වත් මේ අවුරුදු 5 ඇතුළත විසඳීමට සැලැස්මක් ඔක්තෝබර් 26 වැනිදා ගරු ඇමතිතුමා අපට දෙනවා ඇත කියා බලාපොරොත්තු වෙමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

ගරු පී. ජී. බී. කෙනමන් (නිවාස හා ගොඩනැගිලි ඇමති)
(கௌரவ பீ. ஜீ. பி. கெனமன்—வீட மைப்பு, நிர்மாண அமைச்சர்)
(The Hon. P. G. B. Keuneman—Minister of Housing and Construction)

නැගී සිටියේය——
எழுந்தார்——
rose——

එම්. එම්. මුස්තාෆා මයා. (නින්තවුර්)
(ஜனாப் எம். எம். முஸ்தபா—நிந்தவூர்)
(Mr. M. M. Mustapha—Nintavur)

නැගී සිටියේය——
எழுந்தார்——
rose——

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

I think this matter has been sufficiently discussed. There is no need for further discussion.

ගරු කෙනමන්
(கௌரவ கெனமன்)
(The Hon. Keuneman)

Mr. Speaker, hon. Members who were not able to contribute to my edification on this subject will undoubtedly get another chance tomorrow when the Vote on Account is debated, and again next month when the Budget proper is taken up.

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)

The Tenants Bill.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු කෙනමන්

(கௌரவ கெனமன்)

(The Hon. Keuneman)

So, I hope that my hon. Friends opposite as well as hon. Members on this side will not object if I seek at this moment to close this Debate. I am very anxious indeed that the Supplementary Estimate should be passed because before the end of this month, that is to say, before the end of the financial year, I want to be able to spend this Rs. 10½ million both in providing overdue instalments to persons whose housing loans were sanctioned but who could not get the money owing to the decision of the earlier Government to stop all loans from January 1970, and also in providing loans to 500 new persons who had asked for loans and whose applications have been serviced and are ready to be dealt with.

I am very glad that in the course of the last three months there has been a great deal of discussion on the question of housing. I think that is a result of the fact that this Government intends to give housing greater priority than it has been given earlier.

Food, clothing and shelter are three basic requisites of a human being, but, unfortunately, as far as shelter was concerned it had very low priority in the past. As Minister I certainly welcome the public discussions in the newspapers as well as in the House that have taken place on the question of housing. I thank hon. Members on both sides of the House for the many contributions and valuable suggestions they made. We had a number of interesting contributions.

The hon. Leader of the Opposition seems to have spent his enforced leisure in making a study, or a re-study, of all the legislation and reports on housing, and I must say that he seems to have done a very comprehensive job. I must assure him that the National Housing Act, No. 37 of 1954, was amended by Act No. 30 of 1955, and Section 13 (2) specifically provided that this amendment was to have retrospective and retroactive effect. But the amending Act No. 42 of 1958 never had any provision for retrospective or retroactive effect.

That amendment of 1958 was intended to apply prospectively to houses built after that amendment came into effect and not retrospectively to houses in respect of which certificates had already been issued by the Commissioner.

Any retrospective legislation is invariably in favour of the taxpayer and never intended to affect him adversely. The amendment of 1966 clearly sets out this principle. Obviously, sojourn in the Opposition makes experts of us all, and the hon. Leader of the Opposition is no exception.

I agree with him in his estimate of the Alif Report. It is nearly a decade ago that this report was started and finished. You know that the report dealt with only a special subject, namely, the contribution that the private sector could make to housing, and was therefore limited. Nevertheless, it is by far the most comprehensive and detailed report that we have on housing. I think hon. Members are aware that many of the recommendations in that report have still not been implemented.

As so much water had flowed under the Kelani Bridge since that report became public, I thought it best to reappoint a special committee on housing to assess what has taken place in the last decade and to make recommendations to me and to this Government on what further steps we should take on the question of Housing. Mr. Alif is himself chairing that committee. It is a committee mainly of officials, and I have had some discussions with them, and I think we can look forward to a very valuable report.

We also had a number of other hon. Members making interesting contributions. I was rather alarmed when my good Friend, the hon. First Member for Colombo Central (Mr. Premadasa), started selling up all the Crown land in Colombo. I was wondering whether even the Crown land on which this building stands would be added to the list! Nevertheless, the ideas which he put forward are being examined. I have read his Cabinet Paper and I have

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු කෙනෙමන්]

asked the committee on housing to pay special attention to all the contributions and all the suggestions that have been made in this Debate, and I am sure that they will go into the matter with greater detail and with greater authority than can be expected from one who is, after all, a part-time Minister on these matters.

I have issued a set of fairly comprehensive terms of reference to the new committee embracing all the relevant aspects of the housing question, and I hope that hon. Members will be able to assist the committee and assist us in making any other contributions that they have not had the opportunity of making in the course of this Debate.

The hon. Member for Galle (Dr. W. Dahanayake) called for a five-year plan to build 500,000 houses in these five years. He seems to be rather enamoured of this figure '5'. I agree that we need some type of a plan, but, as all hon. Members know, the basic material we require at the moment for housing is money, because if we have the necessary money I can assure you that we will build the necessary houses. We have the technical and other capacities to build the houses. I must say that with all the difficulties—I can tell you they are monumental—that you have left him, the Hon. Minister of Finance has been most generous in the question of housing, and I wish to thank him on this matter because not a single request that has been made for housing by this Ministry has been turned down on the ground of the difficult economic situation, and I know how difficult that situation is.

My hon. Friend, the Leader of the Opposition, quite correctly told us the size of this problem. According to the Alif Report, we need immediately 945,000 houses. Every year we need another 50,000 houses. So we have already passed the one million mark. As Minister I have scrounged and scraped every cent I could get out of the Votes and I did not find even Rs. 1 million left. No one has shown me how to build a house for a rupee. I do not think on the present sums of money that are available to me I would be able to fulfil the five-year plan suggested by the hon. Member for Galle, unless of course I build castles in the air.

The problem is enormous and I think we would be well advised to approach it in a realistic way. On the basis of the resources and the funds that are available I am trying to do the best with what we have. It is very easy to sketch ideal solutions. That is not difficult at all; all one needs is imagination. But a pragmatic and practical approach, I think, is of greater advantage, and in this case I should like to proceed from the position that an ounce of performance is far better than a ton of day-dreams.

When I took over this Ministry I thought I had better start from where I was. I first found there was a lot of unfinished business. The previous Government had started some schemes which were not completed. In some cases foundation stones had been laid but work had not gone any further. In some cases opening ceremonies had been held but they were just behindhand. So I thought the first thing to do was to try and finish the unfinished business.

I must say that I do not agree with all those projects. I think some of them are far too costly; some of them are badly planned; some of them are being dictated more by electoral rather than housing considerations. Nevertheless, since they were under way the main thing to do, in my opinion, was to finish them as quickly as possible. So I gave instructions to my officials: there is no point crying over spilt milk, let us get ahead and try and finish these things as quickly as possible.

I am informed—I hope I am correctly informed—that by the end of this year about 1,000 housing units in various parts of the country will be available for letting; some of them will be available from next month itself.

The next question that I had to deal with is the question of loans. As I

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

said, all housing loans had been stopped from January 1970, and a number of persons were in great difficulties. Some of them had already begun work, building their houses, but they were not able to complete their houses because the instalments on the loans could not be given. In the case of others, all the preparations had been gone through, the lawyer's reports and other reports had been furnished, but there was no money to give them. Therefore the main job that we had to undertake was to see that at least enough money became available to service the existing loans and to provide money for a little more than 500 new applications before 30th September 1970, that is, before the end of the current financial year.

I am hoping that next year I shall come for further financial provision for this matter.

The Hon. Minister of Finance and the other members of the Cabinet were generous indeed to agree to allocating this sum in the Estimate which is now before the House for its acceptance.

The third matter which engaged my attention was the need to build some houses myself. I had to make a rather difficult choice here, because, as I mentioned earlier, the houses which had been built in the last five years and also the flats which had been built in this period were so costly that the working class and most of the middle class could not really afford to pay the economic rents that were being demanded. The other alternative was to have massive subsidies, and that is a question of policy which can only be decided at a time when the exchequer is full—and our exchequer, as you know, is by no means full. Therefore, whatever decision you take cannot be backed up by actual contributions from the exchequer itself. There would, therefore, be little purpose in entering into speculation as to policy.

So, with whatever funds that were available and with the land that was available, I thought I would start building some houses.

I know it is correct in theory that in highly congested urban areas we should go in for flats, but the trouble is that the cost of construction of flats has been so great and the problem of letting out flats on hire-purchase agreements is so complicated that we had to go into this matter a little more carefully.

I examined the question and I found that, on an acre of land, if we build flats up to four storeys, we could get about 48 housing units, but if we build low-cost individual houses on an acre of land we could get about 40 housing units. It struck me that the difference in price was so marked that it would be better for me to build smaller houses of an individual nature on a law-cost housing scheme.

I have therefore presented to the Cabinet a scheme—hon. Members will hear more about it in the course of the Budget Debate—by which 2,500 low-cost houses each costing Rs. 5 300 will be built in and around the City of Colombo on land which already belongs to the Department of National Housing, not to the Government but to my department. That, as a start, is something we are trying to get ahead with. I am hoping that I shall be able to let out those houses at anything between Rs. 25 to Rs. 30 per month which, though a high rent for the working class, is still something that can be managed.

ප්‍රේමදාස මයා.
(திரு. பிரேமதாச)
(Mr. Premadasa)
What are the areas ?

ගරු කෙනමන්
(கௌரவ கெனமன்)
(The Hon. Keuneman)
These houses will mainly be built in Colombo South, Colombo North, Colombo Central, Borella District and round about Colombo because that is where the land is.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)
And nowhere else ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු කෙනමන්

(கௌரவ கெனமன்)

(The Hon. Keuneman)

That is where I have got land. The moment I get more land and more money I shall build more houses. I start with the fact that it is in Colombo that the land is available; I do not have to acquire this land. So I am starting with with what I have got. After that I am certainly prepared to go on building houses everywhere else where I can get land.

එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.

(மிகமுவ)

(திரு. என். டென்சில் பர்ணந்து—நீர் கொழும்பு)

(Mr. N. Denzil Fernando—Negombo)

Other local bodies have lands.

ගරු කෙනමන්

(கௌரவ கெனமன்)

(The Hon. Keuneman)

If other local bodies would like to come and discuss the matter with me I should be very happy to discuss with them. Some have already done so.

The next thing I tried to do was to get back some of the houses which were built for residential purposes but which are now being used for non-residential purposes. In this respect the Government and government corporations have been very big sinners but on the whole they have taken over large houses. There are whole lots of medium and smaller houses which were originally built for residential purposes but which are now turned over for non-residential purposes—commercial purposes. I am exploring the possibility of legislation to see that these houses are returned to the original purpose and that the purpose for which they are now used is discontinued within a specific period of time.

ප්‍රේමදාස මයා.

(திரு. பிரேமதாச)

(Mr. Premadasa)

What about zoning?

පරිපූරක මුදල්

ගරු කෙනමන්

(கௌரவ கெனமன்)

(The Hon. Keuneman)

Zoning is an ideal but unfortunately has been observed more in the breach than in performance by some of the local authorities. I have not come to a final conclusion on the exact method or methods that I intend to adopt but I certainly intend to do this because I do not see why we should go on building houses for people to live in and then have them rented out for non-residential purposes.

The next point which is now engaging my attention is reducing the land values and cheapening the cost of building materials. The cost of building materials is a matter that strictly does not come under me but under my Friend the Minister of Industries, but I am already having certain discussions with him because, in my opinion, the prices of building materials can be brought down. So many of them are manufactured in Ceylon itself, sometimes by persons who have been given virtual monopolies in this line. I find from a study of the structure of profits in the building trade that certain persons engaged in producing building materials—and they are not all of them in the private sector—are charging profits which appear to be very exorbitant, and I think certain government corporations which are also producing materials essential for building —I do not want to mention names—could well bring down the prices that they are now charging the consumers.

On the question of land values, I have certain proposals to bring down the artificially high land values. You can see how artificial land values were, because the very moment I went and sat in that chair of mine and made a couple of speeches land values came down, because land speculators were panicky. It has nothing to do with real values. There are whole lots of people who just sit on land and they wait for it to appreciate in value, not through any effort of their own. Sometimes when the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

municipality comes along and lays a drain or puts in a side-walk or lays electric mains, the value of land appreciates, and they just hold on to this as speculators. I think the time has come when all of us should get together and compel these people to build or to hand over to those who will build. We cannot afford to have valuable land left lying idle in the cities.

There has been a great deal of discussion on the relative roles of the public and the private sectors. A number of Members on both sides of the House advised me to have nothing to do with the private sector. Some of them told me that housing is essentially a public sector activity. Of course, I would be the happiest man if that were so. A very big businessman, who is also in the housing line in addition to a lot of other lines, visited me in my office and discussed with me the attitude of my Ministry to the private sector, and he kept on telling me about the virtues of the private sector. Eventually, I had to tell him quite bluntly, " Please do not ask me to love you, but let me tell you that if you are ready to build the type of houses I want, I am ready to work with you." That is my approach to the private sector. I do not consider it from an ideological but from a pragmatic point of view. I do not like the private sector, and please do not ask me to think that they are performing some civic function. But if, in the course of making money, they also incidentally contribute to something which I want, then I am prepared to work along and come to some arrangement largely because I do not have the funds and the wherewithal to do it all by myself, and that is not at all an unusual position for socialism.

I understand that the private sector works on the profit motive, and anybody who wants to work on that basis must take that into account ; otherwise it is not realism. I told this gentleman from the private sector that if they are prepared to build the houses that I want according to the conditions which I lay down, then, as far as I am concerned, I am prepared to come to some arrangement. I understand that they want to make some money out of it ; there will have to be some give and take in this matter, because what we are trying to settle here is not necessarily an ideological problem but the problem that there are a million people without houses in this country—and they need houses. That is the fundamental starting point on this basis. But, of course, I must say quite clearly that the performance of the private sector in housing all this time has not been a very inspiring one. They were given quite formidable concessions by the last Government. I could give you a whole list of those concessions, but they are well known. The last Government was more than generous, but for some reason the private sector did not take advantage of this generosity. Of course, up to a point they built large houses which they let out at high rents. That type of building activity did take place.

In fact, studying a good deal of building activity in the western region, I found that most of the houses built were houses of that type. I have not been able to discover in the course of my discussion with the representatives of the private sector who met me what it was that made them reluctant to take advantage of those concessions. They could not explain it to me either.

Well, if any one of them is still prepared to do that, Sir, I shall be more than happy to try and solve that part of the problem.

I have had discussions with the Chamber of Commerce—not official but tentative discussions—and with the Employers' Federation about the provision of houses for their employees, and also with various other building societies, building organizations and so on in the private sector.

I hope to make a comprehensive statement on building and housing policy very soon. In the meantime I

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු කෙනෙමන්]

should like to make it known that as far as my Ministry is concerned we would certainly welcome any contribution that the private sector can make towards building the type of houses we want and the nation needs.

The question of slum clearance was raised by the hon. Member for Galle (Dr. W. Dahanayake). This is also a very big problem and one that affects the cities very much. In fact, it is not very unusual that the hon. Members who took part in this Debate are those representing city constituencies. I wish to say that a number of slum landlords have seen me and offered me their properties —of course, not free. If they come as gifts I would take them at once. They offered me these properties on deferred payment terms, and they also suggested a scheme on this matter.

I am going into this question because, unfortunately, some of the best land in these cities is virtually dead land as it cannot be properly utilized owing to the fact that there are buildings on it which are of no economic value ; indeed, they depress the value of the land. A number of such landowners have come and discussed with me the question of handing over these lands, and I think I would soon be in a position to make proposals to this House in that regard so that we can make the fullest use of these lands. It may be that I shall be able to put into operation the suggestion made by the hon. First Member for Colombo Central (Mr. Premadasa), namely, to sell such lands.

I must say that, much as I dislike it in theory, as a result of certain things that were done by the last Government I would be compelled to sell some of the land that belongs to me—not to me personally but as Minister. There is a case in point in Wanathamulla. I do not know why the former Minister did this. There is an extent of land which has been given to the Chamber of Commerce, I believe. I speak subject to correction. The land has been given to some big organization, and they have built big houses on it. I see no reason why

I should be the owner of this land. The houses have been built on this land. I am the owner of this land but they have become the owners of the houses. I do not know what exactly was the contractual relationship between my department and these people. The result is that there are these large houses which do not belong to me, while the land belongs to the Housing Department. It seems to me that the only thing to do is to sell the land. If there are large blocks of flats, and if some government departments are anxious to buy them, I am prepared to sell them and make use of the money to build small houses. I just mention this by the way because I want to show the hon. Member for Galle that some of the questions he raised are under active consideration by my Ministry.

On the question of the rent problem, which he mentioned, I think the facts are well known. I did appoint a committee with Miss Maureen Seneviratne as chairman. The committee was given a very short time to prepare a report. I gave them a period of one month, and they took one day less than a month and gave me a report. I had the report published in the newspapers. I must say that the newspapers—most of them—published the report in full. If hon. Members so desire, I shall see that they get copies of the report.

I did not take action on the report deliberately because I wanted the widest public discussion on it. For a month after I received the report I took no action on it and I let the matter be discussed through the press, through letters to me, and through seminars because I wanted to have public suggestions and public opinion on the matters contained in the report. Now I seem to have gathered all the opinions and I am in the process of drafting certain amendments. Several Members on both sides of the House have sent me letters or suggestions with regard to these matters and I thank them very much

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

for doing so. I would certainly appreciate any other suggestions that hon. Members care to make.

ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.
(திரு. டென்சில் பர்ணந்து)
(Mr. Denzil Fernando)

One suggestion was made by the hon. Member for Galle (Dr. W. Dahanayake) about *mudukku* or narrow roads or footpaths. That is an important matter.

ගරු කෙනමන්
(கௌரவ கெனமன்)
(The Hon. Keuneman)

I do not want to waste time by going into all those details. All those questions were noted. I have made a special note of that suggestion of the hon. Member for Galle.

Unfortunately, my desire to be democratic and allow the widest possible discussion on this question of amendment of the Rent Restriction Act was taken advantage of by some landlords. I want to make it quite clear that this section of the landlords are not the majority of them. But there is a small minority of landlords who have been resorting to the most unscrupulous methods in order to evict tenants in anticipation of a Bill that may come before the House. I have had over 300 complaints of the use of force, use of threats, the cutting off of essential amenities, the pollution of water supplies and so on.

You would recall that the hon. Appointed Member (Mr. Aziz) raised specific matters in this House about a month ago. I told this section of the landlords that if they continue along this course I would be compelled to take punitive measures. Unfortunately they did not listen to that warning. Therefore the Cabinet has been compelled to place before this House this interim punitive legislation to deal with cases of this type. I like to say, it gives me no pleasure to send anybody to prison. But if there are certain landlords who are going to act in this way, then, really we have to make an example of one or two of them in order to warn others that they should not continue with this particular thing.

That is all. I do not think there is any division of opinion among hon. Members with regard to the need to pass this Supplementary Estimate. Once again may I thank all hon. Members for their co-operation in allowing the Estimate to be passed in time for moneys to be distributed to those who are so in need of it and also thank all hon. Members for the helpful suggestions that they made to me. I welcome them very much.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පරිපූරක මුදල: ලංකා ගුවන් විදුලි සංස්ථාව— ට්‍රාන්ස්මිටර් සේවා සහ මැදිරි පහසුකම් පුළුල් කිරීම

குறை நிரப்புந் தொகை: இலங்கை ஒலிபரப்புக் கூட்டத்தாபனம், ஒலிசெலுத்திச் சேவைகளையும் கவின் நிலைய வசதிகளையும் விருத்தி செய்தல்

SUPPLEMENTARY SUPPLY: CEYLON BROADCASTING CORPORATION—EXPANSION OF TRANSMITTING SERVICES AND STUDIO FACILITIES

අ. භා. 3.48

ගරු ආර්. එස්. පෙරේරා (ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමති)
(கௌரவ ஆர். எஸ். பெரேரா—தகவல், ஒலிபரப்பு அமைச்சர்)
(The Hon. R. S. Perera—Minister of Information and Broadcasting)

ගරු කථානායකතුමනි, මගේ නමින් අද දින ත්‍යාය පත්‍රයේ තිබෙන මෙම යෝජනාව මම ඉදිරිපත් කරනවා:

"1969 ඔක්තෝබර් 1 වැනිදායින් ආරම්භ වී 1970 සැප්තැම්බර් 30 වැනිදායින් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවය සඳහා ලංකාවේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ ලංකාණ්ඩුවේ වෙන කිසි යම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ලංකාණ්ඩු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

වට සුදුස්සක් කළ හැකිව තිබෙන මූදලකින් හෝ ලංකාණ්ඩුව විසින් ණයට ලබාගන්නා මුදලකින් හෝ රුපියල් පහළොස් ලක්ෂයකට (රු. 15,00,000) නොවැඩි පරිපූරක මුදලක්, ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත පෙනෙන උපලේඛනයේ නියමිත පරිදි වැය කළ යුතුය.

උපලේඛනය

ශීර්ෂය: 26—ප්‍රවෘත්ති හා ගුවන් විදුලි අමාත්‍යවරයා ... ... රු.

සම්මතයේ අංකය: 7—ආර්ථික සංවර්ධනය —මූලධන වියදම් ... 15,00,000"

ගරු කථානායකතුමනි, මෙම පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කරන්නේ අලුතින් වියදම් කිරීම සඳහා මුදල් ලබා ගැනීමට නොව වැය කළ මුදලක් ප්‍රතිපාදනය කිරීමට පමණයි. 1969-70 ආදායම් වර්ෂය තුළ රුපියල් ලක්ෂ 45ක විදේශ අධාර මුදලක් ලබා ගැනීමට පසුගිය ආණ්ඩුව ජර්මන් පෙඩරල් සමූහාණ්ඩුවත් සමග ඇති කර ගත් ගිවිසුමක් අනුව ක්‍රියා කර තිබෙනවා. ට්‍රාන්ස්මීටර් සේවාවන් හා මැදිරි පහසුකම් වැඩි දියුණු කිරීමට ලංකා ගුවන් විදුලි සංස්ථාවට—ආධාර විෂයය 2 —විදේශාධාර වියදම් යටතේ කළ ප්‍රතිපාදනය, 1968-69 වර්ෂයේ රජයේ ඇස්තමේන්තුවල රුපියල් ලක්ෂ 45ක් හැටියට සඳහන් වෙනවා. 1969 සැප්තැම්බර් 30 වැනිදා දක්වා ලැබුණු උපකරණවල නියම වටිනාකම රු. 23,00,000ක් වෙනවා. රු. 22,00,000ක් වටිනා ඉතිරි උපකරණ ලැබුණේ 1969 ඔක්තෝබර් මාසයේ සිට 1970 අප්‍රේල් මාසය දක්වා කාලය තුළදීයි. ලැබුණු මුළු උපකරණවල වටිනාකම වන රුපියල් ලක්ෂ 45ක් වූ ප්‍රමාණය 1969-70 යටතේ භාණ්ඩාගාර පොත්වල ගිණුම් ගත කිරීම අවශ්‍ය වෙනවා. 1969-70 රජයේ ඇස්තමේන්තුවල ශීර්ෂ 26, සම්මත 7, උපශීර්ෂ 11, විෂය 2 යටතේ රු. 30,00,000ක් දැනටමත් ප්‍රතිපාදනය කර තිබෙනවා. එහෙත් තවත් රු. 15,00,000ක ප්‍රතිපාදනයක් අවශ්‍ය වී තිබෙනවා. ඒ මුදල ප්‍රතිපාදනය කර නැහැ. පොත්පත්වල ප්‍රතිපාදනය කර තිබෙන්නේ රුපියල් ලක්ෂ 30ක් පමණක් නිසා ඉතිරි හරිය සඳහා රුපියල් ලක්ෂ 15ක් වුවමනා කරනවා. ඒ හැර, ඊට වඩා යමක් මේ ගැන කියන්නට නැහැ. ඒ නිසා මෙයට මේ ගරු සභාවේ අනුමැතිය බලා පොරොත්තු වෙනවා.

පරිපූරක මුදල්

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Question put, and agreed to.

පරිපූරක මුදල: වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා: පෞද්ගලික පඩිනඩි හා කාර්ය මණ්ඩල දීමනා ආදිය

குறை நிரப்புந் தொகை: தோட்டத் தொழில் அமைச்சர்: பணியாளரின் ஊழைக்குரிய வேதனமும் பிற படிகளும்

SUPPLEMENTARY SUPPLY: MINISTER OF PLANTATION INDUSTRY—PERSONAL EMOLUMENTS AND OTHER ALLOWANCES OF STAFF

අ. භා. 3.53

ගරු ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා (වැවිලි කර්මාන්ත ඇමති සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු ඇමති)

(கௌரவ கலாநிதி கொல்வின் ஆர். த சில்வா—தோட்டத் தொழில் அமைச்சரும் அரசியலமைப்பு அலுவல்கள் அமைச்சரும்)

(The Hon. Dr. Colvin R. de Silva—Minister of Plantation Industry and Minister of Constitutional Affairs)

ගරු කථානායකතුමනි, මා නමින් තිබෙන මෙම පරිපූරක මුදල වෙන් කිරීම සඳහා වූ යෝජනාව මම ඉදිරිපත් කරනවා:

"1969 ඔක්තෝබර් 1 වැනිදායින් ආරම්භ වී 1970 සැප්තැම්බර් 30 වැනිදායින් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවය සඳහා ලංකාවේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ ලංකාණ්ඩුවේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල් වලින් හෝ ලංකාණ්ඩුවට සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ලංකාණ්ඩුව විසින් ණයට ලබා ගන්නා මුදලකින් හෝ රුපියල් තුන් ලක්ෂ හතලිස් දෙදහස් හාරසිය හතලිස් හයකට (රු. 3,42,446) නොවැඩි පරිපූරක මුදලක්, ගෙවිය යුතු අතර, එම මුදල මෙහි පහත පෙනෙන උප ලේඛනයේ නියමිත පරිදි වැය කළ යුතුය.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

උපලේඛනය

ශීර්ෂය: 188—වැවිලි කර්මාන්ත අමාත්‍ය		
වරයා		රු.
සම්මතයේ අංකය 1—පෞද්ගලික පඩිනඩි හා කාර්ය මණ්ඩලයේ අනිකුත් දීමනා		91,946
සම්මතයේ අංකය: 2—පාලන ගාස්තු— පුනරාවර්තන වියදම් ...		1,53,500
සම්මතයේ අංකය: 3—පාලන ගාස්තු— මූලධන වියදම්		97,000
		3,42,446 "

මේ ගරු සභාව දන්නවා ඇති, මට භාරව තිබෙන අමාත්‍යාංශ දෙකම සම්පූර්ණ යෙන්ම අලුත් ඒවා බව. මේ පරිපූරක මුදල වුවමනා වී තිබෙන්නේ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ වැඩ කටයුතු වෙනු වෙන් ඇති වියදම් සඳහායි.

මේ ගණන සෑදී ඇති අන්දම ගැන එක කාරණයක් කිය යුතුව තිබෙනවා. 2 වෙනි සම්මතයේ පාලන ගාස්තු—පුනරාවර්තන වියදම් වශයෙන් යොදා තිබෙන රු. 1,53,500 ට වැදගත් ගෙවල් කුලියකුත් අයත් වෙනවා. ඇමති අංශය පිහිටුවන්නට තැනක් සොයන්නට මට සිද්ධ වුණා. වාසනාවකට වගේ නේ පාලක දෙපාර්ත මේන්තුව විසින් එම දෙපාර්තමේන්තුවේ වුවමනාවන් සඳහා කුලියට ලබාගෙන තිබුණු කොළඹ කොටුවේ ගොඩනැගිල්ලක දෙවෙනි තට්ටුව යන්තම් මට ඒ සඳහා ලබා ගන්නට පුළුවන් වුණා. එය ලැබිලත් සුමාන 1½ක් විතර මගේ ඇමති අංශයේ පාලන කටයුතු ගෙන ගියේ "පේවිමන්ට්" එකේ සිටයි. මට දෙන්නට තිබෙන නියෝග ආදිය දෙමින් තාවකාලිකව එහෙම කටයුතු කරන්නට සිද්ධ වුණා. මේ මුදල මේ මාස කිහිපයේ වියදම සඳහා පමණක් ඉල්ලා සිටියත්, මෙය අලුතෙන් පටන් ගත් ඇමති අංශයක් නිසා නැවතත් ඇති නොවන වියදම් සමහරකුත් මීට ඇතුළත් වී තිබෙන බව තමුන්නාන්සේලාට පෙනෙයි. ඒ ස්ථානය සූදානම් කිරීමටත්, මේස පුටු ආදිය මිළදී ගැනීමටත් සෑහෙන මුදලක් අවශ්‍ය වුණා. අලුත් කාර්යාලයට ගියායින් පසුවත් සුමානයක් තරම් යන තුරු මට කථා කරන්නට ටෙලිෆෝන් තුනක් තිබුණු නමුත් පුටු තිබුණේ දෙකක් පමණයි. මේ පරිපූරක මුදල් සම්මත කරන මෙන් මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

விஞ்ஞ எடுத்தியம்பப்பெற்றது.

Question proposed.

පරිපූරක මුදල්

අ. භා. 3.55

ආචාර්ය ඩබ්ලිව්. දහනායක

(கலாநிதி டபிள்யு. தஹநாயக்க)

(Dr. W. Dahanayake)

ගරු කථානායකතුමනි, අපේ වැවිලි කර්මාන්ත ඇමතිතුමා විසින් ඉදිරිපත් කර තිබෙන මේ වැය ශීර්ෂය අප ඉතාම සන්තෝෂයෙන් සම්මත කරන්නට කැමතියි. මේ යෝජනාව මංගල යෝජනාවක් හැටියට සලකන්නට පුළුවනි. අපේ රටට පළමු වතාවට වැවිලි කර්මාන්ත ඇමතිවරයෙකු ලැබී තිබෙනවා. වැවිලි කර්මාන්ත ඇමතිවරයෙකු ලැබුණාට පසුව අප තුළ හැඟීමක් ඇති වුණා, මෙපමණ කාලයක් වැවිලි කර්මාන්ත ඇමතිවරයෙකු නොහිටියේ මන්ද කියා. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය කොපමණ අවශ්‍ය ඇමති අංශයක්ද යන්න එයින්ම පෙනෙනවා. අපේ රටේ ආර්ථික තත්ත්වය සම්පූර්ණ යෙන්ම රැඳී තිබෙන්නේ වැවිලි කර්මාන්ත මත නම් වැවිලි කර්මාන්තයට විශේෂ තැනක් දී වැවිලි කර්මාන්ත ඇමති අංශයක් පිහිටුවීම ඉතාමත්ම හොඳයි; කාලෝචිතයි. එම නිසා මේ මුදල් ඉතා සන්තෝෂයෙන් "මනාල මහත්මයා"ට ප්‍රදානය කරනවා.

ඒ අතරම ඒ අලුත් ඇමතිවරයාගෙන් වැදගත් ප්‍රශ්න කිහිපයක් අහන්නට කැමතියි. මෑතදී මේ රජය පිහිටෙව්වාට පසුව කවදාවත් මතු නොවුණු ඉතාමත්ම වැදගත් ප්‍රශ්නයක් ඇති වී තිබෙනවා. සමහර විට ඒ ප්‍රශ්නය මීට පෙර වෙන පිළිවෙලකට මතු වන්නට ඇති. එහෙත් දැන් මතු වී තිබෙන පිළිවෙල ගැන හුඟක් දුරට කල්පනා කර බලන්නට ඕනෑ. එංගලන්තයේ අපේ තේ මිළදී ගන්න යුදෙව්කාරයන් වැදගත් කොටස්කරුවන් වශයෙන් සිටින සමාගම් තුනක් තේ වෙන්දේසියට තුන් වරක්ම නොපැමිණ එය වර්ජනය කර තේ මිළදී ගැනීම ප්‍රතික්ෂේප කර තිබෙන බව අපට ප්‍රවෘත්ති පත්‍ර මාර්ගයෙන් දැනගන්නට ලැබී තිබෙනවා. එය ඇත්තක්දැයි මා දන්නේ නෑ. කෙසේ වුවත් අපේ තේවල මිළ බැස තිබෙනවා. මෙය වැදගත් සිද්ධියක් හැටියට අප කවුරුත් කල්පනාවට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

[ආචාර්ය ඩබ්ලිව්. දහනායක]

ගන්න ඕනෑ. මේ ගැන මගේ අදහස් ප්‍රකාශ කරන්නට පෙර, තේ මිල බැසීම අද ඊයේ, මේ ආණ්ඩුව පත් වුණාට පසු ඇති වුණු දෙයක් නොවන බව මා කියන්නට ඕනෑ. 1968 දී අපේ තේ රාත්තලකට ලැබුණු සාමාන්‍ය මිල 1969 දී ශත 22 කින් අඩු වුණු බව තේ පාලක තැනගේ වාර්තා වෙන් අපට පෙනෙනවා.

"The average gross price of all teas for 1969 declined by 22 cents a pound as compared with the average price for the previous year."

මා මෙය සඳහන් කරන්නේ මේ රජයේම ප්‍රශ්නයක් හැටියට නොවෙයි. සාමාන්‍ය මිනිසුන් කියන හැටියට නම් මෙය අපේ රටේ කර්ම විපාකයක්. අප සදාකාලිකවම එංගලන්තයට යටත් වී වාල් වී සිටීම නිසා පළ දී තිබෙන කර්ම විපාකයක්. එංගලන්තය පමණක් නොව වෙනත් රටවලුත් අපේ තේ, පොල්, රබර් ආදිය සම්බන්ධයෙන් පමණක් නොව වෙනත් ද්‍රව්‍ය සම්බන්ධයෙනුත් වාල් ආර්ථික තත්ත්වයක් ඉදිරිපත් කරමින් අපේ ද්‍රව්‍යවල මිල බස්සනවා. මෙය අප සියලු දෙනාම දන්නා කරුණක්. අපේ ද්‍රව්‍යවල මිල මේ විධියට බහින නමුත් අප ගෙන්නවා ගන්නා ද්‍රව්‍යවල—අල් පෙනෙත්තියක පවා—මිල කවදාවත් අඩු වුණේ නැහැ. අමෙරිකාවෙන් හෝ වේවා, වෙනත් රටකින් හෝ වේවා, අප ගෙන්නවා ගන්නා කිසිම බඩුවක මිල අඩු නොවන ශතවර්ෂයකයි දැන් අප ජීවත් වන්නේ. එහෙත් අප විසින් පිටරට යවන ද්‍රව්‍යවල මිල අපේ මිත්‍රයන් වශයෙන් සිටින සුදු මිනිසුන් කට්ටියක් විසින් අඩු කරනවා. 1969 තේ රාත්තලක මිල 1968 මිලට වඩා ශත 22 කින් අඩු කර තිබෙනවා.

කථානායකතුමා

(சபாநாயகர் அவர்கள்)

(Mr. Speaker)

Order, please! The Sitting is suspended for half an hour. On resumption the Hon. Deputy Chairman of Committees will take the Chair.

පරිපූරක මුදල්

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ. භා. 4.30 ට කාරක සභා නියෝජ්‍ය සභාපති තුමාගේ [සේනපාල සමරසේකර මයා.] සභාපතිත්වයෙන් නැවත පත්වන ලදී.

இதன்படி அமர்வு பி. ப. 4.30 மணிவரை இடை நிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று. குழுக்களின் உப அக்கிராசனர் அவர்கள் [திரு. சேனபால சமரசேகர] தலைமை தாங்கினர்கள்.

Sitting accordingly suspended till 4.30 P.M. and then resumed, MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [MR. SENAPALA SAMARASEKERA] *in the Chair.*

ආචාර්ය ඩබ්ලිව්. දහනායක

(கலாநிதி டபிள்யு. தஹநாயக்க)

(Dr. W. Dahanayake)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තේ පානය සඳහා විසිර යාමට කලින් මා විස්තර කළේ අපේ රටට සිදු වී තිබෙන කර්ම විපාකයක් වශයෙන් හැඳින්විය හැකි දෙයක් ගැනයි. පිටරට යවන අපේ සියලුම බඩුවල මිල අඩු වන අතර පිටරට වලින් අප ගෙන්වා ගන්නා බඩුවල මිල වැඩි වෙනවා. මෙය එක් ද්‍රව්‍යයක් දෙකක් සම්බන්ධයෙන් පවතින තත්ත්වයක් නොවෙයි. ස්වාභාවික වශයෙන්ම සිදු වන දෙයක්. යුදෙව් සමාගම් 3 කින් මේ රජයට පහර වැදී තිබෙනවා. මෙවැනි දේවලට මුහුණ පාන්නට සිදු වුණේ මේ ආණ්ඩුවට පමණක්යයි අපට කියන්නට බෑ. 1969 දී තේ රාත්තලක සාමාන්‍ය මිල 1968 මිලට වඩා ශත 22 කින් අඩු වී තිබෙන බව මා කලින් පෙන්වා දුන්නා. මෙය මොකක් නිසා කවුරුන් විසින් කොහේදී කොහොම කරන දෙයක්ද යන ප්‍රශ්න අපේ හෘදය සාක්ෂියට අනුව විමසා බැලුවොත් දැන් තිබෙන වෙළඳ ක්‍රමයේ වරද නිසා මෙසේ සිදු වන බව අපට පෙනෙනවා.

යුදෙව්කාරයන් දැන් පහර ගහනවා; අමෙරිකන්කාරයන් ඊයේ පහර ගැසුවා; තවත් කට්ටියක් පෙරෙයිදා පහර ගැසුවා. මේ තිබෙන වෙළඳ ක්‍රමය වැරදියි. "ලන්ඩන් ටී ඔක්ෂන්" ක්‍රමය වැරදියි. සමහර විට වැරදි ආණ්ඩු ක්‍රමයක් එහි තිබෙන නිසා වෙන්න ඇති. ධනපති ක්‍රමය පිළිගන්නා රටවල් ව්‍යාපාර ගෙන යන්නේ ලාභ ලැබීමේ ක්‍රමය අනුවයි. තමන්ට ලාභ ලැබෙනවා නම් ද්‍රව්‍ය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නිපදවන තැනැත්තාට ප්‍රමාණවත් මුදලක් නොදුන්නත් කමක් නැත යන ප්‍රතිපත්තියයි ඔවුන් අනුගමනය කරන්නේ. කෙසෙ වෙතත් මේ ක්‍රමය තවම අත්හිටියේ නැහැ. නිදහසය කියා දෙයක් ලැබී අවුරුදු 23ක් පමණ ගත වුණත් මේ කර්ම විපාකය තවම නැති වුණේ නැහැ. මැයි 27 වන දින මේ රටේ ජනතාව වෙනත් දිහාවක් බැලුවා. එදින ජනතාව විසින් දෙන ලද තීන්දුව අනුව බලන විට ඔවුන් වෙන දිහාවක් බැලුවා වගෙයි කියන්නට පුළුවනි. [බාධාකිරීමක්] මා දන්නේ නැහැ පාර්ලිමේන්තුවේ වෙන දිහාවක් බලනවාද කියා. ජනතාව නම් බලා තිබෙන්නේ වෙන දිහාවක්. ඒ කුමන දිහාවක්ද? පසුගිය කාලයේ පැවති වැරදි අකටයුතු අසාධාරණ සියළු දේම නැති කර දමා රට දියුණු වන අළුත් ක්‍රමයක් සකස් කර ගත යුතු බව වටහා ගෙන ඔවුන් අමුතු දිහාවක් බලා තිබෙන බවයි පෙනෙන්නේ. ජනතාවගේ එම අදහස්වලට අනුව පරණ තාලයට අපේ තේ රබර් වෙළඳාම කරන්නට පුළුවන්දැයි මා අළුත් ඇමතිතුමාගෙන් අහන්නට කැමතියි. ඩ්‍රයිවර් අළුත් වුණත් පරණ කරත්තේ යන්න බැහැ. ඩ්‍රයිවර් අළුත් වුණා වාගේම කරත තය නැතිනම් වාහනයත් අළුත් කරන්නට ඕනෑ. පසු ගිය කාලයේ තිබුණු වාහනය නටබුන් කර දමා අළුත් වාහනයක් සකස් කර ගන්නට ඕනෑ. මා ඒ බව අළුත් වෙළඳ ඇමතිතුමාට කියනවා. ඉදිරියට යන ගමන සඳහා අළුත් වාහනයක් ගන්න. එය කරන්නේ කොහොමද? [බාධා කිරීමක්] ඔවැනි කථා හැමවිටම කියන්නට වුවමනා නැහැ. දැන් අපි ඉස්සරහ බලා ගෙන යමු. පස්ස බලා විට ගමන ප්‍රමාද වෙනවා නේද? එම නිසා ඉස්සරහ බලාගෙන යන්න.

අළුත් ඇමතිතුමාට මා කියා සිටිනවා, ලන්ඩන් ඔක්ෂන්ස් අතහැර දමන ලෙස. මේ වෙළඳ ගුණ්ඩුවලින් බේරෙන්නට එක කාලයක් එක්තරා යෝජනාවක් ඉදිරිපත් කර තිබුණා. ඉංග්‍රීසිකාරයෝ සදාකාලිකවම වෙළෙන්දන්ගේ ජාතියට අයිතියි— A nation of shopkeepers. ඒ අය හැම විටම බලන්නේ ලාභයයි. අනික් මිනිහා නැතිවෙලා ගියත් ඒ අය ලාභය බලනවා.

එක් කාලයක් යෝජනා කර තිබුණා ඇම්ස්ටර්ඩෑම් ඔක්ෂන්ස් ඇති කරන්නය කියා. මා යෝජනා කරන්නේ නැහැ, ඇම්ස්ටර්ඩෑම් ඔක්ෂන්ස් ඇති කරන්නය කියා. තමුන්නාන්සේලා සෝදිසි කර බලන්නට ඕනෑ. ඇම්ස්ටර්ඩෑම් තේ වෙන්දේසි ඇති කරනවාද මොස්කව්වල තේ වෙන්දේසි ඇති කරනවාද කියා සොයා බැලිය යුත්තේ තමුන්නාන්සේලායි. මා කියන්නේ පැරණි ක්‍රමය සංශෝධනය කර අළුත් ක්‍රමයක් ක්‍රියාවට යොදවන ලෙසයි. එංගලන්තය දෙසම බලාගෙන සිටීමෙන් අපට කවදාවත් සෙතක් සිදු වන්නේ නැහැ. අපි එංගලන්තය දෙස බලාගෙන සිටියා ඇති.

ටෙනිසන් එදිරිසූරිය මයා. (තිස්සමහාරාම)
(திரு. டெனிசன் எதிரிசூரிய—திசமாருமை)
(Mr. Tennyson Edirisuriya—Tissamaharama)
අමෙරිකාව?

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டபிள்யு. தஹநாயக்க)
(Dr. W. Dahanayake)
ඇමෙරිකාවයි එංගලන්තයයි දෙමස් සිනාලා හැටියට සලකන්නට පුළුවනි. ඇමෙරිකාව දිහා බලා ඉඳලත් වැඩක් නැහැ. තේ අංශයෙන් එංගලන්තය අපේ බෙල්ල මිරිකනවා වාගේම, රබර් අංශයෙන් ඇමෙරිකාව හැම විටම අපේ බෙල්ල මිරිකාගෙන සිටිනවා. ඒ දෙගොල්ලන්ගෙන්ම අපට යහපතක් සිදු වන්නේ නැහැ.

එදිරිසූරිය මයා.
(திரு. எதிரிசூரிய)
(Mr. Edirisuriya)
නැවතත් 1947 යුගයට ඇවිත් වගෙයි.

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டபிள்யு. தஹநாயக்க)
(Dr. W. Dahanayake)
පිටිපස්ස බලන්න බලන්න ඉස්සරහට ගමන ප්‍රමාද වන බව මා නැවතත් තමුන්නාන්සේට කියන්නට සතුටුයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

[ආචාර්ය ඩබ්ලිව්. දහනායක]

තේ පිළිබඳව දැනට පවත්නා මේ තත්ත්වයෙන් අප බේරෙන්නේ කොහොමද? අන්න ඒ ප්‍රශ්නයයි මා මතු කරන්නෙ. අලුත් ක්‍රමයක්—ඇම්ස්ටර්ඩෑම් වෙන් දේසි පොළක් වන්නට පුළුවනි, නැත්නම් මොස්කව් වෙන් දේසි පොළක් වන්නට පුළුවනි—ඇති කිරීමට දැන් කාලය පැමිණ තිබෙනවා. පිටරට වෙන් දේසි පොළවලට කැමති නැත්නම් කොළඹම සම්පූර්ණ යෙන්ම අළුත් වෙන් දේසි ක්‍රමයක් ඇති කරන්නට පුළුවනි. වෙන් දේසි ක්‍රමය නුසුදුසුයයි සිතනවා නම් එය සම්පූර්ණ යෙන්ම අත්හැර දමා වෙනත් ක්‍රමයක් ඇති කරන්නට පුළුවනි. ඒ කාරණය ගැන අවධානය යොමු කර පියවරක් ගන්නා මෙන් මම ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඊළඟට තේ මිල පහත බැසීමෙන් ඇති වී තිබෙන තත්ත්වය ගැන මේ ගරු සභාවේ අවධානය යොමු කරවන්නට මා අදහස් කරනවා. ඇත්ත වශයෙන්ම තේ මිල පහත බැසීම නිසා අපට විශාල විපතක් සිද්ධ වී තිබෙනවා. දැනටමත් ඒ විපතෙන් අප පෙළෙනවා. මේක ඉතාම වැදගත් අභ්‍යන්තර ප්‍රශ්නයක්. දකුණු පළාතේ තේ වතු හිමියන්—විශේෂයෙන්ම සුළු තේ වතු හිමියන්—අද කුමක් කළ යුතු දැයි කල්පනා කරනවා. තම වතුවල තේ උගුල්ලා දැමීම වඩා හොඳ නොවේදැයි ඔවුන් කල්පනා කරනවා. ඇමතිතුමා ඒ කාරණය ගැනත් සිත් යොමු කරන්නට ඕනෑ. දැන් වුවමනාවට වඩා තේ නිෂ්පාදනය වෙනවා නම්, පිටරට වෙළඳ පොළවලට ලංකාවේ නිෂ්පාදනය කරන සමහර තේ වල තත්ත්වය සහ වර්ගය හොඳ මදි නම්, දැනට සිටුවා තිබෙන සමහර තේ වර්ග නුසුදුසු නම්, ඒ ගැනත් යම් පියවරක් ගන්නට ඕනෑ. වුවමනා නැති තේ උගුල්ලා දමා ඒ වෙනුවට වෙනත් සුදුසු වගාවන් කරන්නට—අන්නාසි වවන්නට පුළුවනි; නැත්නම් වැල් දොඩම් වවන්නට පුළුවනි—රජයෙන් ආධාර දීමේ ක්‍රමයක් සකස් කරන්නට ඕනෑ. එවැනි වතුවල අක්කරයකට මේ පමණ මුදලක් ගෙවනවා යයි රජයට කියන්නට පුළුවනි. තේ මිල පහත බැසීම අනුව විපතට පත්ව සිටින කොටස බේරා

පරිපූරක මුදල්

ගැනීමට එවැනි වැඩ පිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කළ යුතු බව මා නැවතත් ඇමතිතුමාට පෙන්වා දෙන්නට සතුටුයි.

තවත් කාරණයක් තිබෙනවා. පසුගිය අවුරුදු තුන ඇතුළත ලෝකයේ ක්ෂණික තේ පාවිච්චිය වැඩි වී තිබෙනවා. ලෝකයේ ජනතාවට දැන් සියලුම වැඩ කටයුතු බොහොම ඉක්මනින් කිරීමට වුවමනා කරනවා. සාමාන්‍ය ක්‍රමයට තේ කෝප්පයක් සාදා ගන්නට වතුර උණු කරන්නට ඕනෑ. නමුත් ලෝකයේ ජනතාවට දැන් ඒ වතුර උණු කරන්නට ගත වන කාලයත් උණු කර තේ වක් කරන්නට ගත වන කාලයත් ඉතිරි කර ගන්නට වුවමනා කරනවා. එමනිසා දැන් ක්ෂණික තේවලට ජනතාවගේ හිත ඇදී ගොස් තිබෙනවා. පසුගිය කාලයේ තිබුණු ආණ්ඩුව මේ ක්ෂණික තේ ව්‍යාපාරය භාර දුන්නේ "Ceytea" නම් සීමා සහිත සමාගමටයි. ඒක ධනපති පිරිසකගෙන් යුත් සමාගමක්. ක්ෂණික තේ ව්‍යාපාරය ඒ අයට භාරදීම වැරදියයි මා කල්පනා කරනවා. ඇත්ත වශයෙන්ම ක්ෂණික තේ ව්‍යාපාරය කළ යුතුව තිබුණේ රජයෙන්. එමනිසා ඒ ව්‍යාපාරය වහාම රජයට ගෙන රජයෙන් කරගෙන යාමට විධිවිධාන සැලැස්වීමට දැන් අවස්ථාව පැමිණ තිබෙන බව මා ඇමතිතුමාට කියන්නට සතුටුයි. පසුගිය කාලය ඇතුළත ඒ සමාගම ක්ෂණික තේ ව්‍යාපාරය දියුණු කර නැහැ. ඔවුන් ඒ ව්‍යාපාරය දියුණු නොකළේ ඇයි? ඔවුනුත් ධනපති ක්‍රමයේ සුළු රෝදයක් නිසයි. ඒ අයට වුවමනා නැහැ මේ ව්‍යාපාරය දියුණු කරන්නට. දියුණු කරන්නට ඉදිරිපත් වුනත් ඒ අයගේ ධනපති සහෝදරයින් "මිත්‍රයා, මේක දියුණු කරන්නට එපා" යයි කියන විට ඒ අය පසු බසිනවා. එමනිසා මේ ව්‍යාපාරය රජයෙන්ම කරගෙන යන්නට ඕනෑ. ක්ෂණික තේ ව්‍යාපාරය රජයට ගෙන රජයෙන්ම කළොත් මේ රටේ තේ කර්මාන්තය හුගක් දුරටම නගා සිටුවන්නට ඉඩ කඩ සැලසෙන බව මා ඇමතිතුමාට පෙන්වා දෙන්නට සතුටුයි.

පැකට් කරන තේ පිළිබඳවත් මතක් කළයුතු කාරණයක් තිබෙනවා. පැකට් කළ තේ පිළිබඳව අද තිබෙන තත්ත්වය පිළි ගන්නේ කෙසේදැයි කියා මා ප්‍රශ්න කරනවා. ඔය "ටීබර්ස් ඩයිජෙස්ට්" වැනි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සඟරාවල පළවන ලොකු දැන්වීම් බලන්න. "බෘක් බොන්ඩ්" නැත්නම් "ලිප්ටන්ස්" තේ රාත්තලක් පිටරටවල විශාල මිලකට —රු. 10 කට පමණ—විකුණන බව ඒ දැන්වීම්වලින් පෙනෙනවා. නමුත් අපෙන් තේ ගන්නේ සාමාන්‍යයෙන් රාත්තලක් රුපියල් දෙකටයි. අපෙන් රුපියල් දෙකට ගන්නා තේ රාත්තලක් පිටරටවල රුපියල් දහයක පමණ මිලකට විකුණනවා. එහෙම නම් මේ ක්‍රමය වහාම නැති කර කෙලින්ම රජයෙන් මේ වෙළඳාම නොකරන්නේ මක්නිසාදැයි මා ප්‍රශ්න කරනවා. "මිඩ්ල්මන්" හෙවත් අතරමැදියා නැති කර දමා කෙලින්ම මේ වෙළඳාම කරන්නට විධිවිධාන සලස්වන්නයයි මා ඇමතිතුමාට කියනවා.

අද එංගලන්තයේ ලොකු විශාල කොම්පැනි නැත්නම් මැදින් සිටින අය නොවෙයි අපේ තේ වවන්නෙ. ඒ අය නොවෙයි අපේ තේ සාදන්නෙ. එංගලන්තයේ තිබෙන ඒ කොම්පැනි අපේ තේ අරගෙන විශාල ආදායමක් එකතු කර ගන්නවා. මෙහි යුක්තියක් තිබෙනවාද? එංගලන්තයේ සිටින කොම්පැනි කාරයින් විශාල අයුක්තියක්, අසාධාරණයක්, අපරාධයක් කරන බව එක්සත් ජාතීන්ගේ සංවිධානයට අපි කියන්න ඕනෑ. ඒ කොම්පැනිකාරයින් අපේ රටට විශාල අපරාධයක් කරනවා. තේවලට නියම මිලක් ලබා ගැනීම අපේ රටට අවශ්‍ය දෙයක්. අපේ තේ වවන්නේ එංගලන්තයේ සිටින කොම්පැනි කාරයින් නොවෙයි. අපේ තේ සාදන්නේ ඒ අය නොවෙයි. ඒ අය අපට නියම මිලක් නොගෙවා අපේ තේ බලෙන් මෙන් අරගෙන නැත්නම් උදුරාගෙන විශාල ආදායමක් ලබනවා. අපේ තේ ඉතා සුළු මිලකට අරගෙන ඒ අය කරන්නේ දෙවර්ගයක් එකට එකතු කිරීමයි. "Assam/Ceylon" ඒකත් විජ්ජාවක්. මා හිතන විධියට අපේ මේ උඩරට තේ මිශ්‍ර නොකර පාවිච්චි කරනවා නම් ඊටත් වඩා රස වෙන්න පුළුවනි.

එංගලන්තයේ කොම්පැනිකාරයින් කරන ලොකුම දෙය තේ වර්ග එකතු කිරීමයි. Blending කියන ඔපරේෂන් එක කරනවා. එසේ කොට රුපියල් 8 ක් ගන්නා අතර වවන්නන්ට දෙන්නේ රුපියල් දෙකයි. මොකක්ද මෙහි තේරුම? ඒ නිසා

තේ විකිණීම සම්බන්ධයෙන් අලුත් ක්‍රම අපි යොදන්නට ඕනෑ. අලුත් ක්‍රම දෙකක් දැන් මතක් කළා. එනම් පැකට් තේ සෑදීම සහ ක්ෂණික තේ සෑදීමයි. ඒ දෙකම රජය විසින්ම කරන්න ඕනෑ. ඒ කටයුත්ත කොම්පැනිකාරයින්ට දෙන්න එපා. එසේ දුන්නොත් ඒ අය කරන්නේ උඩින් හොඳ මුහුණක් පෙන්වා ගෙන යටින් එය නැති කිරීමයි. ඒ නිසා තේ පැකට් කිරීම සහ ක්ෂණික තේ සෑදීම රජය විසින්ම කරන්න ඕනෑ. අවශ්‍ය නැති තේ වැවෙන පළාත්වලින් ඒ තේ අස්කර එම අක්කර ප්‍රමාණය වෙනත් වගාවක් සඳහා යෙදවිය යුතුයි.

හතරවෙනි ක්‍රමය නම් අලුත් වෙළඳ පොලවල් සොයා ගැනීමයි. මා සිතන හැටියට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ලෝකයේ තිබෙන රටවලින් සියයට 90 ක්ම තවම තේ පානයට පුරුදු වී නැහැ. ඒ ගැනවත් අපි තවම කල්පනා කර නැහැ. දැන් අමෙරිකාවේ කොකාකෝලා කියන අසනීප බෝ කරන බීමක් පාවිච්චි කරනවා. කොකා කෝලා කියන අසනීප බෝ කරන බීමක් තමන්ගේ ජාතික බීම හැටියට ඒ අය සොයා ගෙන තිබෙනවා. ඒ වගේම මා අසා තිබෙනවා දැන් අමෙරිකාවේ තරුණ පරම්පරාව විශෙෂයෙන්ම මරිජුවානා කියන මත් වෙන බීමට පුරුදු වී සිටින බව.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)
අපේ හැලි අරක්කු වගෙයි.

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டபிள்யு. தஹநாயக்க)
(Dr. W. Dahanayake)
අපට තිබෙන්නෙ හැලි අරක්කු නොවෙයි, ගහේ බඩු. හැලි අරක්කුවල විෂ තිබෙන්න පුළුවනි. නමුත් අපේ ගහේ බඩු තිබෙනවා නම් ඒවායින් අසනීප ඇතිවෙන්නෙ නැහැ. කොකාකෝලා, මරිජුවානා කියන දේවල් පානය කිරීම නිසා අමෙරිකාවේ විශාල භයානක තත්ත්වයක් ඇති වී තිබෙනවා. ඒ රටේ සෞඛ්‍ය තත්ත්වය ගැන මැන බලන, පරීක්ෂා කරන අය අසනවා මේ මරිජුවානා පුරුද්දෙන් ජනතාව බේරා ගන්නේ කොහොමද කියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය ඩබ්ලිව්. දහනායක]

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ පරීක්ෂණ අංශයක් ඇමෙරිකාවේ පිහිටුවන්න ඕනෑ. අපේ දූතයන් අමෙරිකාවට යවා සටන් පාඨයක් ඇති කරන්න ඕනෑ. "Drink more tea to get rid of marijuana" කියා ප්‍රචාරයක් කරන්න ඕනෑ. තමුන්නාන්සේලා මේ ව්‍යාපාරය—වෙන රටවලට තේ පුරුදු කිරීමේ ව්‍යාපාරය—මෙපමණ කලක් මොන විධියටද ගෙන ගොස් තිබෙන්නේ කියා මා තමුන්නාන්සේගෙන් අහනවා. ප්‍රචාරක කටයුතු පිළිබඳ මධ්‍යස්ථානයක් ලන්ඩන් නුවර තිබෙනවා. ඒ මධ්‍යස්ථානයෙන් නියම විධියේ කිසිවක් කෙරෙන්නේ නැහැ. නිකම් පින්තූර ටිකක් පෙන්වා, අරව මේව ටිකක් පෙන්වා නිශ්ශබ්දව ඉන්නවා. මොනවටද ඒ මධ්‍යස්ථානය ලන්ඩන් නුවර පිහිටුවා තිබෙන්නෙ? තේ නොබොන වෙනත් රටවල තේ මධ්‍යස්ථාන පිහිටුවන්න පියවර ගත යුතුව තිබෙනවා. අද වෙනි දවසේ තේ නොබොන රටවල් සියයට 90 ක් පමණ තිබෙනවා. එම නිසා ඒ රටවල තේ මධ්‍යස්ථාන පිහිටුවා ප්‍රචාරක කටයුතු ගෙන යන්න ඕනෑ.

මම එක්තරා සෞඛ්‍ය වාර්තාවක් කියෙව්වා. සෞඛ්‍ය වාර්තා ගැන බලන විට නොයෙක් නොයෙක් විධියේ වාර්තා තිබෙනවා. එහෙත් මා කියෙව්ව ඒ සෞඛ්‍ය වාර්තාව අනුව තේ බීම හෘදයාබාධවලට විශෙෂයෙන් ගුණදායක බව පැහැදිලි වී තිබෙනවා.

ගරු රත්න දේශප්‍රිය සේනානායක (වැඩ බලන ක්‍රම සම්පාදන හා රැකීරක්ෂා ඇමති)

(கௌரவ ரத்ன தேஷப்பிரிய சேனநாயக்க —பதில் திட்டமிடல், வேலைவாய்ப்பு அமைச்சர்)

(The Hon. Ratna Deshapriya Senanayake—Acting Minister of Planning and Employment)

නිකම් තේ.

ආචාර්ය ඩබ්ලිව්. දහනායක

(கலாநிதி டபிள்யு. தஹநாயக்க)

(Dr. W. Dahanayake)

සත්තකින්ම නියෝජ්‍ය සභාපතිතුමනි, තව සැලකිය යුතු කාරණයක් මා තමුන්නාන්සේට කියන්න කැමතියි. යම් කිසි රටක නිෂ්පාදනය කෙරෙන යම් කිසි ද්‍රව්‍යයක් ගැන ඒ විධියේ සතුටුදායක සෞඛ්‍ය වාර්තාවක් තිබෙනවා නම්, එම වාර්තාව පාවිච්චි කරමින් එම නිෂ්පාදන ද්‍රව්‍ය වෙළඳාම දියුණු තත්ත්වයකට පත් කර ගැනීමයි ඒ රට විසින් ප්‍රධාන වශයෙන්ම කළ යුතුව තිබෙන්නෙ. එම නිසා එම සෞඛ්‍ය වාර්තාව පාවිච්චි කරමින්, අපේ තේ ලෝකයේ වෙනත් රටවලට ඉදිරිපත් කර, "මෙන්න හෘදයාබාධවලට විශෙෂ ගුණයක් ඇති ලංකා තේ" කියා අපේ ඒ නිෂ්පාදන ද්‍රව්‍යයට සැහෙන වෙළඳ පොළක් ලබා ගන්න ඕනෑ. ඊළඟට ඒ රටවල—අලුත් රටවල—තේ මධ්‍යස්ථාන පිහිටුවා ප්‍රචාරක අංශය දියුණු කරන්න ඕනෑ.

නියෝජ්‍ය සභාපතිතුමනි, අපට ගහලා තිබෙන හෙන්නේ අපි හැම තිස්සේම අපේ ඇස් දෙක ඉංගිරිසි කාරයන් දෙස, එංගලන්තය දෙස යොමු කරගෙන සිටීමයි. එම නිසා තමුන්නාන්සේලාට ලැබී තිබෙන මේ වරම අනුව එංගලන්තය දෙස යොමු කරගෙන තිබෙන ඇස් දෙක ඉන් ටිකක් ඉවත් කර අන් රටවල් දෙසත් යොමු කරන්නය කියා මා ඉල්ලනවා. ඒ සඳහා අලුත් රටවල් ඕනෑ තරම් තිබෙනවා.

මා සඳහන් කළ ඒ හතර මාගීය මම නැවතත් මතක් කර දෙන්නම්. පළමු වෙනි සහ දෙවනි මාගී නම් ක්ෂණික තේ කර්මාන්තය සහ පැකට් තේ කර්මාන්තය රජයට ගැනීමයි. තුන්වෙනි මාගීය, අවශ්‍ය නැති, ලාභ මදි, නුසුදුසු ඉඩම්වල තේ වෙනුවට අන්නාසි, පැෂන් fපෑට් වැනි වෙනත් විගාවන් කිරීමයි. හතරවෙනි මාගීය ලෝකයේ වෙනත් රටවල තේ මධ්‍යස්ථාන පිහිටුවා අලුත් වෙළඳ පොළවල් ලබා ගැනීමයි.

ඊළඟට මා තමුන්නාන්සේට මතක් කර දුන්නා, වාහනය සම්පූර්ණයෙන්ම වෙනස් කළ යුතු බව. රියැදුරා වෙනස් කළාට මදි; වාහනය සම්පූර්ණයෙන්ම වෙනස් කරන්න ඕනෑ. මෙම තේ ජාවාරම හා රබර් ජාවාරම මුල සිට අගදක්වා —"ඒ" සිට "ඉසෙඩ්" දක්වා— තිබෙන්නේ අපේ අයගේ අතේ නොවෙයි. ඇයි අපේ අයගේ අතට ඒවා ගන්නෙ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නැත්තෙ? මෙම ඇමතිතුමා වැවිලි කර්මාන්ත ඇමතිතුමා වුණාම මම හිතුවා එතුමා තේ සහ රබර් වතුවත් ජන සතු කරාවි කියා. මුළු රටම ඒක බලා පොරොත්තු වුණා. මා හිතනවා මැයි 27 වෙනිදාට පසුව ඒ සියල්ලම ජනසතු කරාවි කියා රට බලාපොරොත්තුවෙන් සිටි බව තමුන්නාන්සේ පිළිගන්නවා ඇත කියා. තවමත් බලාපොරොත්තුවෙන් ඉන්නවා. තේ වතු සහ රබර් වතු ජන සතු කරන්න ඕනෑය කියන එකයි සාමාන්‍ය පිළිගැනීම.

තේ සහ රබර් වතු ජනසතු කිරීම සාධාරණය ඉෂ්ට කිරීමක් පමණක් නොවෙයි; ඒක අපේ අයිතියක්. ඒ අයිතිය අනුව එසේ කරන්නැයි අප ඉල්ලනවා. තේ සහ රබර් වතු ජනසතු කරන්නැයි අපේ උරුමයක් හැටියට අප ඉල්ලා සිටිනවා. ඇත්තෙන්ම ඒක අපේ ජන්ම උරුමයක්. එදා නිබුණු පරදේශක්කාර රජය මේ රටේ වැසියන්ට උත්පත්ති යෙන් ලැබුණු ඉඩකඩම් මුඩුබිම් පනතේ මාර්ගයෙන් එක රැයින් කොල්ලකා ගත්තා. එක රැයින් අක්කර දස දහස් ගණනක් වූ වැසියන්ගේ ඉඩම් කොල්ල කාගෙන ඊට පසුව සිලිමට දෙකට—සිංදුව ටත් නොව හුරුවමට—ඒවා සුද්දන්ට දුන්නා. මේ වාගේ කොල්ලකෑමක් අපේ ඉතිහාසයේ තවත් නිබුණේ නැහැ. ඒ සුද්දන් ඒ ඉඩම්වල තේ වැව්වා; රබර් වැව්වා. ඒ තේ සහ රබර් වතු වෙනුවෙන් වියදම් වූ මුදල මෙන් දහ විසි ගුණයකටත් වැඩි ලාභයක් දැන් ඔවුන් ලබා ගෙන නිබෙනවා. තත්ත්වය එසේ නම් වන්දි නොගෙවා ඒ වතු ජනසතු කිරීම වැරදි යයි දැන් සමහරුන් කියන්නේ කොහොමද?

ගරු ආර්. එස්. පෙරේරා
(கௌரவ ஆர். எஸ். பெரேரா)
(The Hon. R. S. Perera)
1965 දී ඔය සිංදුව නිබුණේ නැහැ.

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டபிள்யு. தஹநாயக்க)
(Dr. W. Dahanayake)
ඒ නිසා නොවෙන්නම් අද ඒ සිංදුව ගහන්නේ.

ගරු ආර්. එස්. පෙරේරා
(கௌரவ ஆர். எஸ். பெரேரா)
(The Hon. R. S. Perera)
අද මොලේ පැදිලා.

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டபிள்யு. தஹநாயக்க)
(Dr. W. Dahanayake)
ඒක ඇත්තයි. මේ වතු ජනසතු නොකරන්නේ මන්දැයි මා අහනවා. 1965 දී බලයට පත් වූ ආණ්ඩුව වතු ජනසතු නොකළ නිසාද මේ ආණ්ඩුවත් ඒවා ජනසතු නොකරන්නේ? වතු ජනසතු කරනවා නම් ඒවාට වන්දි නොගෙවිය යුතුයි. වන්දි ගෙවීම සාධාරණ නැහැ. අලාභයක් සිදු වීම නිසා ගෙවන ගෙවීමටයි, වන්දිය යයි කියන්නේ. "වන්දි ගෙවනවා" යන්නෙහි තේරුම කුමක්දැයි ශබ්ද කෝෂයක් පෙරළා බලන්න. වන්දි ගෙවනවා නම් ගෙවිය යුත්තේ ඉඩම් ටික ගැනීම නිසා අලාභ ලැබූ අපේ රටේ ජනතාවටයි. එතකොට සුදු කොම්පැනිවලින් අපේ රටේ ජනතාව වන්දි ඉල්ලන්නට ඕනෑ.

එදිරිසූරිය මයා.
(திரு. எதிரிசூரிய)
(Mr. Edirisuriya)
ඇයි තෙල් කොම්පැනිවලට ලක්ෂ 551 ක් ගෙව්වේ? එදා ඔබතුමා වැරදි කළා නේද?

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டபிள்யு. தஹநாயக்க)
(Dr. W. Dahanayake)
වැරදි කළ බව මා පිළිගන්නවා. එදා අප වැරදි කළ නිසා තමයි, අපව පන්නා දමන්නට යෙදුණේ. ජනතාව එදා බලයේ සිටි උදවිය අන්ත පරාජයකට පත් කළා පමණක් නොව නැවත කවදාවත් ඔළුව උස්සන්නට බැරි විධියට පාගා දැම්මා. එදා බලයේ සිටි ආණ්ඩුව වැරදි කළ නිසා ඊට සුදුසු දඩුවම් ලැබුණා. මේ ආණ්ඩුවේ සිටින තමුන්නාන්සේලාට මා කියන්නේ මේක යි. වන්දි ගෙවිය යුත්තේ ලංකාවේ ජනතාවට බව, වන්දි නොගෙවා වතු ජනසතු කළ නොහැකි යයි කියන අයට කියන්න. වන්දි ගෙවිය යුත්තේ අලාභ ලැබූ අයටයි. ඒ මිස සුදු කොම්පැනිවලට නොවෙයි. ඉතින් වන්දි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය ඩබ්ලිව්. දහනායක]

නොගෙවා වතු ජනසතු කිරීම ඉතාමත්ම උතුම් ජාතික කර්තව්‍යයක් හෙයින් අපේ වැවිලි කර්මාන්ත ඇමතිතුමා ලබන වර්ෂයේ දී ඒ ජාතික කර්තව්‍යය ඉෂ්ට කරනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා. ඊට කලින් කළ යුතු තවත් දෙයක් තිබෙනවා. සමහර වතු අයිතිකාරයින් නොනිසි විධියට —මේ රජය පිහිටෙව්වාට පසුව හෝ ඊට පෙර සිට—තමන්ගේ වතුවල වැඩ කරවන්නේ නැතිව වතුවල වැඩ කඩාකප්පල් කර තිබෙනවා. ඒ සම්බන්ධයෙන් රජය කරන්නේ කුමක්ද? එවැනි වතු තිබෙනවා නම් හෙට අනිද්දාම ඒවා රජයට ගන්න ඕනෑ යයි මා කියනවා. ගාලූ දිස්ත්‍රික්කයේ එවැනි තත්ත්වයේ තිබෙන වතු තුනක් තිබෙනවා. ඔලිම්පස් ගෲප්, සිරිමෙවන් ගෲප් හා පිලිගොඩවැලි ඒ වතු තුනයි.

ගරු නීල් ද අල්විස්
(கௌரவ நீல் த அல்விஸ்)
(The Hon. Neal de Alwis)

තුන්දෙනාම යූ. එන්. පී. කාරයෝ.

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டபிள்யு. தஹநாயக்க)
(Dr. W. Dahanayake)

සිරිමෙවන් වත්ත එච්. ඩී. ගුණවර්ධන මහත්මයාගේ. පිලගොඩවැලි වත්ත බෝමන් විත්ටර් මහත්මයාගේ. ඔලිම්පස් වත්ත ප්‍රැන්සිස් අමරසූරිය මහත්මයාගේ.

ගරු නීල් ද අල්විස්
(கௌரவ நீல் த அல்விஸ்)
(The Hon. Neal de Alwis)

ඔක්කොම දරුණු යූ. එන්. පී. කාරයෝ.

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டபிள்யு. தஹநாயக்க)
(Dr. W. Dahanayake)

දැන් ඒ වතු තුනේම වැඩ කරන්නේ නැහැ.

ගරු රත්න දේශප්‍රිය සේනානායක
(கௌரவ ரத்ன தேஷபிரிய சேனநாயக்க)
(The Hon. Ratna Deshapriya Senanayake)

ඇයි ඒ?

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டபிள்யு. தஹநாயக்க)
(Dr. W. Dahanayake)

ඔවුන් කඩාකප්පල්කාරී ව්‍යාපාරයක් ගෙනයනවා. ඒ නිසා වහාම ඒ වතු රජයට අරගෙන වැඩ කරගෙන යන්නට ඕනෑ. අනික් වතු ගන්නටත් කලින් එවැනි වතු ගන්නට ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තමුන්නාන්සේත් දන්නා කරුණක් තිබෙනවා. මැතිවරණ කාලයේ දීත් බද්දේගම ආසනයේ ඔය වතු තුන ගැන ප්‍රශ්නය පැන නැඟුණා. ඒවා විශාල වතු. එහෙත් දැන් වැඩ කරන්නේ නැහැ. ඒ නිසා ඇයි ඒවා රජයට නොගන්නේ?

ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.
(திரு. டென்சில் பர்ணந்து)
(Mr. Denzil Fernando)

ඒ වතු තුන ගන්න කියන්නෙත් වන්දි නැතුවද?

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டபிள்யு. தஹநாயக்க)
(Dr. W. Dahanayake)

ගණන් බලා අලාභයක් වෙනවා නම් වන්දි ගෙවනවා; නැත්නම් ගෙවන්න එපා. සුදු මහත්වරුන්ගේ වතු වන්දියක් නැතුව ගන්නය කීවේ ඔවුන්ට අලාභයක් නැති නිසයි. අලාභයක් තිබෙනවාද නැද්ද යන්න තීරණය කිරීම ගරු ඇමතිතුමාට අයිති වැඩක්. මේ ප්‍රශ්නය නියම විධියට විසඳන්නට නම් "අ" යන්නෙන් පටන් ගෙන අන්තිම අකුරටම යන්න ඕනෑ. "අ" යන්න වතු ජනසතු කිරීමයි. "ආ" යන්න fපැක්ටරි. fපැක්ටරි ගන්නට බැරි ඇයි? මට මතකයි, මා ලංකා සම සමාජ පක්ෂයේ සිටින කාලයේ "fපැක්ටරි ගනිමු" කියලයි කීවේ. කෝ දැන් ඒ කතාව? fපැක්ටරි නොගන්නේ ඇයි? fපැක්ටරිවල කෙරෙන වැඩ අනුව නේද තේවල "ක්වොලිටි" එක තීරණය වන්නේ? හොඳ තේ හදන්නට පුළුවන් වන්නේ fපැක්ටරිවල තිබෙන වැඩ පිළිවෙළ අනුව නේද? එසේම fපැක්ටරිවල වැඩ කරන අයත් අවශ්‍යයෙන්ම රජයේ සේවකයින් වන්නට ඕනෑ. ඒ නිසා fපැක්ටරි රජයට ගැනීම ඉතාමත්ම අවශ්‍යයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඊළඟ කාරණය මෙයයි: සුළු වතු අයිතිකාරයින් සියයට 50 ක් පමණ සිටිනවා. අක්කර 10 න් අඩු වතු සියයට 17 ක් තිබෙන අතර අක්කර දහයට වැඩි 100 ට අඩු වතු සියයට 10 ක් තිබෙනවා. ඒ අනුව අක්කර සියයට අඩු සුළු වතු සියයට 27 ක් තිබෙනවා. ඒ අක්කර ගණන් බලන්න. ඒ අයට තිබෙන තත්ත්වය කුමක්ද? මේ සුළු තේ වතු අයිතිකාරයින්ගේ තත්ත්වය ඉතාමත්ම අසතුටුදායකයි. ඒ වචනයට වඩා සැර වචනයක් පාවිච්චි කරන්නයි මම හිතන්නේ. දැන් අවුරුදු ගණනාවක සිට ඒ අය හිඟමනට පත් වී සිටිනවා. හුඟ දෙනෙක් හිතනවා, අක්කර 80 ක තේ වත්තක් අයිතිකාරයා පොහොය තෙක්ය කියා. එහෙත් ඔවුන් පත් වී සිටින්නේ "ලෝකෙට පරකාසේ-ගෙදරට මරගාතේ" යන තත්ත්වයටයි. අක්කර 80 ක තේ වතු හිමියන් ලෙස ඔවුන් සැලකුණත්, ණයතුරුස් ආදිය ගෙවා දැමීම සඳහා තමන්ගේ බඩුබාහිරාදිය පවා උකස් කර ජීවත් වන්නට ඔවුන්ට සිදු වී තිබෙනවා. එම නිසා අප කල්පනාවට ගන්නට ඕනෑ, සියයට 27 ක් පමණ වන සුළු තේ වතු හිමියන් මුහුණ පා සිටින අමාරු තත්ත්වය.

ඔවුන් එවැනි අමාරු තත්ත්වයකට වැටී සිටින්නේ මොන හේතුවක් නිසාද? ඔවුන්ගේ තේ දළුවලට fපැක්ටරි හිමියන්ගෙන් ලැබෙන්නේ, ඉතා සුළු මුදලකුයි. සුළු තේ වතු හිමියන්ට සහනයක් සැලසීමේ අදහසින් පසුගිය රජය "සාධාරණ මිල ක්‍රමයක්" ඇති කළ බව මා දන්නවා.

ගරු නීල් ද අල්විස්
(கௌரவ கெனமன்)
(The Hon. Neal de Alwis)

එය ඇති කළේ ජාවාරම්කාරයන්ට අවස්ථාවක් දෙන්නටයි.

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டபிள்யு. தஹநாயக்க)
(Dr. W. Dahanayake)

වැඩබලන ඇමතිතුමා කියන්නේ ඇත්තක්. ඒ ක්‍රමයෙන් වාසි ගත්තේ ලොකු තේ වතු අයිතිකාරයනුයි. එම නිසා, සියයට 27 ක් වන සුළු තේ වතු අයිතිකාරයන් ආරක්ෂා කිරීම සඳහා රජය වහාම වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නට ඕනෑ. fපැක්ටරි ජනසතු නොකර වෙන මොන ක්‍රියා මාර්ගයක් යෙදුවත් ලොකු තේ වතු හිමි fපැක්ටරිකාරයන්ගෙන් සුළු තේ වතු හිමියන්ට සහනයක් ලැබේයයි විශ්වාස කරන්නට නම් එපා. එම නිසා, සුළු තේ වතු හිමියන්ට සහනය සැලසිය හැකි එකම ක්‍රමය ලොකු තේ වතු හිමියන්ට අයිති තේ fපැක්ටරි ජනසතු කිරීම බව මා කියනවා.

එසේ fපැක්ටරි ජනසතු කළ විට රජයට පුළුවන්කම ලැබෙනවා, සුළු තේ වතු හිමියන්ගේ තේ දළු සඳහා සාධාරණ මිලක් ගෙවන්නට. "Rebate, subsidy" යන සෑම ක්‍රමයක්ම ගිහින් වැටෙන්නේ එකම තැනකටයි. එම නිසා, ඒ මොන ක්‍රමය ක්‍රියාවේ යෙදුණත් සිදු වන්නේ ලොකු තේ වතු හිමියන් හෙවත් fපැක්ටරි අයිතිකාරයන් තව තවත් තරවීමයි; සුළු තේ වතු හිමියන් එන්න එන්නම ප්‍රජාතයට වැටීමයි. මේ තත්ත්වය යටතේ විශේෂයෙන් දකුණු පළාතේ ඉතාමත් අසතුටුදායක, කණගාටුදායක තත්ත්වයක් ඇති වී තිබෙනවා.

එම නිසා මේ ප්‍රශ්නය විසඳීම සඳහා නිර්භීත, එඩිතර පියවරක් ගන්නා ලෙස වැවිලි කර්මාන්ත ඇමතිතුමාගෙන් මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා. ශල්‍ය කර්මයක් නොකොට මේ අසාධ්‍ය ලෙඩය සුව කරන්නට පුළුවන්කමක් නැහැ. දැනට ක්‍රියාවේ යෙදවෙන ක්‍රමවල ඇති නරක කොටස් ඉවත් කොට, අවශ්‍ය හොඳ කොටස් ඇතුළු කොට අළුත් ක්‍රමයක් ක්‍රියාවේ යෙදවීමෙන් පමණයි, මේ ප්‍රශ්නය සාර්ථක අන්දමට නිරාකරණය කර ගන්නට පුළුවන්කම ලැබෙන්නේ. එසේ නොකොට දැන් තිබෙන ක්‍රමවලටම පැලැස්තර දමන්නට ගියොත්, පැලැස්තර දමන ආණ්ඩුවක් යනුවෙන් චෝදනා අහන්නට සිදු වීම වළක්වන්නට බැහැ.

අපේ ජාතියේ ඉරණම රැඳී ඇත්තේ, රබර්, පොල් යන වැවිලි කර්මාන්ත මතයි. එම නිසා මේ ප්‍රශ්නයේදී එඩිතර පියවරක් ගන්නට වැවිලි කර්මාන්ත

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය ඩබ්ලිව්. දහනායක]

ඇමතිතුමාට සිදු වෙනවා. ඒජන්සි හවුසස් රජයට ගන්නට බැරි ඇයි? සමහි පෙර මුණු මැතිවරණ ප්‍රකාශනයේ සඳහන් වෙනවා, "ඒජන්සි හවුසස්" පාලනය කරනවාය කියා. මේ රටේ නොයෙකුත් විධියේ පාලන ක්‍රම ක්‍රියාවේ යෙදී තිබෙනවා. ඒ හැම පාලන ක්‍රමයකින්ම සිදු වුණේ හොරුන් තව තවත් තර වීමයි. ඒජන්සි හවුසස් කොන්ට්‍රෝල් කරන්නට ගියාම හොරු තර වන නිසා කළ හැකි එකම ප්‍රතිකර්මය ඒජන්සි හවුසස් රජය අතට ගැනීම මිස වෙන දෙයක් නොවෙයි.

අලුත් ඇමතිතුමා ගැන මේ රටේ ජනතාව තුළ ලොකු බලාපොරොත්තුවක් තිබෙන බව මම කියනවා. පක්ෂ ක්‍රමයක් අනුව නොවෙයි මම මෙය කියන්නේ. ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා නැමති නාමයට මේ රටේ සියලු දෙනාම ගරු කරනවා. ඉතාමත් හොඳ, වැදගත්, කල්පනාවක් තිබෙන, හොඳ මොළයක් තිබෙන කෙනෙකු හැටියට එතුමාගේ නම අද මේ රටේ ජනතාව සඳහන් කරන නිසා අද මුළු රටම එතුමා කෙරෙහි විශාල බලාපොරොත්තුවක් ඇති කරගෙනයි සිටින්නේ. අපේ ඉරණම විසඳීමට, අපේ රටේ වැවිලි කම්හල් නිසි අන්දමට නඟා සිටුවීමට, අපට මෙතෙක් අපේ අයිතිවාසිකම් නොදුන්, අපේ ආණ්ඩු හිඟමනට පත් කළ, ඉදිරියටත් එසේම අපේ රටේ ආණ්ඩු හිඟමනට පත් කරන්නට පුළුවන්කමක් තිබෙන වැවිලි කර්මාන්තය එයින් මුදා නිසි පරිදි නඟා සිටුවීමට, අපේ තේ, පොල් සහ රබර් කර්මාන්තයන් දියුණු කිරීමට අවශ්‍ය ශක්තිය අපේ අලුත් ඇමතිතුමාට තිබෙන බවට විශේෂ විශ්වාසයක් ජනතාව තුළ තිබෙනවා. ඒ නිසා ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේගේ "ගෝල් ඩන් බිරේන්" හෙවත් රත්රන් මොළය පාවිච්චි කර මේ රටට වැඩදායක ලෙස අපේ තේ, රබර් සහ පොල් වැවිලි කර්මාන්තවලට අලුතින් නව ජීවනයක් දෙන්නැයි මම තමුන්නාන්සේගෙන් ඉල්ලනවා. මෙය පක්ෂයක් අනුව කරන ඉල්ලීමක් නොවෙයි. අපේ රටේ වතුවල සිටින ජනතාව පමණක් කරන ඉල්ලීමකුත් නොවෙයි. අපේ රටේ වතුවල සිටින කම්කරුවන් පමණක් කරන ඉල්ලීමකුත් නොවෙයි. රටේ සිටින සියලු දෙනාම මෙම ඉල්ලීම කරනවා.

පසුගිය කාලයේ ක්‍රියාත්මක වෙමින් තිබුණු වැරදි ක්‍රම නැති කර දමා සම්පූර්ණයෙන්ම අලුත් ක්‍රමයක් දී අපට අලුත් ආර්ථික තත්ත්වයක් ලබා දීමට තමුන්නාන්සේට ශක්තියක් තිබෙනවා. වෙනත් අයට වඩා ලොකු ශක්තියක් තමුන්නාන්සේට තිබෙන නිසා තමුන්නාන්සේට ලැබුණු මේ වරම නියම විධියට පාවිච්චි කරමින් අපේ ප්‍රශ්න නිසි විධියට විසඳුවාම තමුන්නාන්සේගේ නම අපේ ලංකාවේ සිටි ඉතාමත් ශ්‍රේෂ්ඨ ඇමතිවරයා හැටියට ඉතිහාසගත වනු ඇත යනු මගේ පෞද්ගලික විශ්වාසයයි. ඒ විශ්වාසය පැහැදිලි ලෙස ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

අ. භා. 5.11

ජේ. ඩී. වීරසේකර මයා. (කොත්මලේ)
(திரு. ஜே. டீ. வீரசேகர—கொத்மலே)
(Mr. J. D. Weerasekera—Kotmale)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වැය ශීර්ෂයට අපේ අනුමැතිය දෙන්නේ ඉතාමත් සන්තෝෂයෙනුයි. මෙවැනි ඇමති පදවියක් ඇති කර එම පදවිය සඳහා මේ තරම් දක්ෂ කෙනෙකු, මුළු ලංකාවෙන්ම සොයා ගත හැකි ඉතාමත් දක්ෂ කෙනෙකු, පත් කර ගැනීම ගැන අපේ ගරු අගමැතිනියටත් මුළු ආණ්ඩුවටත් මම මේ අවස්ථාවේ ස්තුතිවන්ත වෙනවා. එතුමා මේ අලුත් අමාත්‍යාංශය භාරව වැඩ කරන්නට ඉදිරි පත් වීම අපේ භාග්‍යයක් හැටියට මම සලකනවා.

වැවිලි කර්මාන්තය අපේ රටට ඉතාමත් වැදගත් කර්මාන්තයක් බව අවිවාදයෙන් පිළිගත යුතුව තිබෙනවා. විශේෂයෙන් අපේ රටේ ආර්ථික පදනම රඳා තිබෙන්නේ තේ, රබර් සහ පොල් කර්මාන්ත උඩයි. අපට වුවමනා කරන විදේශ විනිමය මෙන්ම දේශීය වස්තුවත් අපට ලැබෙන්නේ මූලික වශයෙන්ම මේ කෘෂිකර්ම භාණ්ඩවලින් බව අපට පැහැදිලියි. ඒ නිසා විශේෂයෙන්ම තේ කර්මාන්තය ගැන මූලික්ම සඳහන් කරන්නට මම කැමතියි. එය ආරක්ෂා කිරීම රජය සතු පරම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යුතුකමකැයි මම කියනවා. තේ කර්මාන්තයේ ඉතිහාසය දෙස බලන විට පැහැදිලි වම කැපී පෙනෙන ලක්ෂණයක් නම් එය යම්කිසි පිරිසකට සීමා කර තිබුණු කම්කාරයක් බවයි. ඒ වාගේම තේ වෙළඳාම් කිරීමත් තේ නිෂ්පාදනය කිරීමත් ඒ හා සම්බන්ධ වෙනත් දේත් ඒ උදවිය විශේෂ බලතල උඩ කරගෙන ගිය බව—පැලනය කර තිබෙන බව—අපට පෙනෙනවා. එහෙත් දැන් අපට ඒ තත්ත්වය ගැන සන්තෝෂ වන්නට බැහැ. මෙපමණ කාලයක් තිස්සේ විදේශියයන්ට ඕනෑ කළ විධියටයි තේ වැවීම කරගෙන ගියේ. තේ නිෂ්පාදනය කෙළෙත් ඔවුන්ට වුවමනා කළ හැටියටයි. ඒවා වික්කෙත් ඔවුන්ගේ කැමති අකැමති අන්දමටයි. එහෙත් ඒ ක්‍රම නිදහස් රටකට කිසිසේත් ගැලපෙන්නේ නැහැ. අපේ පොළොව අපට අයිති නම්, එහි වගා කරන ඒවා අපට අයිති නම්, ඒවා විකුණා ගැනීමත් අපට අයිති දෙයක්.

එම නිසා මේ කර්මාන්ත පිළිබඳ සම්පූර්ණ පරීක්ෂණයක් අවශ්‍යයි. තේ වැවීමේ සිට විකුණන අවස්ථාව තෙක් ඇති සෑම අංශයක් ගැනම විධිමත් පරීක්ෂණයක් ඉතාමත් අවශ්‍යයි. ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය ඩබ්ලිව්. දහනායක) තේ වෙළඳාම ගැන විශේෂයෙන් සඳහන් කළා. බ්‍රෝකර්වරුන්ගේ සංගමය, ඒජන්සි හවුසස්, තේ වෙන්දේසි ආදි වෙළඳාමේ සෑම අංශයක් ගැනම අද අපට කල්පනා කරන්නට සිද්ධ වෙනවා. වත්තකට පාඩු වුණත් ඒජන්සි හවුසස්වලට පාඩු වෙන්නෙ නැහැ. ඊට නියම කොමිස් මුදල් ලැබෙනවා. වත්තක අවුරුදු ගණනාවක් තිස්සේ පාඩු සිදු වුණත් කොළඹ සිටින එය පාලනය කරන උදවියට ලාභ හා කොමිස් මුදල් ලැබෙනවා. ඒ වගේම බ්‍රෝකර්වරුන්ගේ කොමිස් ආදියත් නිසියාකාර ලැබෙනවා. එම නිසා ඊට හේතු සොයන්නට යාමේදී මේ වෙන්දේසි ක්‍රමය ඉදිරියටත් අප පවත්වාගෙන යනවාද, මේ බ්‍රෝකර් ක්‍රමය ඉදිරියටත් ගෙන යන්නට ඉඩ දෙනවාද, මේ ඒජන්සි හවුසස් ක්‍රමය ඉදිරියටත් ගෙන යන්නට ඉඩ දෙනවාද යන කරුණු ගැන අපට කල්පනා කරන්නට සිද්ධ වෙනවා.

විශේෂයෙන් පිටරට වෙළඳාම ගැන අපට අයිතියක් ඇත්තෙම නැහැ. ඒ පිළිබඳ

සම්පූර්ණ අයිතිය තිබෙන්නේ විදේශික කොම්පැණිවලටයි. ලංකාවේ තේ නිෂ්පාදනය කළත්, අපි ඒ වෙළඳාම ගැන හොඳින් දැන ගත්තත්, පිටරටවල් සමඟ තේ වෙළඳාම කරන ලාංකිකයන් එක්කෙනෙකුට දෙන්නෙකුට වඩා නැහැ. අනික් සියල්ලම විදේශීය සමාගම්. ඒ නිසා මේ කර්මාන්තයේ සෑම අංශයක් ගැනම මූලික පරීක්ෂණයක් කරන්නට ඕනෑ. මෙම කර්මාන්තයෙන් නියම ලාභය රජයට ලැබෙනවාද, බදු මුදල් ආදිය හරියාකාර රජයට ලැබෙනවාද ආදි කරුණු ගැන පරීක්ෂා කර බලන්න ඕනෑ. මීට පෙර කවදාවත් ඒ විධියේ පරීක්ෂණයක් ඇති වුණේ නැහැ. කොටස් වශයෙන් කර්මාන්තයේ එක් එක් අංශය ගැන වෙන වෙනම කරන පරීක්ෂණවලින් වැඩි ප්‍රයෝජනයක් නැහැ. සම්පූර්ණයෙන් කර්මාන්තයේ සෑම අවස්ථාවක් ගැනම අංග සම්පූර්ණ පරීක්ෂණයක් පවත්වා එහි තිබෙන දුර්වලකම් මොනවාද, ඒවා හරිගස්සා ගන්නේ කොහොමද, තේ කර්මාන්තයෙන් නිසි ආදායමක් ලබා ගන්නේ කොහොමද, නිෂ්පාදකයාට සෑහෙන මිළක් ලබා දිය හැක්කේ කෙසේද, යන කරුණු සලකා බලා යම්කිසි ස්ථිර වැඩ පිළිවෙලක් යොදන්නට ඕනෑ.

අද පවතින තත්ත්වය කුමක්ද? අපේ විදේශ ප්‍රතිපත්තියේ යම් යම් වෙනස්කම් සිදු කළ නිසා සමහර තේ සමාගම් අපේ තේ මිළදී ගැනීමට ඉදිරිපත් නොවූ නිසා තේ මිල බහින්නට ගියත් හොඳ වෙලාවට සෝවියට් දේශය තේ මිළදී ගැනීමට ඉදිරිපත් වූ නිසා මේ සතියේ මිල ටිකක් වැඩි වුණා. එහෙත් වෙන්දේසියට තැබූ සෑම තේ පාර්සලයක්ම විකුණා ගන්නට බැරි වුණා. දැනට තේ මිල රදා පවතින්නේ ඔය විධියේ තේ මිළදී ගැනීමට ඉදිරිපත් වන කණ්ඩායම් කටයුතු කරන ආකාරය උඩයි. ඒ නිසා අපි අලුත් වෙළඳපොලවල් සොයා ගන්නට ඕනෑ. සමාජවාදී රටවලට වැඩිපුර තේ විකුණා ගන්නට අපි කල්පනා කරන්නට ඕනෑ. දැන් තවත් නොයෙක් අමාරුකම් තිබෙනවා. කලින් ඉරාකය විශාල වශයෙන් අපේ තේ මිළදී ගත් නමුත් දැන් මුදල් නැහැයි කියනවා. එක්සත් අරාබි ජනරජයත් අපෙන් කලින් මිළදී ගත් තරම් තේ ප්‍රමාණයක් දැනට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජේ. ඩී. වීරසේකර මයා.]

මිළදී ගන්නෙ නැහැ. ඒ උදවිය කියනවා, ඔවුන්ගේ බඩු අපි නොගන්නවා නම් ඔවුන්ට වැඩිපුර තේ මිළදී ගන්නට බැහැ කියා.

මෙය අපේ ආර්ථික පදනමට මරු පහරක් වැදී තිබෙන අවස්ථාවක්. මේ තත්ත්වය මඟ හැරවීමට අප උත්සාහ කරන්නට ඕනෑ. අපට වුවමනා කරන විදේශ විනිමය වැඩි වශයෙන්ම ලැබෙන්නේ තේ කර්මාන්තයෙනුයි. ඒ නිසා ඒ මඟින් ලැබෙන ආදායම හැකි තරම් දුරට ඒ තත්ත්වයේම තබා ගන්න අප විධි විධාන යොදන්නට ඕනෑ.

මෑද රට තේ මිළ බැසීම නිසා එම තේ විකුණා ගැනීම අපහසු වීමෙන් නොයෙක් අමාරුකම් ඇති වී තිබෙනවා. එම නිසා එම තේ වගා කිරීමට තවත් උත්සාහ කරනවාද නැත්නම් ඒ වෙනුවට වෙනත් බෝග වර්ග ඇති කරනවාද යන කරුණ දැන් අපේ සැලකිල්ලට ගත යුතුව තිබෙනවා. ලෝක වෙළඳ පොළේ හොඳ මිළක් නොලැබෙන, අපට විකුණා ගන්නට බැරි ද්‍රව්‍යයක් වෙනුවෙන් අපේ කාලය තව තවත් ගත කිරීම නුවණට හුරු දෙයක් නොවෙයි. එම නිසා විශේෂයෙන් මෑදරට තේ ගැන අමුතු මුහුණුවරක් අමුතු වැඩ පිළිවෙළක් සකස් කරන්නට අපට සිදු වෙනවා. කරාබුනෑදි, ගම්මිරිස්, එන්සාල් වැනි දේ වගා කිරීමේ අදහසක් දැනට මත් ඇති වී තිබෙන බව මා දන්නවා. එවැනි වගා වලින් ආදායම් ගන්න ටික කලක් ගත වෙනවා. දැනට තිබෙන ආදායම නැතිව යන නිසාත් ඉහත කී බෝග වලින් ආදායම් ලැබීමට කල් ගත වන නිසාත් මෑදරට ප්‍රදේශයේ මොන විධියේ වැවිල්ලක් ඇති කළ යුතුද යන කරුණ ඉතාමත් නුවණට හුරුව කල්පනා කළ යුතුව තිබෙනවා.

ඒ සමගම, උඩරට ජීවත් වන සුළු තේ වතු හිමි ගැමියන් ගැනත් කල්පනා කරන්න ඕනෑ. ඔවුන් අද ඉතාමත් අමාරු තත්ත්වයකට මුහුණ දා සිටිනවා. ඔවුන් අද කරන්නේ ජීවිතයත් මරණයත් අතර සටනක්. ඔවුන්, ඔවුන්ට එදිනෙදා වුවමනා කරන කෑම් බීම් ලබා ගන්නෝ නිෂ්පාදන

නය කරන තේ දලු ටික විකිණීමෙනුයි. එම තේ දලුවල මිළ පහත බැස තිබෙන නිසා, කර්මාන්තකාරයන් ඔවුන්ට සැහෙන මිළක් නොදෙන නිසා අද ඔවුන් ඉතාම අමාරු තත්ත්වයකට පත් වී සිටිනවා. මෙය ඉතා විශාල ප්‍රශ්නයක්. සුළු තේ වතු හිමියන් 60,000 ක් පමණ සිටිනවා. කොත්මලේ වැනි ප්‍රදේශවල තේ කර්මාන්ත ශාලාවක් නෑ. විශාල පිරිසක් තම ජීවිතය ගෙන යන වෘත්තියක් ආරක්ෂා කිරීමට කිසියම් ස්ථිර වැඩ පිළිවෙළක් ඇති කිරීම රජයක යුතුකමක්. එම නිසා, සුළු තේ වතු හිමියන්ගේ දලු සඳහා නියම මිළක් දැනට ලබා දෙන අතර ඉවුන්ගේ ජීවනෝපාය සඳහා සත්ව පාලනය හෝ එවැනි වෙනත් ස්ථිර වැඩ පිළිවෙළක් ඇති කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගාල්ලේ මන්ත්‍රීතුමා (ආචාර්ය ඩබ්ලිව්. දහනායක) ක්ෂණික තේ සම්බන්ධව කරුණු කිව්වා. අපේ සල්ලිවලින් අපේ පර්යේෂණාගාරවල පරීක්ෂණ හා පර්යේෂණ පවත්වා ලබා ගන්නා ලද ප්‍රතිඵල විදේශීය කොම්පැනිකාරයන් අරගෙන තිබෙනවා. එය කිසිසේත්ම සතුටුදායක කරුණක් නොවෙයි. ක්ෂණික තේ ක්‍රම යෙන් දියුණු වේගෙන යනවා. ක්ෂණික තේ පාවිච්චියේදී තේ රොඩු විසි කරන්නට වුවමනා වන්නේ නෑ. ක්ෂණික තේ කෝපි මෙන් සම්පූර්ණයෙන්ම දිය වෙනවා. එම නිසා බටහිර ලෝකයේ ජනතාව ක්ෂණික තේ බීමට වැඩි කැමැත්තක් දක්වනවා. වැඩි වැඩියෙන් ඒවා නිපදවීම සඳහා කර්මාන්තශාලාවක් ඇති කිරීමට රජය විධිවිධාන යෙදුවොත් සුළු තේ වතු හිමියන්ට විශාල යහපතක් සැලසෙනවා. මේ අංශය ගැනත් ඇමතිතුමා කල්පනා කර බලා සාධාරණ වැඩ පිළිවෙළක් යොදනු ඇතැයි මා විශ්වාස කරනවා.

වැඩි වේලාවක් ගන්නට එපායයි ඇමතිතුමා මට කිව්වා. මේ ඇමතිතුමාගෙන් තේ ව්‍යාපාරයටත් වෙනත් වැවිලි ව්‍යාපාරවලටත් ඉතාම විශිෂ්ට සේවයක් සිදු වේවායි ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

අ. භා. 5.23

ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.
(திரு. டென்சில் பர்ணந்து)
(Mr. Denzil Fernando)

වැවිලි කර්මාන්ත අංශය භාර ගරු ඇමතිතුමා, අක්කර 10 ට වඩා තිබෙන උදවියගෙන් ආණ්ඩුවේ ගබඩාවලට රබර් ගන්නට එපාය කියා නියෝග කර තිබෙනවා.

ගරු ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(கௌரவ கலாநிதி கொல்வின் ஆர். த சில்வா)
(The Hon. Dr. Colvin R. de Silva)

එම දෙපාර්තමේන්තුව අයිති වන්නේ විදේශීය හා දේශීය වෙළඳ ඇමතිතුමාටයි.

ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.
(திரு. டென்சில் பர்ணந்து)
(Mr. Denzil Fernando)

කෙසේ වෙතත් අක්කර 10 ට වැඩි උදවියගෙන් ඒ අන්දමට රබර් ගන්නට එපාය කියන නියෝගය රජය මගින් කර තිබෙනවා. ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා කීවා වාගේ අක්කර 15, 20, 25 වශයෙන් අයිති උදවිය ලොකු වතු හිමියන් හැටියට සලකන්නට බැහැ. මෙම තත්ත්වය නිසා සුළු වතු හිමියන්ට තමන්ගේ රබර් විකුණාගන්නට බැරි තත්ත්වයක් උදා වී තිබෙනවා. අක්කර 10 න් ඉහල නොවෙයි, අඩු වශයෙන් අක්කර 50න් ඉහලවත් ලොකු වතු හැටියට සලකනවා නම් සුළු වතු හිමියන්ට සහනයක් සැලසෙනවා. මෙම තත්ත්වය යටතේ බොහෝ සුළු වතු හිමියන්ට සහනයක් ඇත්තේ නැහැ. යම් කෙනෙකුට අක්කර 11ක් හිමිව තිබෙනවා නම් එම තැනැත්තාට තමන්ගේ රබර් විකුණාගන්ට හැටියක් නැහැ. මා ඉල්ලා සිටිනවා එම සීමාව අක්කර 50 දක්වා වැඩි කරන ලෙස.

ගරු ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(கௌரவ கலாநிதி கொல்வின் ஆர். த சில்வா)
(The Hon. Dr. Colvin R. de Silva)

එම තින්දුව ගරු ඇමතිතුමා විසින් වෙනස් කර ඇති බව දැනුම්දී තිබෙනවා.

පරිපූරක මුදල්

මට පෙනෙනවා පත්‍ර වල එය එතරම් ප්‍රසිද්ධ කර නොමැති බව. අක්කර 10 සිට අක්කර 25 දක්වා ඒ සීමාව නංවන්නට දැන්මම නියම කර තිබෙනවා. පියවර දෙකකින් ඒ ප්‍රමාණය අක්කර 50 දක්වා නංවන්නට කල්පනා කරනවා.

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டபிள்யு. தஹநாயக்க)
(Dr. W. Dahanayake)

ඔක්තෝබර් 1 වන දා සිට අක්කර 25 කර තිබෙනවා.

ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.
(திரு. டென்சில் பர்ணந்து)
(Mr. Denzil Fernando)

බොහොම ස්තුතියි. ඇමතිතුමාත් පිළිගත්තා, තවම ඒ තීරණය එතරම් ප්‍රසිද්ධ වී නැති බව. මගේ කොට්ඨාශයේ සුළු වතු හිමියන්—අක්කර 11, 12 පමණ අයිති උදවිය—තමන්ගේ රබර් විකුණා ගන්නට බැරිකම නිසා මට ඇවිත් පැමිණිලි කර තිබෙනවා. මේ ගැන දැනුම් දීම ගැන වැවිලි කර්මාන්ත ඇමතිතුමාට මා ස්තුති කරනවා. මට මේ ගැන වෙන කියන්නට දෙයක් නැහැ.

අ. භා. 5.25

ඒ. අසීස් මයා. (පත් කරන ලද මන්ත්‍රී)
(ஜனாப் ஏ. அஸீஸ்—நியமன அங்கத்தவர்)
(Mr. A. Aziz—Appointed Member)

Mr. Deputy Chairman, the metamorphosis of the hon. Member for Galle (Dr. W. Dahanayake) has really surprised me, and surprised me very pleasantly. This shows that after he left the United National Party his thinking has taken a turn for the good, that his mind is working in a progressive direction. I was very happy to listen to his speech this afternoon.

The hon. Member referred to certain Jewish firms who have refused to buy Ceylon tea, but I am glad that he supplemented his observations by saying that he was not sure as to

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අසිස් මයා.]

what was the source of the information and also as to whether the information was correct or not.

In this connexion it would be pertinent for me to draw the attention of the Hon. Minister to the fact that the Chairman of the Tea Propaganda Board is actually conducting the work of an Israeli Propaganda Board in this country. He is continually carrying on a kind of propaganda that our tea market would be affected because of the decision that the Government has taken to suspend relations with Israel. I think it is essential that persons who are connected with government and semi-government organizations should not carry on propaganda of this nature, and I would request the Hon. Minister of Plantation Industry to do the needful in this connexion.

I think one of the tasks of the Ministry of Plantation Industry is to look into the question of the marketing of tea. I think it is a very important problem. I would like the Minister when he is replying to this Debate to give us an indication as to what concrete steps are being taken in respect of the marketing of our tea in the West.

Even the last Government was aware, we are aware, we have always been aware, since independence that a great deal of jugglery is going on in the matter of prices at our auctions, because we find that while companies which are importing tea into the U.K. are making profits running into millions of pounds, our tea prices here are so very low. Obviously something is happening somewhere which we are unable to spot or trace. I think, Mr. Deputy Chairman, that the Hon. Minister of Plantation Industry should treat this question of how the marketing processes are operating as very urgent and devise the measures necessary to control the price manipulation which is being done in our auctions as well as in the London auctions, so that we may get better prices for our teas.

In this connection I wish to point out one method which India has adopted in order to obtain reasonable prices for her teas. Wherever possible, India enters into barter agreements with other countries, buying goods from those countries and selling teas at prices which are considered profitable. I do not wish to make any specific suggestion on this matter because I believe the Hon. Minister of Plantation Industry will look into this question seriously.

The hon. Member for Galle (Dr. W. Dahanayake) referred to the packeting of tea and instant tea. I think these are also matters which the Hon. Minister, in the process of seeking new markets, should really go into.

In the matter of packeting tea, it may be useful to consider whether the materials necessary for the purpose which are imported should not be free of FEECs so that those who engage in this activity would be able to utilize that facility and ensure that pure Ceylon tea goes into the packets which are sold in the markets of the world.

The packeting of tea is an industry that exists in other countries also, and our tea mixed with teas of other countries is being sold in the markets of the world as Ceylon tea. If progress is made in this matter of the packeting of tea, then 100 per cent Ceylon tea will be sold in world markets.

In this regard, I think one of the very important points which the hon. Member for Galle made was that there are several markets which remain untapped. I hope the Hon. Minister will take note of this when he goes into the question of finding markets for our tea.

අ. භා. 5.33

එල්. සී. ද සිල්වා මයා. (අම්බලන්ගොඩ)

(திரு. எல். சீ. த. சில்வா—அம்பலாங்கொடை)

(Mr. L. C. de Silva—Ambalangoda)

අපේ ප්‍රධාන වැවිලි කර්මාන්තය අද වැටී තිබෙන ප්‍රපාතය ගැන ගරු ඇමතිතුමාට අමුතුවෙන් කරුණු වටහා දීමට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වුවමනාවක් නැහැ. පත් කළ ගරු මන්ත්‍රීතුමා (අසිස් මයා). අපේ තේ ප්‍රචාරක මණ්ඩලයේ සභාපතිතුමා ගැන සඳහන් කළා. මා ඒ සභාපතිතුමා ගැන පෞද්කලිකව සඳහන් නොකළත් එක් කාරණයක් ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්නට සතුටුයි. මට නම් මේ තේ ප්‍රචාරක මණ්ඩලයෙන් මොනම ප්‍රචාරයක්වත් වන බවක් පෙනෙන්නට නැහැ. ලංකාව තුළම තේ ප්‍රචාරය කිරීමේ කටයුතුවලට තේ ප්‍රචාරක මණ්ඩලය අද විශාල මුදලක් වැය කරනවා. ලංකාවට අමුතුවෙන් තේ ගැන ප්‍රචාරයක් වුවමනා කරන්නේ නැහැ. අමුතුවෙන් ප්‍රචාරය කළ යුත්තේ දැනට වෙළඳ පොළක් නොමැති දැනට අපේ තේ නොවිකිණෙන රටවලයි. කොටුවේ චැතැම් වීදියේ තේ ශාලාවක් විවෘත කර තිබෙනවා. එය පවත්වාගෙන යෑමට මාසයකට රුපියල් විසි දහසක්වත් වැය වෙතැයි මා සිතනවා. එතැනා හොඳට රෙදි හැට්ට ඇන්ද වූ ගැහැණු ළමයින් කිප දෙනෙකු සිටිනවා. එතැනින් මොන ප්‍රචාරයක් වෙනවාද කියා මට නම් තේරුම් ගන්නට බැහැ. මොන අංශයක් ප්‍රචාරය කරන්නට එතැන ඒ තේ ශාලාව විවෘත කළාද කියා මට නම් තේරුම් ගන්නට බැහැ.

අද තිබෙන තේ ප්‍රචාරක මණ්ඩලය සෑදී තිබෙන ව්‍යවස්ථාව අනුව ඇමතිතුමාට සුදුස්සක් කරන්නට ඉඩක් තිබෙනවායයි මා සිතන්නේ නැහැ. රජයට වුවමනා විධියට, ඇමතිතුමාට වුවමනා විධියට තේ ප්‍රචාරක මණ්ඩලය සකස් කරන්නට බල තල ලැබෙන පනත් කෙටුම්පතක් නුදුරු අනාගතයේදීම මේ ගරු සභාවට ඉදිරිපත් කර සම්මත කිරීමට කටයුතු කරන්නා මෙන් මා ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ගාල්ලේ ගරු මන්ත්‍රීතුමාගේ—මිරි දුවානා ගැන හොඳ අවබෝධයක් තිබෙන ගාල්ලේ ගරු මන්ත්‍රීතුමාගේ—කථාවට සවන් දුන් මට පෙනී යන්නේ එක්කෝ පසුගිය අවුරුදු පහ තුළම එතුමා මිරි දුවානා ගහලා සිටි බවයි; නැත්නම් මැතිවරණයෙන් පසු එතුමා මිරිදුවානා ගහන්නට පටන් ගෙන තිබෙන බවයි. මේ දෙකෙන් එකක් හරි යන්නට ඕනෑ. මක්නිසාද? එතුමා අද වන්දි නැතිව වතු ජනසතු කරන්නට කථා කරනවා.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)
චේ ගුවේරා කල්ලියෙ අය වගෙ.

එල්. සී. ද සිල්වා මයා.
(திரு. எல். சீ. த சில்வா)
(Mr. L. C. de Silva)
ඔව්. ගාල්ලේ මන්ත්‍රීතුමා තුළ විශාල වෙනසක් ඇති වී තිබෙනවා. අද වන්දි නැතිව වතු ජනසතු කරන්නට කථා කරනවා. ඉංග්‍රීසිකාරයින් අපේ රටේ ඉඩම් අක්කරය රුපියලට, රු. 1.25 ට කොල්ල කෑවායයි එතුමා කිව්වා. එතුමා දැන් එසේ කථා කළත් මේ ගරු සභාවටත් එමගින් රටටත් මා එක් කාරණයක් මතක් කර දෙන්නට සතුටුයි. අපි ඉංග්‍රීසිකාරයින් පැත්තක තබමු. පසුගිය අවුරුදු පහ තුළ නිබුණු ආණ්ඩුව—ගාල්ලේ ගරු මන්ත්‍රීතුමාත් ඇමතිවරයකු වශයෙන් සිටි ඒ ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලය—ඉංග්‍රීසින් කොල්ල කෑ ඉතිරි වී තිබෙන ඉඩම්වලිනුත් අක්කර 98,000 ක් එක රුපියලක්වත් අය කර නොගෙන ධනපතියන්ට දෙද්දී ගාල්ලේ මන්ත්‍රීතුමා මොන පියවරක් ගත්තාද කියා මා ප්‍රශ්න කරනවා.

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டபிள்யு. தஹநாயக்க)
(Dr. W. Dahanayake)
Cabinet secret!

එල්. සී. ද සිල්වා මයා.
(திரு. எல். சீ. த சில்வா)
(Mr. L. C. de Silva)
තමුන්නාන්සේ ඒ අවස්ථාවේදී විරුද්ධ වුණා නම්, විරුද්ධ වී ආත්ම ගෞරවයක් තිබෙන පුද්ගලයකු හැටියට ආණ්ඩු පක්ෂයෙන් ඉවත් වී විරුද්ධ පක්ෂයට ගොස් ඔය දැන් කියන කථාව කිව්වා නම්, රට තරමක් දුරටවත් තමුන්නාන්සේ ගැන විශ්වාසයක් තබනවා. අවුරුදු ගණනාවකට කලින්, මමත් තරුණයකුව සිටි කාලයේදී, තමුන්නාන්සේ බිබිලේ මන්ත්‍රීවරයා වශයෙන් මේ ගරු සභාවට පත්ව ආ අවස්ථාව මට මතකයි. තමුන්නාන්සේ ගැන එදා අපි බොහොම බලාපොරොත්තු දැනිව සිටියා. මේ රටේ ඉදිරි ගමනට අත දෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එල්. සී. ද සිල්වා මයා.]

දුද්ගලයකු මේ සභාවට පත්ව සිටිනවායයි අප සිතුවා. නමුත් පසුගිය කාල සීමාව තුළ අපේ ඒ බලාපොරොත්තු සියල්ලක්ම සුන් වී ගියා.

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டபிள்யு. தஹநாயக்க)
(Dr. W. Dahanayake)

දැන් තිබෙන තත්ත්වය වහ ගන්නට පුළුවන්ද ඕව කියල?

එල්. සී. ද සිල්වා මයා.
(திரு. எல். சீ. த சில்வா)
(Mr. L. C. de Silva)

ඒ කාරණයට මා එනවා. තත්ත්වය වහ ගන්නට දෙයක් නැහැ. තමුන්නාන්සේ අද වන්දි නැතිව වතු ජනසතු කරන්නට කථා කරනවා.

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டபிள்யு. தஹநாயக்க)
(Dr. W. Dahanayake)

පසුගිය ආණ්ඩුවෙන් එසේ ඉඩම් දීමට විරුද්ධ වූ කෙනෙක් මම.

එල්. සී. ද සිල්වා මයා.
(திரு. எல். சீ. த சில்வா)
(Mr. L. C. de Silva)

වතු ජනසතු ගැන කථා කරන තමුන්නාන්සේ අපේ මැතිවරණ ප්‍රකාශනය කියෙව්වාද? අපේ මැතිවරණ ප්‍රකාශනයේ වතු ජනසතු කරනවායයි සඳහන් වන්නේ කොතැනද කියා මා ප්‍රශ්න කරනවා. ජනතාව බලාපොරොත්තු වන හැම දෙයක්ම ක්‍රියාත්මක කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ජනතාව ඉදිරිපිට තැබූ ප්‍රකාශනය අනුව මේ රටේ පාලනය ගෙන යාමට මෙම රජය බැඳී සිටිනවා.

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டபிள்யு. தஹநாயக்க)
(Dr. W. Dahanayake)

මින්නේරියේ මන්ත්‍රීතුමාගෙන් අසා බලන්න.

එල්. සී. ද සිල්වා මයා.
(திரு. எல். சீ. த சில்வா)
(Mr. L. C. de Silva)

මින්නේරිය මන්ත්‍රීතුමා කොහේදිද කළ කතාවක් ගැන අපට අවශ්‍ය නැහැ. ඒ මින්නේරියේ මන්ත්‍රීතුමාගේ අදහස වෙන්න පුළුවනි. අපි අවශ්‍යය කියා සිතූ නොත් වතු පමණක් නොවෙයි, ඕනෑම දෙයක් ජනසතු කරනවා.

ඒ. ජී. ප්‍රනාන්දු මයා. (වත්තේගම)
(திரு. ஏ. ஜீ. பர்னந்து—வத்தேகம)
(Mr. A. G. Fernando—Wattegama)

අපට සිතුනොත් දහනායක මන්ත්‍රීතුමාත් ජනසතු කරනවා.

එල්. සී. ද සිල්වා මයා.
(திரு. எல். சீ. த சில்வா)
(Mr. L. C. de Silva)

ඇත්ත වශයෙන්ම අපි ජනතාවට ඉදිරිපත් කළ ඒ පොදු වැඩපිළිවෙලේ තිබෙන හැම දෙයක්ම ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා. ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා ගාලු දිස්ත්‍රික්කයේ තිබෙන වතු කිහිපයක් ගැනම සඳහන් කළා. ඔලිම්පස් ගෘප් වැනි වතු කිහිපයක් ගැනම එතුමා සඳහන් කළා. ඒ වතුවල වැඩ කෙරෙන්නේ නැතිලු. ඒ වතුවල වැඩ කෙරෙන්නේ නැතිවා පමණක් නොව අවුරුදු ගණනාවක් තිස්සේම ඒ වතුවල වැඩකරන කම්කරුවන්ට නියම විධියට පඩි දෙන්නෙත් නැතිලු. නමුත් පසුගිය අවුරුදුවලදී ඒ ගැන කිසිම පියවරක් ගත්තේ නැහැ. අපි එදා ඒ කම්කරුවන් වෙනුවෙන් නොයෙක් අවස්ථාවලදී පසුගිය ආණ්ඩුවට කරුණු ඉදිරිපත් කළා. ඒ වතුවල වැඩ කළ කම්කරුවන් 30ක් 35ක් පමණ දෙනාට යන එන මං නැතිව සිටිනවා. නමුත් ඒ ගැන පසුගිය ආණ්ඩුව ඒ අවස්ථාවේදී කිසිම පියවරක් ගත්තේ නැහැ. ඒ නිසා ඒ වතු සම්බන්ධයෙන් කුමන පියවරක් ගන්නවාද කියන එක වැඩි කල් යන්න ප්‍රථමයෙන් මෙම ආණ්ඩුව තීරණය කරනවාට කිසිම සැකයක් නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කළ යුතු තවත් කාරණයක් තිබෙනවා. අපේ තේ මිල පාලනය කරන ඒජන්සි හවුසස්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තිබෙන්නා වාගේම අපේ කුරුඳු මිල පාලනය කිරීමටත් සංවිධාන කිහිපයක් තිබෙනවා. එම සංවිධානවලට වුවමනා පරිදි අපේ තේ සහ කුරුඳුවල මිල උස් පහත් කරනවා. අද ඇත්ත වශයෙන්ම කුරුඳු මිල ඉතාම පහත් මට්ටමකට වැටී තිබෙනවා. මගේ කල්පනාවේ හැටියට කුරුඳු මිල පාලනය කරන්නේ කුරුඳු පිටරට පටවන වෙළෙඳුන් අතලොස්සක් විසිනුයි. පිටරට වල කුරුඳු මිල අඩු නොවන අවස්ථාවලදීත් වෙළෙඳුන් අතලොස්සක් විසින් ඒකාධිකාරයක් ඇති කර ගෙන කුරුඳු මිල පහත දමන බව අපට පෙනී ගොස් තිබෙනවා. ඒ නිසා තේ මිල පාලනය කරන ඒජන්සි හවුසස් සම්බන්ධයෙන් යම්කිසි පියවරක් ගන්නා වාගේම කුරුඳු මිල පාලනය කරන ඒ වෙළඳුන් අතලොස්ස ගැනත් යම්කිසි පියවරක් ගන්නය කියා මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම මේ රටේ කුරුඳු වගාව අයිතිව තිබෙන්නේ ඉතාම කුඩා වතු හිමියන්ටයි. වැඩි වශයෙන්ම කුරුඳු වගාව හිමිව සිටින්නේ රජයේ ඉඩම් කොළණි ක්‍රමයට ලබාගෙන සිටින ඉඩම් කව්ටිකරුවන්ටයි. ඒ නිසා මේ කුරුඳු මිල සාධාරණ මට්ටමක පැවැත් වෙන විධියේ වැඩපිළිවෙළක් ඉතාම ඉකමනින් සකස් කරන්නය කියා මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

අ. භා. 5.42

ඒ. ජී. ප්‍රනාන්දු මයා.

(திரு. ஏ. ஜீ. பர்ணந்து)

(Mr. A. G. Fernando)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සුළු තේ වතු හිමියන් සිටින සහ සුළු තේ වතු තිබෙන ප්‍රදේශයක මන්ත්‍රීවරයෙක් වශයෙන් වතුවල තිබෙන සමහර දුෂ්කර තාවයන් ගැන කරුණු කිහිපයක් තමුන්නාන්සේට ඉදිරිපත් කිරීමට මා බලා පොරොත්තු වෙනවා. දැනට වත්තේගම ප්‍රදේශයේ තේ වතු බොහොමයකම සිංහල කුලීකරුවන්ට, සිංහල කම්කරුවන්ට පසුගිය වකවානුවේදී තිබුණ පහසුකම් බොහොමයක් නැති වී තිබෙනවා. අද අප ප්‍රදේශයේ විශාල වතු කොටසක් අයිති කර ගෙන සිටින්නේ ඉන්දියාවෙන් ලංකාවට පැමිණි අය විසින් බව මතක් කරන්න සිදු වී තිබෙනවා. මේ රජය බලයට පත් වූ විගසම වාගේ විශේෂයෙන්ම ද්‍රවිඩ ඉන්දියානුකූලයින් විසින් පවත්වාගෙන යනු ලබන වතු අවට ගම්වල සිටින සිංහල කම්කරුවන් එම වතුවල සේවයට ගැනීම නතර කර තිබෙනවා.

අද ඇතැම් ගැමියන් එදා වේල හොයා ගන්නට බැරි තත්ත්වයකට පත්ව සිටිනවා. එම ප්‍රදේශයේ බලපවත්වන්නේ නොණ්ඩමන් මහතාට අයිති වෘත්තීය සමිතියි. වතුවල වැඩ කරන සිංහල කම්කරුවන් ක්‍රම ක්‍රමයෙන් අයින් කර දමන විධියේ වැඩ පිළිවෙළක් එම වෘත්තීය සමිතිය මගින් ඇති කරගෙන යනවා. එමනිසා එක්තරා ප්‍රමාණයකට දැනටමත් රජයට අපකීර්තියක් ඇති වී තිබෙනවා. අපේ ගම්බද උදවිය කියන්නේ අපි මෙම ආණ්ඩුවට බලය දුන්නේ වතුකාරයින්ගෙන් පහර කන්නට නොව විශේෂයෙන්ම ඔවුන්ගෙන් බේරෙන අදහස පිටය කියායි. එහෙත් අද සිදු වී තිබෙන්නේ නොණ්ඩමන් මහතාගේ වෘත්තීය සමිති සංවිධානය පිටුපසින් සිටින නිසාත්, එක්සත් ජාතික පක්ෂයේ වෘත්තීය සමිතිවලින් ඇතිවන නානා අන්දමේ තාඩන පීඩන නිසාත්, වැඩක් නැති පිරිසක් හැරියට ඔවුන්ට ගම්වලට වී ජීවත් වන්නටයි. එම නිසා මෙම ප්‍රදේශයේ ගම්බද ජනතාවට කලින් වැඩ ලබා ගත් අන්දමටම වැඩ ලබා ගන්නට හැකි වන අන්දමට කටයුතු සකස් කර දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

තවත් ප්‍රශ්නයක් තිබෙනවා. සුළු තේ වතු හිමියන්ට තමන්ගේ අමු දළු ටික විකුණා ගන්නට බැරි තත්ත්වයක් උදා වී තිබෙනවා. ධනපති වතුකාරයන් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේදී මිලට ගත් අන්දමට අද ඒවා මිලට ගන්නේ නැහැ. අද ඒවා මිලයට ගැනීම නවත්වා තිබෙනවා. ඒ නිසා මම ගරු ඇමතිතුමාගෙන් විශේෂයෙන් ඉල්ලනවා, කුඩා තේ වතු හිමියන්ට තමන්ගේ තේ දළු විකුණා ගැනීමට වැඩ පිළිවෙළක් ඇති කරන්නය කියා. ඒ වාගේම ගරු ඇමතිතුමාගෙන් කළ යුතු තවත් ඉල්ලීමක් නම්, එම ප්‍රදේශයේ කර්මාන්තශාලාවක් හෝ දෙකක් රජයට අත් පත් කරගෙන සුළු තේ වතු හිමියන්ගේ තේ දළු අඹරා ගැනීමට අවස්ථාවක් සලසා දෙන ලෙසයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඒ. ඒ. ප්‍රනාන්දු මයා.]

ඊළඟට මතක් කළ යුතු කාරණයක් නම්, පල්ලේකැලේ, නකල්ස් ගෲප් වැනි අක්කරයකින් අවුරුද්දකට රාත්තල් 600 ක් 700 ක් පමණ අස්වැන්නක් ලැබෙන වතුයි ඒ ප්‍රදේශයේ වැඩි ප්‍රමාණයක් තිබෙන්නෙ. ඒ නිසා මෙම තේ වතු පාමුල ඔයවල් ඇළවල් අසළ තිබෙන ඉඩම්වලින් යම් කිසි ප්‍රමාණයක් රජයට අත් පත් කර ගෙන වී ගොවිතැන් කිරීමේ වැඩ පිළිවෙළක් ආරම්භ කළ යුතුයි. එසේ රජයට අත්පත් කරගෙන කටයුතු කරන්න බැරි නම් ඒ වතු පා මුළ තිබෙන ඉඩම්වලින්—ජලාශ අසළ තිබෙන ඉඩම් වලින්—අඩු වශයෙන් සියයට 10කවත් වී ගොවිතැන් කළ යුතුය කියා එම ඉඩම් හිමියන්ට බල කරන ලෙස මා ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

මා විසින් ඉදිරිපත් කරන ලද ඒ කරුණු සැලකිල්ලට ගෙන තේවතුවල වැඩ කරමින් සිටි ගම්බද ජනතාවට නැවත වැඩ ලබාදෙන ලෙසත්, සුළු තේ වතු හිමියන්ගේ තේ දලු අඹරා ගැනීමට කර්මාන්ත ශාලාවක් සපයා දෙන ලෙසත්, සෑහෙන ඉඩම් ප්‍රමාණයක් වී ගොවිතැන සඳහා යොදවන ලෙසත් වැඩ පිළිවෙළක් සකස් කරන්නටය කියා ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරන අතර, තමුන්නාන්සේට ස්තුති කරනවා.

අ. භා. 5.46

සරත් මුත්තෙට්ටුවෙගම මයා. (කලවාන)
(திரு. சரத் முத்தெட்டுவெகம—கலவான)
(Mr. Sarath Muttetuwegama—Kalawana)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙම යෝජනාව යටතේ කරුණු දෙක තුනක් කෙරෙහි ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්න බලාපොරොත්තු වෙනවා. පළමුවෙනි කාරණාව නම් කුඩා රබර් වතු හිමියන්ට අද මුහුණ පාන්නට සිදු වී ඇති දුෂ්කරතා ගැනයි. කුඩා රබර් වතු හිමියන් ඔටුපාලු විකුණා ගැනීමට යෑමේදී රබර් මිලට ගැනීමේ දෙපාර්තමේන්තුව මගින් පිහිටුවා ඇති මධ්‍යස්ථානවල ඔටුපාල ගැනීම සීමා කර තිබෙන නිසා, ඔවුන්ට ඒවා විකුණා ගන්නට පිළිවෙළක් නැති වී තිබෙනවා. එම මධ්‍යස්ථානවලින් මිල දී ගන්නේ බොහොම සුළු ප්‍රමාණයක් පමණයි. ඔටුපාලු විකුණා ගැනීමට නම් තමන්ගේ රබර් විකුණා ගැනීමට පෞද්ගලික වෙළඳුන් සොයා ගෙන යන්නට ඔවුන්ට සිද්ධ වෙනවා. මෙය වෙළඳ ඇමතිතුමාට බල පාන ප්‍රශ්නයක් වුණත්, වැවිලිකරයටත් බල පාන නිසයි, මෙම ශීර්ෂය යටතේ මතු කෙළේ.

ඊළඟට මතක් කළ යුතු අනික් වැදගත් කාරණය නම් අපේ පළාතේ ඇති විදේශීය සමාගම් සතු වතු නැවත වගා කිරීම සහ පොහොර දැමීම් සම්පූර්ණයෙන්ම නවතා දමා තිබීමයි. මා හිතන හැටියට වතු ජනසතු කිරීමේ ප්‍රශ්නයක් ගැන කථා බහ තිබෙන නිසා මෙවැනි තත්ත්වයක් ඇති වී තිබෙන වා වෙන්නට ඇති. මේ විධියට නැවත වගා කිරීම සහ පොහොර දැමීම නවතා තිබෙන නිසා තව ටික කලක් යන විට වතුකරයට මොන තත්ත්වයක් උදාවේවිද කියා තමුන්නාන්සේට වැටහී යනවා ඇති. 1947 සිට මේ දක්වා විදේශීය වතු සමාගම් විසින් මේ රටේ ධනස්කන්ධය පිට රටට ඇද ගෙන තිබෙනවා. දැන් ටික කාලයක සිට—මේ ආණ්ඩුව බලයට පත් වුණාට පසුවත්—ඒ ගොල්ලන්ගේ වතු වැඩි දියුණු කිරීම නතර කර තිබෙනවා. නැවත වගා කිරීම සහ පොහොර දැමීම ඇනහිට තිබෙනවා. පාරවල් දියුණු කිරීම පවා නතර කර දමා තිබෙනවා. ඒ කාරණා කෙරෙහි වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ විශේෂ අවධානය යොමු කළ යුතුව තිබෙන බව මතක් කරන්න කැමතියි.

මට දැන ගන්න ලැබී තිබෙන හැටියට, පරණ අධිරාජ්‍යවාදී ක්‍රමයේ හේතුවක් නිසා පැක්ටරියේ සිට වරායට තේ එන විට ලියවිලි 40 කට වැඩි ගණනක් සම්පූර්ණ කරන්නට ඕනෑ. මේ නිසා තේ රාත්තලක් නිපදවීමේ මිළ එක්තරා ගණනකින් වැඩි වී තිබෙනවා. තේ ටික පිටරට යැවීමේදී මේ තරම් ලියවිලි ගණනක් සම්පූර්ණ කරන්නට වීමෙන් කරදරයක් මෙන්ම නිෂ්පාදන වියදම ශත ගණනකින් හෝ වැඩි වන නිසා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මේ ගැන අවධානය යොමු කළ යුතුයි. තේ ටික fපැක්ටරියේ සිට වරායට එන විට මේ තරම් ලේඛන ගත නොවන ක්‍රමයක් සකස් කරන්නට ඕනෑ.

තවත් කාරණයක් තිබෙනවා. තොන්ඩමාන් මහතාගේ වෘත්තීය සමිතිය පිළිබඳව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මේ රජයට යථා කාලයේදී පරීක්ෂණ පවත්වන්නට සිදු වෙනවාට සැකයක් නැහැ. තොන්ඩමන් මහතා පසුගිය ආණ්ඩුව පවතිද්දී පත් කරන ලද මන්ත්‍රීවරයකු වශයෙන් සිටියා. ඒ කාලයේදී ඒ මහතා "ඉතෝකා" නමින් කොම්පැනියක් පටන් ගත්තා. කම්කරුවන්ට ඒ කොම්පැනියේ කොටස් දෙන බවට ප්‍රචාරයක්ද ගෙන ගියා. ඒ වාගේම ඒ කොම්පැනිය තේ සහ රබර් වතු මිළයට ගන්නා බවටත් ප්‍රචාරයක් තිබුණා. වතු ගණනාවක් මිළයට ගෙන තිබෙනවා යයි මා හිතනවා. තොන්ඩමන් මහතා වෘත්තීය සමිති බල තල කොයි විධියට පාවිච්චි කරමින් මේ වතු මිළයට ගෙන තිබෙනවාදැයි මෙහිදී විමසිලිමත් වන්නට ඕනෑ. ඇත්තෙන්ම මේ ගැන පරීක්ෂණයක් පවත්වන්නට ඕනෑ. "ඉතෝකා" කොම්පැනියේ කොටස්කාරයන් කවුරුන්ද, ඒ කොම්පැනියෙන් ලාභ තිබෙනවාද, කොටස් බෙදා තිබෙනවාද යනාදි කාරණා ගැන විශේෂ පරීක්ෂණයක් පවත්වන්නට ඕනෑ.

වත්තේගම ගරු මන්ත්‍රීතුමා (ඒ. ජී. ප්‍රනාන්දු මයා.) කී කාරණය ගැන මාත් වචනයක් කියන්නට ඕනෑ. මා නියෝජනය කරන කලවාන කොට්ඨාශයේත් සුළු තේ වතු අයිතිකාරයන් සිටිනවා. ඒ සුළු තේ වතු හිමියන්ගේ තේ දලු විකිණීමට බැරි තත්ත්වයක් දැන් පවතිනවා. කලින් තේ දලු මිළයට ගත් උදවිය දැන් එය නවතා දමා තිබෙනවා. කම්කරු දෙපාර්තමේන්තුවෙන් කැඳවා ලද වෘත්තීය සමිති සාකච්ඡාවකට ගිය අවස්ථාවේදී සමහර f්පැක්ටරි අයිතිකාරයන් කීවේ පැක්ටරි වලින් පාඩු ලබන හෙයින් කම්කරු නීති අනුව ගෙවිය යුතු දීමනා ගෙවිය නොහැකි බවයි. f්පැක්ටරිවලින් පාඩු බව කම්කරු දෙපාර්තමේන්තුවට කියනවා; ඒ වාගේම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට කියනවා. ඒ විධියට f්පැක්ටරිවලින් පාඩු නම් ඒ f්පැක්ටරි රජයට ගෙන වැවිලි මණ්ඩලය ලවා ඒවා පාලනය කරවීමෙන් ඒ ප්‍රදේශවල සිටින සුළු වතු අයිතිකාරයන්ට සහනයක් සලසන්නැයි මා ඉල්ලා සිටිනවා.

අනෙක් කාරණය මේකයි. පසුගිය කාලය තුළ උස් බිම්වල අක්කර දෙක තුන බැගින් බෙදා දෙමින් තේ වගා කිරීම සඳහා උස් බිම් කොලනි ක්‍රමයක් ඇති කළා. කොලනි

කරුවන්ට තේ වගා කිරීමට නොයෙක් පහසුකම් දුන්නා. අද මේ කොලනි, අමාත්‍යාංශ කීපයකට සම්බන්ධකම් ඇතිව තිබෙනවා. එක පැත්තකින් කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ඇති ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවෙන් මේ කොලනිවල එක කොටසක් පාලනය වෙනවා. ඒ වාගේම සමහර f්පැක්ටරි වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ පාලනය වෙනවා. විදුලිබල, වාරිමාර්ග හා මහා මාර්ග අමාත්‍යාංශයෙන්ද කොටසක් පාලනය වෙනවා. ඒ නිසා අද මේ කොලනි පිළිබඳව ඇති වී තිබෙන ප්‍රශ්න විසඳන්නේ එක එක ආකාරයටයි.

මා නියෝජනය කරන කොට්ඨාශයේ දෙල්ගොඩ හා අයගම නමින් කොලනි දෙකක් තිබෙනවා. ඒ කොලණි දෙකේ අනුගමනය කරන ප්‍රතිපත්ති එකින් එකට වෙනස්. නිවිතිගල කොට්ඨාශයේ මඩලගම නමින් තවත් කොලනියක් තිබෙනවා. එහි අනුගමනය කරන ප්‍රතිපත්ති අර දෙකටම වඩා වෙනස් බව මා දන්නවා. රත්නපුර ඡන්ද කොට්ඨාශයේත් එරත්න කියා තේ කොලනියක් තිබෙනවා. දීමනා පහසුකම් ආදී නොයෙක් දේවල් සම්බන්ධයෙන් එහි අනුගමනය කරන ප්‍රතිපත්තිය අනික් තුනටම වඩා වෙනස්. ඒ නිසා මේවා පිළිබඳව එක ප්‍රතිපත්තියක් ඇති කර ගැනීම ගැන මේ අමාත්‍යාංශ දෙක තුනේම සහයෝගයෙන්, සාකච්ඡා මාර්ගයෙන්, තීරණයක් කරන්නට සිදු වී තිබෙනවා.

අනික් කරුණ මෙයයි: තරුණ ව්‍යාපාරය යටතේ 1960 සිට 1964 දක්වා තිබුණු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩු සමූහ ගොවිපොළවල් ක්‍රමයට කොලනි පිහිටෙවිවා. එසේ පිහිටවූ කොලනි පසුගිය රජය පැවැති කාලයේදී කට්ටි කඩා ඒ කට්ටිකරුවන්ට අක්කර දෙක තුන බැගින් දෙන්නට තීරණය කර තිබෙනවා; එසේ කරලත් තිබෙනවා. සමූහ ගොවිපොළවල් පිහිටුවීමේ ප්‍රතිපත්තිය යටතේ ඉඩම් දී බදවා ගත් අයට ඒ ඉඩම් කට්ටි කඩා දී ඒ ව්‍යාපාරයෙන් සමූහ ගොවිපොළවල් පිහිටුවීමේ ප්‍රතිපත්තිය සම්පූර්ණයෙන්ම අයින් කර තිබෙනවා, පසුගිය අවුරුදු 5 තුළ. ඒ කාරණය ගැනත් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේත් ඉඩම් අමාත්‍යාංශයේත් අවධානය යොමු කරන්නට කැමතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 5.57

ඒ. සී. එස්. හමීඩ් මයා. (අකුරන පළමු වන)

(ஜனுப் ஏ. சீ. எஸ். ஹமீது—அக்குறணை முதலாம் அங்கத்தவர்)

(Mr. A. C. S. Hameed—First Akurana)

I wish to remind the Hon. Minister of one or two points. The first is about the Mauritius Tea Agreement. You find that after this agreement the tea prices have got firm ; the prices have picked up. I think this agreement was signed only for one year. I am wondering whether the Hon. Minister has addressed his mind to this question.

Very often in this House, whenever we talk about tea, rubber and coconut, a thing that we always discuss and feel very vehement about is this question of prices, quite rightly so because to a great extent the economic upliftment of the people of our country depends on the prices that we could get for our tea, rubber and coconut. I want to tell the Hon. Minister that there has been a certain amount of discussion among the countries in our region that produce tea, rubber and coconut. I referred to the Mauritius Agreement with regard to tea, and we have seen that this agreement has borne good results in that prices are getting firmer.

If you look at Ceylon, Malaysia, the Philippines and some of the other countries in our region, you will note that we produce roughly about 93 per cent of the world production of rubber, and in regard to coconut it is somewhere about 87 per cent.

හර්බට් වික්‍රමසිංහ මයා. (බණ්ඩාරගම)

(திரு. ஹேர்பட் விக்ரமசிங்ஹ—பண்டாரகம)

(Mr. Herbert Wickramasinghe—Bandaragama)

We come seventh.

හමීඩ් මයා.

(ஜனுப் ஹமீது)

(Mr. Hameed)

I am speaking of the countries in our region put together, that is, Malaysia, Ceylon and all these other countries in the Asian bloc. We produce abjout 93 per cent of the world's rubber, 87 per cent of the coconut and 90 per cent, roughly, of the tea.

If these countries could be brought together on some basis then we shall have a sellers' market. What we have today is a buyers' market. What is required is some sort of concentrated approach to this question because, in fairness, I know and we accept that just one country alone cannot assert itself and get the best prices.

ගරු මන්ත්‍රීවරයෙක්

(கௌரவ அங்கத்தவர் ஒருவர்)

(An hon. Member)

What were you doing for five years ?

හමීඩ් මයා.

(ஜனுப் ஹமீது)

(Mr. Hameed)

I can answer that. I believe the Hon. Minister will be able to go through those files. A certain amount of action was taken by our Government. That is how the Mauritius Agreement was signed. I said the Mauritius Agreement has borne results. I do not want to take the Hon. Minister's time. I am only trying to see whether we can get somewhere on this question. The coconut community had conducted a number of discussions. I do not think they reached any finality. What I am trying to tell the Hon. Minister is that if he can address his mind to this question of getting the countries in our region to agree on some economic platform then we shall have, as I said, a sellers' market.

Today what we have is a buyers' market ; and unless we can get the other countries to co-operate with us I do not think we could be hopeful of getting the prices that we should really get. This is something that is

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

possible. Certain economic groupings are taking place in certain parts of the world, and in this we have been left far behind. I wish the Hon. Minister would push this idea forward not only in the interests of Ceylon but in the interests of the other Asian countries as well. There is already a lobby for it ; people are thinking in these terms and there has been, as I told you, a certain amount of agreement reached in regard to tea—for example the Mauritius Agreement.

The coconut community conducted discussions but no decisions were reached. If we can reach a point where the countries in our region—the rubber-producing countries, the tea-producing countries and the coconut-producing countries—could get together, then I think we will definitely benefit and we will be on the onward march. I want, again, to tell the Hon. Minister that this is something that is possible. This sort of economic groupings are taking place, they have taken place, and produced results ; and the people are enjoying the benefits. I think the Hon. Minister is genuinely interested in trying to set the plantation industry on a correct footing. Therefore, here is an opportunity. I have been trying to sell this idea right along, and I do not think I have succeeded so far ; but I am sure the Hon. Minister will take this up, because, to me, this is a reality and I have seen it work. Of course, the usual argument will be : Well, the UNCTAD is addressing its mind to this question, and so on. But it will take a very, very long time for the efforts of UNCTAD to bear fruit. Unfortunately, the UNCTAD is caught up so much in political problems that I do not see, in the near future, the UNCTAD living up to the aspirations on which it was built. That is a long-term plan. Let UNCTAD think of all the developing countries in the world. But let those countries in our region which are producing tea, rubber and coconut come to some sort of agreement, so that they will be able to get very much better prices. That is one thing I thought I might ask the Hon. Minister to look into.

The other thing is this : I remember that somewhere in the 1930s there was a commission appointed, namely, the Whitelaw-Perera Commission, that reported on the rubber industry.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)
That is out of date now.

හමීඩ් මයා.
(ஜனாப் ஹமீது)
(Mr. Hameed)
Maybe, but I have read it and there is one particular recommendation in which I am interested and which I may, for whatever it is worth, place before the Hon. Minister.

In our country legislation has always been aimed at preventing the fragmentation of estates. Why should we not think on the reverse ? The Whitelaw-Perera Commission made a very useful recommendation with regard to smallholdings, and they suggested the amalgamation of smaller estates of 100 to 300 acres. Some of these smaller estates do not have their own factories.—[*Interruption*]. That is what the Whitelaw-Perera Commission had at the back of their minds. After all, I think amalgamation is an aspect which is worth giving thought to, especially with regard to small rubber holdings. I still feel that some of these holdings are so small that they cannot be run as economic units. That is another matter which I thought the Hon. Minister may consider.

The other question, of course, is with regard to tea smallholders. I come from a province where tea smallholdings are rampant. Most of the tea smallholdings are in the Central Province where there are five-acre, eight-acre, ten-acre and twelve-acre holdings. The smallholders can neither keep nor run them ; they are in a dilemma. So something has to be done. My experience is that for the last ten years whenever we debated this question we only heard very, very

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[හමීඩ මයා.]

fiery speeches from both sides of the House and all kinds of solutions were advocated for the problems of the tea smallholders, but the tea smallholders are where they were and the speeches, of course, lie safely in HANSARD.

As I said, the Hon. Minister has the vision and the experience to grasp this problem. Now, what are we going to do with the tea smallholder? We have had tons of literature—commission reports, plans and so on—on this subject. The Five-Year Agricultural Plan of 1957 contained some fine recommendations with regard to these tea smallholders. But nothing has come of these reports and recommendations.

They have small plots ranging from eight to twelve acres as well as plots of two acres, one acre and half an acre. What are we going to do with them? The Hon. Minister must decide on a definite policy as to how we could help them. I am not suggesting any solutions because I think the more open your approach is so much the better. So much has been said on the Floor of this House about this question but nothing has come of it.

These smallholders are a very unfortunate lot. They can play an important role in the economy if they are given some kind of assistance, maybe to rehabilitate the same crop or to carry out some sort of diversification. Whatever it is, they can play a very important role in the village-level economy. This is another question the Hon. Minister must give his thought to and see whether something could be done.

Then, there is the question of tea and rubber prices. These prices are beyond our control. They go up and come down and we have no say in this process of price fluctuation.

With regard to non-traditional crops such as cinnamon, pepper and cardamom, I think in the whole world there are only seven countries where you get cinnamon. Now, these are crops for which there is no competition in the world market, for which there is at the present moment a growing demand in the world market. I would therefore suggest to the Hon. Minister that he should explore this whole field because the time may come when we may refer to tea and rubber as our non-traditional crops and to cinnamon, pepper and cardamom as our traditional crops.

එල්. සී. ද සිල්වා මයා.
(திரு. எல். சீ. த. சில்வா)
(Mr. L. C. de Silva)
They are quite traditional.

හමීඩ මයා.
(ஜனாப் ஹமீத்)
(Mr. Hameed)
There is a market for these products. What we ought to do is to sell the finished product. As it is, we are exporting these in bulk form. We have still not thought of giving them to the world in the form in which they want them. Perhaps there may be a better world market for some of these in oil form, in powder form or in some other form. I think these are questions worth examining because these products could turn out to be very good foreign exchange earners. Moreover, as I said earlier, this is a field in which you do not have to face a challenge from the world market, as in the case of rubber, which has to compete with artificial rubber, and tea, which has to meet the challenge from the various tea-growing countries. I am not for a moment saying that tea and rubber should be given up or ignored. Far from it. I have dealt with that aspect earlier. But these are crops for which there is no challenge and for which there is a demand.

Therefore I would urge the Hon. Minister to have a two-point programme. I think the Hon. Minister will have to evolve a policy to step up production, and, secondly, he must see that the finished product goes into

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

the market in the form in which it is required by the world market. I think that aspect has still not been explored.

I do not want to take much of the time of the House. There is one thing more I would like to say with regard to tea prices. In the States the coffee-drinking habit is dying because I think there is a school of thought that coffee drinking is not quite good for the health. There is a shift in the States to tea drinking, and I can tell the Hon. Minister from experience that there are a large number of countries in the world which do not know they have got our tea. That is because our tea is taken by other countries, blended and sold there.

Our tea, I think, needs a lot of advertisement. And speaking of advertising, I am reminded of a saying that in the modern world business without advertisement is like a wink at a girl in the dark. I think that sums up the whole story. It has nothing to do with the hon. Member for Balapitiya who spoke of beautiful girls at the Tea Centre !

What I am trying to say is that we need a very aggressive advertisement campaign the world over, and I think that if the Hon. Minister gives a certain amount of thought to it he can get these advertisements across without any cost to the Government. For instance, the leading business houses in the various capitals can be asked just to display a few packets of our tea. That could be done without any cost to the Government. Our tea needs advertisement.

In this connection I must also say that nowhere in the world can you buy the cheapest Ceylon tea at less than Rs. 20 a pound. I think this is a matter that merits looking into because we all know that the fortunes of our people, especially with regard to their economic upliftment, are tied up with the fortunes of tea, rubber and coconut. It is these products that bring us foreign exchange. If you look at the developing countries in the world you will find what the trend has been during the last five years. The trend has been that exports have dwindled while imports have increased; export prices have dwindled and import prices have increased. This is not peculiar to this country; it has been the dilemma facing the developing countries of the world today.

That is why I make this appeal to the Hon. Minister to explore, in the first instance, the possibility of getting the countries in our region, the rubber-producing countries, the tea-producing countries and the coconut-producing countries, to come to some common agreement so that we shall be able to dictate terms to the world market and not be dictated to by them. That is what is happening. So, if we succeed in arriving at a common agreement with these countries, I am sure that we shall be able to dictate to the world market, and the Hon. Minister would have played a very vital role in bringing about the necessary change.

අ. භා. 6.19

එදිරිසූරිය මයා.
(திரு. எதிரிசூரிய)
(Mr. Edirisuriya)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ලංකාවේ ආර්ථිකයට විශේෂයෙන් බලපාන අමාත්‍යාංශයක වැය ශීර්ෂයක් පිළිබඳව වචන සවලාපයක් පමණක් කථා කරන්නට මා බලාපොරොත්තු වෙනවා. අපට ලැබෙන විදේශ විනිමයෙන් වැඩිම ප්‍රමාණයක් නැත්නම් විශාලම ප්‍රමාණයක් අපට ලැබෙන්නේ තේ, පොල් හා රබර්වලින්. මෙයිනුත් වැදගත්ම ස්ථානයක් ගන්නේ තේ බව අප කවුරුත් පිළිගන්නවා. එහෙත් අභාග්‍යයකට මෙන් පසුගිය කාලී සීමාව තුළ අපේ තේ වෙළඳාමට නරක දසාවක් ලබා නිබෙනවා. අපේ තේ නිෂ්පාදනය පහත බැස්සාය කියන්නට කාටවත් බැහැ. එක්දහස් නවසිය පනස් ගණන්වල සිට අද දක්වා තේ නිෂ්පාදනය වැඩි වී නිබෙන බව අපි කවුරුත් දන්නවා. එක පැත්තකින් තේ නිෂ්පාදනය වැඩි කරන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එදිරිසූරිය මයා.]

විට අනික් පැත්තෙන් තේවල මිල පහළ බැසීම පුදුමාකාර අන්දමකින් සිදු වී තිබෙනවා.

1956 හෝ 1957 කාලයේදී තේ රාත්තලක් රුපියල් 3.50 කට කිට්ටු ගණන්වලට විකුණා තිබෙනවා. එහෙත් 1969-70 වන විට එක පැත්තකින් තේ නිෂ්පාදනය වැඩි වූ අතරම අනික් පැත්තෙන් තේවල මිල පහත බැස තිබෙනවා. නිෂ්පාදනය කොතරම් වැඩි කළත් ආදායමේ වෙනසක් ඇති වී නැහැ. මා හිතන හැටියට අද තේ රාත්තලක් රුපියල් 2.25 කට වැඩියෙන් විකිණෙන්නේ නැහැ. අපි තේ නිෂ්පාදනය දෙගුණයකින් වැඩි කරන විට සමහරවිට තේවල මිල තවත් පහළ බහින්නට පුළුවන්. වැඩි පුර විදේශ විනිමය ලබා ගැනීමටත් රට සංවර්ධනය කර ගැනීමටත් නම් අපි ඒ තත්ත්වයෙන් මිදෙන්නට ඕනෑ. එමෙන්ම රුපියල් 2.25 බැගින් අපේ තේ අරගෙන පිටරටවලට ගෙන ගොස් තුන් වැනි පන්තියේ තේ නිෂ්පාදනය කරන රටවලිනුත් තේ ලබා ගෙන ඒවා අපේ තේවලට මිශ්‍ර කර ලොකු මිල ගණන්වලට පිටරටවල විකුණනවා. සමහර විට එවැනි තේ රාත්තලක් පවුමකට නැත්නම් ඊට ටිකක් අඩු මිලකට විකුණනවා. අපේ තේවලට මීට වඩා සාධාරණ මිලක් ලබා ගන්නට පුළුවන් නම් විදේශ විනිමය වශයෙන් සැහෙන ආදායමක් ලබා ගන්නට අපට පුළුවන්කම ලැබෙනවා. අපේ තේවලට සාධාරණ මිලක් නොලැබුණත් පිටරටවල තේ බොන මිනිසුන්ටවත් අඩු මිලකට අපේ තේ ලැබෙනවා නම් හිත සහසා ගන්න පුළුවනි. එහෙත් අපට රුපියල් 2.25 ක් පමණ වන සුළු මිලක් ගෙවා ගන්නා අපේ ඉස්තරම් තේ වෙනත් බාල තේ වර්ග සමඟ මිශ්‍ර කොට විකුණන්නේ රාත්තලක් රුපියල් දහයකට නැත්නම් දොළහකටයි. අපේ තේ රාත්තලක් එංගලන්තයේදී රුපියල් 5 ක් වැනි මුදලකට පරිභෝගිකයන්ට විකුණන්නට කට යුතු සලස්වා ගන්නට පුළුවන් නම් ඒ හේතුවෙන් අපේ තේ බොන මිනිසුන්ගේ ගණනවත් වැඩි කර ගන්නට පුළුවනි. එහෙත් අපෙන් අසාධාරණ අඩුම මිලකට ගන්නා තේ, එංගලන්තයේදී අසාධාරණ වැඩි මිලකට පාරිභෝගිකයන්ට විකුණන නිසා අපේ තේ බොන මිනිසුන්ගේ ගණන සීමා වෙනවා. එක්කෝ අපේ තේ සඳහා අපට සාධාරණ මිලක් ලැබෙන්නට ඕනෑ. නැත්නම් එංගලන්තයේ පාරිභෝගිකයන්ට අඩු මිලකට තේ විකුණන්නට ඕනෑ.

ඒ හැරෙන්නට අපේ ඉස්තරම් තේවලට බාල වර්ගයේ තේ මිශ්‍ර කිරීමෙන් පසුවයි, "බ්ලෙන්ඩඩ් ටී" යන නමින් වැඩි මිලකට එංගලන්තයේ පාරිභෝගිකයන්ට විකුණන්නේ. සමහර විට අපේ ඉස්තරම්ම පිරිසිදු තේ බී පුරුද්දක් නැති නිසා, එවැනි මිශ්‍රණයක් නොකළොත් එංගලන්තයේ මිනිසුන් අපේ තේ නොබොන්නත් බැරි නැහැ. එහෙත් අනෙකුත් තේ නිෂ්පාදක රටවල් දැන් වැඩි වැඩියෙන් තේ නිෂ්පාදනය කරන නිසා, ටැඩියක් එම බාල තේ සමඟ අපේ ඉස්තරම් තේ මිශ්‍ර කිරීමෙන් අපේ තේවල හොඳ නමට කැළලක් ඇති වී අපේ තේ වෙළඳාමට පහරක් වදින්නටත් පුළුවනි.

අපේ ඉස්තරම් තේවල හොඳ නම ආරක්ෂා කර ගැනීම, අපේ තේවලට සාධාරණ මිලක් ලබා ගැනීම හා එංගලන්තයේ පාරිභෝගිකයන්ට දැනට වඩා අඩු මුදලකට අපේ තේ විකිණීම යන කරුණු තුනම ඉෂ්ට කර ගන්නට නම් කළ යුතු එකම දේ කෙළින්ම රජය තේ වෙළඳාමට බැසීමයි. එසේ නොකළොත් අපේ තේ බොන පිටරටියන් අඩු වීමෙන් හා හොඳ නමට කැළැලක් වීමෙන් අපේ තේ අලෙවිය පහළ බැසීමෙනුත්, අපේ තේ නිෂ්පාදකයන්ට එන්න එන්නම අඩු මිලක් ලැබීමෙනුත් යන දෙවිධියකින් පහර වදින අතර, එමඟින් රජයත් විදේශ විනිමය අතින් විශාල දුෂ්කරතාවකට මුහුණ පානවා. ඒ හැම පහරකින්ම බේරීම සඳහා නුදුරු අනාගතයේදීම තේ වෙළඳාම රජය අතට ගැනීමේ වැඩ පිළිවෙළක් සකස් කිරීම සඳහා මේ දක්ෂ ඇමතිතුමාට අප කාගේත් ආශීර්වාදය ලැබෙන බව ප්‍රකාශ කරමින් මගේ වචන සවලඝය අවසාන කරනවා.

අ. භා. 6.25

ගරු ආචාර්‍ය කොල්වින් ආර්. ද සිල්වා
(கௌரவ கலாநிதி கொல்வின் ஆர். த சில்வா)
(The Hon. Dr. Colvin R. de Silva)

නියෝජ්‍ය සභාපතිතුමනි, මට වැටහෙන හැටියට නම් අයවැය විවාදයේදී මගෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කෙරිය යුතුව තිබුණු කථාවක් මේ සාකච්ඡාව සම්බන්ධ පිළිතුරු කථාවේදී කරන්නට මට සිදු වී තිබෙනවා. අපේ ප්‍රධාන කෘෂිකාර්මික නිෂ්පාදනයන් වන තේ, රබර්, පොල් හා වෙනත් එවැනි වැදගත් නිෂ්පාදන සම්බන්ධයෙන් දෙපැත්තේම ගරු මන්ත්‍රීවරුන් ලොකු සැලකිල්ලකුත්, භයකුත් දක්වන බව මේ සාකච්ඡාවේදී මට පෙනී ගියා. එසේම ඒ ගැන උනන්දුවෙන් හා ඥානවන්තව ක්‍රියා කිරීමේ අවශ්‍යතාව ගැන දෙපැත්තේම ගරු මන්ත්‍රීවරුන් එකඟත්වයකටද පැමිණ තිබෙනවා. දෙපැත්තේම ගරු මන්ත්‍රීවරුන් මේ අවස්ථාව උපයෝගී කර ගනිමින් මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් ඉතා වැදගත් කරුණු ඉදිරිපත් කළ බව මා කියන්නේ අවංකවමයි.

PUBLIC LIBRARY
JAFFNA.

අළුත ඇති කළ මේ අමාත්‍යාංශයේ ඇමති ධුරය භාර ගත් දවසේ සිටම මා බොහොම ඕනෑකමින්, මේ ප්‍රශ්න ගැන සියලු දෙනාගේම මත ලබා ගෙන එවා කල්පනාවට ගනිමින් හා සන්සන්දනය කරමින්, ඒවා මඟින් කරුණු ඉගෙන ගනිමින් නිසි වැඩ පිළිවෙළවල් සකස් කිරීමට මගේ හිත දී තිබෙන බව කියන්නට කැමතියි. ඇත්ත කියනවා නම්, දේශපාලන වශයෙන් අපට විරුද්ධවාදීන් වන නොයෙක් අයගෙනුත් මට වැදගත් කරුණු, ආරංචි සහ උපදෙස් ආදිය මේ ප්‍රශ්නය ගැන ලැබී තිබෙනවා. නොයෙක් පැතිවල අය තමන්ට කරුණු තේරුණාට පසු, මම ඇත්ත ඇති සැටි දැනගැනීමටත් ඉගෙනීමටත් කැමති කෙනකු බව තේරුණාට පසු, මා වෙත පැමිණ සාමාන්‍යයෙන් විරුද්ධවාදීන් නොකියන දේවල් පවා මට ඉතාමත් විස්තර සහිතව කියා දී තිබෙනවා. මම ඒ සියලු දෙනාටම මෙතන ප්‍රසිද්ධියේම මගේ කෘතඥතාව ප්‍රකාශ කරන්නට කැමතියි. මට සහ මගේ පාර්ලිමේන්තු ලේකම්තුමාටත්, අප අමාත්‍යාංශයේ වැඩ කරන සියලුම නිලධාරීන්ටත් ඇත්තටම මේ ආණ්ඩුවෙන් භාර දී තිබෙන්නාවූ කර්තව්‍යයේ උතුම් භාවයට වඩා මේ කාලයේ ඇති තීරණාත්මක භාවය බොහොම හොඳට වැටහී ගොස් තිබෙනවා. ඒ නිසා මයි අපි ටිකක් ප්‍රවේසමින් ඉදිරියට පියවර ගැනීම්වලදී හැසිරෙන්නේ.

මේ රටේත් පිටරටවලත්, අප පෙරමුණේ රාජාසන කථාවවත් අපේ මැනිවරණ ප්‍රකාශනයවත් කල්පනාවට ගන්නවා නබා කියවලාවත් නැති අය පවා, මගේ දේශපාලන මත මොනවාදැයි ඉතා හොඳට ප්‍රසිද්ධ වී තිබෙන නිසා, මා අර ඉංගිරිසි උපමාවේ කියවෙන පිහන් සාප්පුවකට පැනපු ගොනා නැත්නම් හරකා වාගේ ක්‍රියා කරා විය යන බලාපොරොත්තුවෙන් සිටියා. එහෙත් අප රටේ තිබෙන ආර්ථික ක්‍රමයේ ඇත්ත පදනම වන, "ප්ලාන්ටේෂන් ඉන්ඩස්ට්‍රි" නමින් හඳුන්වන වතු යායවල්—අපේ වැවිලි කර්මාන්තයේ පදනම වන ඒ කොටස—ගැන කල්පනාකාරීව, ගන්න පියවර සාවධාන කරගෙන, ඊළඟ පියවර ගැනීම් අවශ්‍ය වන බව තේරුම් ගෙන, ඒවා සූදානම් නැතිව නිකම්ම පියවරක් ගැනීමේ ඇති අඥානවන්තකම තෝරා ගෙන, මම ටිකක් හිමින් ක්‍රියා කළ බව ඇත්තයි. ඒ සමගම මට ඇති වූ ඉක්මන් කමට මෙය ටිකක් පටහැනි වූ බවත් ඇත්තයි. ඒ කොයි හැටි වෙතත්, අන්තිමේදී අපි නියම ගමන පටන් අරන්, සියවරෙන් පියවර අරගනිමින්, එක් පියවරකින් ලැබෙන රුකුලෙන් ඊළඟ පියවර තවත් වේගවත් කරමින්, අපි කවුරුත් බලාපොරොත්තු වන අවසාන අරමුණ කරා අවසන් පියවර ගන්නා දවසටත් ඒ ඉල්ලුම්කරුවන්ම මා සමඟ ඒ ක්‍රියාවට ඉදිරිපත් වෙනවා ඇතැයි යන මගේ බලාපොරොත්තුව දැන්මම ප්‍රකාශ කරන්නට මට ඉඩ දුන්නොත් එහි වරදක් නැතැයි මා විශ්වාස කරනවා.

මම අද මතු වුණු ප්‍රශ්නවලින් තේ කර්මාන්තය ගැන තිබෙන්නාවූ සියලුම ප්‍රශ්නයන් ගැන යම්කිසි කරුණු වගයක් ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වෙනවා. ඒ, එක වචනයක් පැහැදිලිව ප්‍රාරම්භකව ප්‍රකාශ කිරීමෙන් පසුවයි. යමක් කර අවසන් වන තුරු නොසිට තමන් කරන්නට යන දේ ගැන කල් කියා කථා කිරීම සාමාන්‍යයෙන් ඇමතිවරුන් කරන මෝඩකමකැයි මා විශ්වාස කරනවා. වඩා හොඳ පිළිවෙළ නම් කළාම කළ බව කියන එකයි. මක්නිසාද? කරන්නට යන බව කලින් කියා කරන්නට ඉදිරිපත් වුණාම සමහරවිට කරන්ට හිතන විධියට කරන්ට බැරිවන අවස්ථාත් තිබෙන බව දැනගෙන ඕනෑ අපි වැඩ කරන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

3054

[ගරු ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා]

මුලින්ම ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා (ආචාර්‍ය ඩබ්ලිව්. දහනායක) මේ කාලයට බලපාන බොහොම වැදගත් ප්‍රශ්නයක් මතු කළා. ඒ ගැන පැහැදිලිව ප්‍රසිද්ධ වශයෙන් මේ අවස්ථාවේදී වචනයක් කියන්නට ඕනෑ. එනම්, සමගි පෙරමුණ, ජනතා රජය, සිය මැතිවරණ සහ රාජාසන්න කථා පොරොන්දු අනුව ඊශ්‍රායලයට විරුද්ධව යම්කිසි පියවරක් ගැනීම හේතුකොට ගෙන ඒ ආණ්ඩුවට පක්ෂපාත එංගලන්තයේ යම්කිසි යුදෙව් ව්‍යාපාරිකයන් පිරිසක් ඊශ්‍රායලය වෙනුවෙන් අප ආණ්ඩුවටත්, රටටත් ආර්ථික පැත්තෙන් බඩටත් සාක්කුවටත් දෙකටම පහරක් ගහන්නට ඉදිරිපත්වීමේ ප්‍රශ්නයයි. මේ ගරු සභාවට මතක ඇති, "මාක්ස් ඇන්ඩ් ස්පෙන්සර්" නමැති එක්තරා ව්‍යාපාරික සමාගමක් අප විසින් ගන්නා ලද ඒ පියවරට ඔවුන්ගේ විරුද්ධත්වය පෑම සඳහා ඔවුන්ගේ තේ පැකට්වල "ලංකාවේ තේ" කියන නම යෙදීම නවත්වන බවට තර්ජනය කළ බව. එවැනි තර්ජන දෙපැත්තකින් තිබුණු බවයි අපට ආරංචි වුණේ. එක සමාගමක් ගැන මා මෙතැන ප්‍රසිද්ධියේ ප්‍රශංසාත්මක වචනයක් කියන්නට ඕනෑ. එංගලන්තයේ අද තේ ව්‍යාපාරිකයන් අතරේ විශාලම වෙළඳාම තිබෙන්නේ "ජේ. ලයන්ස් ඇන්ඩ් කම්පැණි" නමැති සමාගමටයි. මේ ආරංචිය පිටවූ වහාම ඒ කොම්පැණිය පත්‍ර මාර්ගයෙන් දැනුම් දී බෙනවා, "ලයන්ස් සමාගම සිටින්නේ දේශපාලනයේ නොව බිස්නස්වල පමණයි" කියා. ඒ ගැන ඒ කොම්පැණියට මා ප්‍රසිද්ධියේ ප්‍රශංසා කරනවා. එහෙත් "මාක්ස් ඇන්ඩ් ස්පෙන්සර්" නමැති සමාගමත් "සැලිස්බරි කියන සමාගමත් තවත් මට මේ වේලාවේ නම මතක නැති සමාගමකුත්—

ගරු ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(கௌரவ கலாநிதி கொல்வின் ஆர். த சில்வா)
(The Hon. Dr. Colvin R. de Silva)

ටයිපූද කියා මට හරියට මතක නැති නිසයි මා ඒ නම කියන්ට අකමැති.

මා කලින් සඳහන් කළ සමාගම් දෙකත්, තවත් සමාගමකුත් ඔවුන්ගේ "ලංකාවේ තේ" කියන නම තිබෙන පැකට් "සුපර් මාකට්වලින්" ඉවත් කරන්නට තීරණය කළා. සියලු දෙනාටම සිය කැමැත්ත ඉෂ්ඨ කරන්නට අසීතියක් තිබෙන්නාක් මෙන් අපටත් ඒ ගැන ක්‍රියා කිරීමට අසීතියක් තිබෙන බව මාත් මතක් කළාට වරදක් නැහැ. එහෙත් ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා විශේෂයෙන් මතක් කළ ප්‍රශ්නය මෙයයි.

එය "සන්" පත්‍රයේ තිබුණු ආරංචියක්. පිට පිටම ලංකාවේ පැවති තේ වෙන්දේසි තුනකදී ඒ අයට මේ රටෙන් තේ මිළදී ගන්නා වූ ඒජන්තවරුන් තේ නොගෙන හිටියා නේද, එයත් ඔය කියන දේශ පාලන ව්‍යාපාරයේ පියවරක් නේද, කියන ප්‍රශ්නයයි එතුමා මතු කළේ. ඒ ගැන ප්‍රසිද්ධියේ යමක් කිවයුතු හෙයින් මම දැන් එය කියන්නම්. එක් දිනක් උදේ නැගිට මා "සන්" පත්‍රය කියවද්දී ඔය කියන දෙය එහි පළ වී තිබෙන බව දුටුවා. ඒ අනුව වෙනදාටත් වඩා වේලාසනින් මම මගේ කාර්යාලයට පැමිණ මට තිබෙන මාර්ගවලින් මට හැකි ඉක්මණින් එහි ඇත්ත නැත්ත ගැන සෝදිසි කර බැලුවා. එහි ඇත්තක් තිබුණා නම් ඊට සුදුසු ප්‍රතිප්‍රහාර ගසන්නට විධිය කුත් කල්පනා කරගෙනයි මා එදා මගේ ඇමති කාර්යාලයට ආවේ. එම ප්‍රතිප්‍රහාර කුමක්දැයි කරුණා කර මගෙන් අහන්නට එපා. එහෙත් කවරෙක් වේවා දේශ පාලනා කරුණු උඩ අපේ රටේ තේ වෙන්දේසි මාර්ගයෙන් අපේ රටේ තේ ධලටම පහර ගැසීම සඳහා කටයුතු කරනවා නම්, ඊට සුදුසු ප්‍රතිප්‍රහාර ගැසීමට ශක්තියක් මේ ආණ්ඩුවට තිබෙන බව දැනගත කටයුතු කරන ලෙස මා ඒ උදවියට මතක් කර දෙන්නට ඕනෑ.

ජී. ජේ. පාරිස් පෙරේරා මයා. (ජා-ඇල)
(திரு. ஜீ. ஜே. பாரிஸ் பெரேரா—ஜா-எல)
(Mr. G. J. Paris Perera—Ja-ela)
ටයිපූ—

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

එහෙත් එදා "සන්" පත්‍රයේ තිබුණු එම ආරංචියේ ඇත්තක් නොතිබුණු බව මා සන්තෝෂයෙන් දැනුම් දෙන්නට කැමතියි. එංගලන්තයේ යම්කිසි ගැනුම්කාරයන් කොටසක් වෙනුවෙන් ලංකාවේදී තේ ගන්නාවූ ප්‍රධානීන් තුන් දෙනෙක් විසින් ලංකාවේ තේ නොගත්තා වාගේ, ඒ තුන් වාරයේදීම කොච්චිවල තිබෙන වෙන් දේසිවලත් ඒ ජාතියේ එක තේ බිඳක් වත් අරගෙන නැහැ. කල්කටාවේත් අරගෙන නැහැ. එසේනම් එය ලංකාවට එල්ල කරපු ක්‍රියාවකැයි සඳහන් කරන්නට මට අයිතියක් නැහැ. මා සෝදිසි කළ අන්දමට දැනගන්නට ලැබුණු තොරතුරු අනුව මෙහි නියම තත්ත්වය තිබෙන්නේ වෙන තැනකයි.

මෑත කාලයේදී තේ පිළිබඳව සිත යොමු කරන්නාවූ මෙම ගරු සභාවේ මන්ත්‍රීතුමන්ලාට පෙනෙන්නට ඇති ගිය අවුරුද්දේ තේ මිලත් සමග දැනට පවතින තේ මිල සසඳා බලන විට එහි එක්තරා නැග්මක් පෙනෙන්නට තිබෙන බව. ඊට හේතුව වශයෙන් එක්තරා දෙයක් මතක් කර දිය හැකියි. කල්කටාවේ වරායේ ලොකු වැඩ වර්ජනයක් තිබුණා. ඇසැම්හි තේ වතුවලත් විශාල වැඩ වර්ජනයක් තිබුණා. එසේම අපේ ලංකාවේත් සුළු වශයෙන් වියලි සමයක් උදා වී තිබුණා. යටකී වැඩ වර්ජන දෙක නිසා විශේෂයෙන් තේ පිටවීම, පැටවීම, සහ ගෙන ඒම නැවතීම හේතු කොටගෙන විශාල වශයෙන් තේ තොග ගොඩගැසී තිබුණා. එම අවස්ථාවේදී එංගලන්තයේ යම්කිසි පිරිසක් කල්පනා කර තිබෙනවා, යටකී වැඩ වර්ජන අවසාන වූවායින් පසු කල්කටාවෙන් එහෙම විශාල ලෙස තේ පිට වන්නට ඉඩ තිබෙන නිසා තේ මිල පිටපිටම පහත බසීවිය කියා. ඒ ගැන බලාගෙන සිටීම නිසා විශෙෂයෙන් මේ තේ නොගත්තා යයි සිතන්නට හේතු තිබෙන බව මේ ගැන දන්න උදවිය මට විස්තර කර දී තිබෙනවා. එය ඇත්තක් වේවා, නැත්තක් වේවා, එකක් නම් පැහැදිලියි. තුන් පොළුම තේ නොගෙන සුමාන තුනාත් හිටියා නම් එය මේ යුදෙව් ප්‍රශ්නය වෙන්නට බැහැ.

පරිපූරක මුදල්

අපි නොයෙක් පැතිවලින් ප්‍රශ්නය මතු කර තිබෙනවා. එමනිසා මගේ අමාත්‍යාංශය කුමක්ද යන්නත් ටිකක් මතක් කළාට වරදක් නැතැයි මා සිතනවා. එසේ කරමින් තමුන්නාන්සේලාගේ සිත්වලට මේ මොහොතේම කාවදින ඉලක්කම් වගය කුත් ඉදිරිපත් කරන්නට මා කල්පනා කරනවා. මේ ඉලක්කම් සිංහලෙන් වාගේම ඉංග්‍රීසියෙනුත් ඉදිරිපත් කරන්නට මා අදහස් කරනවා. මක්නිසාද කියනවා නම්, මුළු ලංකාවටම මේක දැන ගන්නට සැලැස්වීම මගේ යුතුකමක් යයි මා සිතන නිසයි.

මගේ අමාත්‍යාංශයට ස්ථිරවම භාර නිෂ්පාදනයයි. ඒ නිෂ්පාදනය කරන ද්‍රව්‍යයන් ඉංග්‍රීසියෙන් කියනවා නම් "process" කරනවා; පාවිච්චියට සූදානම් කරනවා. ඒවා අවසානයේදී අලෙවි කිරීම මට ස්ථිර වශයෙන්ම භාර නැහැ. මම ඇත්ත කියන්නම්. මටත් ටිකක් අවුලක් මේක. ඕනෑම නිෂ්පාදනයක යෙදී සිටින කෙනෙකු, ඔහුගේ නිෂ්පාදනය කෙසේ සකස් කරනවාද, එය කොයි තරම් දුරට ගෙන යනවාද, එය කොයි ආකාරයට සකස් කරනවාද, මොන මොන විධියේ, මොන මොන ස්වභාවයන් ඇති ද්‍රව්‍යයන් නිෂ්පාදනය කරනවාද, ඉංග්‍රීසියෙන් කියනවා නම් මොන "qualities" සකස් කරනවාද යන්න දන්නවා. ඒවා තීන්දු කරන්නේ වෙළඳාම දෙස බලාගෙනයි. නමුත් වෙළඳාම බසිනවා නම් මම මෙතැන ඉඳගෙන නිෂ්පාදනය වැඩි කරන තරමට මම හානියක් කරන්නට පුළුවනි. අනික් අතට වෙළඳාම නැගිනවා නම් මා කල් ඇතිව මෙවැනි කාලයක් ගන්නාවූ වැවිලි ද්‍රව්‍ය සකස් නොකළා නම්, මා ඊට සූදානමින් නොසිටියා නම් ඒත් මම රටට කරන්නේ හානියක්.

මේ කරුණු දෙක ගැනම කල්පනා කර ගෙන දෙපැත්තෙන්ම මේ ඇවිදින්නාවූ පටු පාලමෙන් එක පැත්තකටවත් නොවැටී ගමන් කිරීමටයි, මට භාරවී තිබෙන්නෙ. එමනිසා සමහර අවස්ථාවලදී මේ මිල ප්‍රශ්නය ගැන මා දෙන්නාවූ උත්තර--එය වෙළඳ අංශය භාර ඇමතිතුමාට ස්ථිරවම භාර වෙනවාය කියනවා නොවෙයි—වෙළඳ ඇමතිතුමා සමගත් ඔහුගේ අමාත්‍යාංශය සමගත් කරන්නාවූ සාකච්ඡා හා සම්බන්ධතා අනුව එකතුවූ මත බව කරුණා කර සිතට ගන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

[ගරු ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා]

ලංකාවේ තේ මිල ප්‍රශ්නය දැන් අවුරුදු නවයක් දහයක් මුළුල්ලේ ඇත්තටම උග්‍ර වී ගෙන යන ප්‍රශ්නයක්. සෑම ආණ්ඩුව කටම ආණ්ඩුව ගෙන යන විට ඒ බව මතක් වෙනවා. සෑම විරුද්ධ පක්ෂයකටම තමන් ආණ්ඩු කළ කාලයේදී ඒ තත්ත්වය තිබුණු බව අමතක වෙනවා. ඒකයි ස්වභාව. ඒ කෙසේ වුවත් පසුගිය අවුරුදු නවයක දහයක කාලය මුළුල්ලේ තේ මිල ගැන බැලුවොත්, පරීක්ෂා කළොත්, ක්‍රමානුකූලව මිල පහළ බසින ගතියක් තිබෙන බව පෙනී යනවා. ඒක ඇත්තක්. අපේ රටේ තේ කර්මාන්තයේ අර්බුදයේ එක පැත්තක මුල එයයි.

නමුත් මෙතැන තවත් ප්‍රහේලිකාවක් තිබෙනවා. ජාත්‍යන්තර වෙළඳපොළේ බඩු මිල තීන්දු වන්නේ බඩු අඩු වැඩිවීම අනුවය කියා සමහරු කල්පනා කරනවා. බඩු වැඩි වුණොත් මිල බසිනවාය, බඩු අඩු වුනොත් මිල නගිනවාය, අර්ථ ශාස්ත්‍රයේ "අ" යන්න "ආ" යන්න එපමණය කියා සමහරු කල්පනා කරනවා. නමුත් අද ලෝකයේ වෙළඳපොළවල වැඩ කටයුතු කරන විධිය ගැන කල්පනා කරන විට එහෙම කල්පනා කිරීම ප්‍රමාණවත් නැහැ. අද ලෝක වෙළඳපොළේ විශාල ඒකාධිකාරී තත්ත්ව දරණ සමාගම් ගැණුම්කරුවන් වශයෙන් වැඩ කරනවා; ක්‍රියා කරනවා.

අපේ තේ ගැන කල්පනා කරනවා නම්, ලංකාවේ තේ වෙළඳපොළේ මේ වෙන්දේසිවල, නාමයට දහ පහළොස් දෙනෙකු තේ ගත්තාට, මගේ විශ්වාසයේ හැටියට ප්‍රධාන ගැනුම්කරුවන් හතර දෙනෙකු පමණයි ඉන්නෙ. ඒ හතර දෙනාට ඕනෑම විධියකට මේක හැඩගස්වන්නට පුළුවනි. ලන්ඩන් නගරයේ තේ වෙන්දේසියට පැමිණ තේ ගන්න ප්‍රධාන කොම්පැනි 4ක් සිටින බව තමුන්නාන්සේලාට පෙනේවි. අන්න එයයි ඇත්ත. අපේ රටේ ඉඩම් වෙන්දේසියකට—ගැනුම් කරුවන් 40 ක් 50 ක් එන්න ඕනෑ තැනකට—සල්ලි ඇති ගැනුම්කරුවන් එන්නේ තුන් හතර දෙනෙක් පමණක් නම්, ඒ තුන් හතර දෙනා ඊට කලින් දිනයේ රෙස්ට් හවුසියකට රැස්වී ඒ අය අතරේ කුමක් හෝ ගිවිසුමක් ඇති කර ගන්නා බව තමුන්නාන්සේලා දන්නවා ඇති. ඊට වඩා වෙනසක් ලන්ඩන

පරිපූරක මුදල්

යට පැමිණෙන ගැනුම් කරුවන් අතරේත් තිබෙනවාය කියා අපට සිතන්නා අමාරු වීම වරදක් නොවෙයි.

කෙසේ වුණත් පුදුම සිද්ධියක් පැහැදිලි කිරීම සඳහා මා මේ ගරු සභාවට ඉලක්කම් වශයක් කියවන්න සූදානම් වෙනවා. කරුණාකර මේ ඉලක්කම් සිතට ගන්න. 1969 දී මුළු ලෝකයේම තේ නිපදවන රටවල් අතුරෙන් ලංකාවේ තේ වලට ලැබුණේ ඉතාමත් පහත් මිලකුයි. ඇත්තෙන්ම කියනවා නම් ඒ අවස්ථාවේදී එදා සිටි ආණ්ඩුව තේ කර්මාන්තයට යම් යම් උදව් පදව් දීමට ඉදිරිපත් වුණා නම් අපේ රටේ තේ කර්මාන්තයට අද මුහුණ දීමට වී තිබෙන අපහසු තත්ත්වය ඇති වේවිද කියා සිතන්නත් අමාරුයි. 1969 දී තිබුණ තේ මිල—මාස් පතා තේ මිල—දළ වශයෙන් මම කියවන්නම්. 1969 ජනවාරි මාසයේ ලන්ඩන් නගරයේ අපේ තේ රාත්තලක් විකුණුණ මිල මම දැන් කියන්නම්. ලන්ඩන් නගරයේ වෙන්දේසිවල ලංකාවේ තේ රාත්තල පැන්ස $36\frac{1}{2}$ කට විකුණුනා. එය කරුණාකර සිතේ තබා ගන්න. ඊට අවුරුද්දකට පසුව, 1970 තේ මිල සෑහෙන විධියෙ නැගීමක් ඇති වී තිබෙනවා. 1970 ජනවාරි මාසයේ අපේ තේ රාත්තල ලන්ඩන් නගරයේදී පැන්ස 52 කට විකිණී තිබෙනවා. පැන්ස $36\frac{1}{2}$ පැන්ස 52 තෙක් ඉහළ ගොස් තිබෙනවා. ඒ විධියේ ඉහළ නැගීමක් ලන්ඩන් නගරයේ වෙන්දේසියේ සිදු වී තිබෙනවා. නමුත් කොළඹ තේ වෙන්දේසියේ මිල දෙස බලමු. 1969 ජනවාරි මාසයේ අපට රුපියල් 1.64 ක් ලැබුණ තේ රාත්තලට 1970 ජනවාරි මාසයේ ලැබුණේ රුපියල් 1.65 කුයි. මා හිතන හැටියට පැන්සයක් ශත 5 ක් නැත්නම් 6ක් පමණ වටිනවා. ලන්ඩන් නගරයේ පැන්ස $36\frac{1}{2}$ පැන්ස 52 තෙක් ඉහළ ගොස් තිබෙනවා. ඒ කියන්නේ පැන්ස $15\frac{1}{2}$ ක් වැඩි වුණා; ශත 75ක් පමණ වැඩි වුණා. නමුත් අපේ රටේ තේ ගණන වැඩි වුණේ ශතය කින් පමණයි. අපේ ආණ්ඩුව විසින් මේ අවුරුද්දේදී මුල් වරට අලුතින් ඇති කළ ඇමති අංශයෙන් කරන ලද පරීක්ෂණ වලින් සොයා ගන්නා ලද ඉලක්කම් ටික කුයි දැන් මේ තමුන්නාන්සේලා ඉදිරියේ මා තබන්නෙ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඊළඟට තවත් පුදුම දෙයක් තිබෙනවා. මෙම තේ පටවා පිටරට යවනවා. තේ පිටරට යවන විට ඒවායේ වටිනාකම ගැන රේගුවේ පොත්පත්වල සඳහන් වෙනවා. අපනයන බදු ගෙවීමෙන් පසුවයි පිටරට බඩු පැටවෙන්නෙ. 1969 දී පැන්ස $31\frac{1}{2}$ ට නැත්නම් රුපියල් 1.64 ට තිබුණ තේ එක යුනිට් එකක් නැවට පටවා අවසාන වන විට වැටුණ මිල රුපියල් 2.45යි. 1970 දී පැන්ස $15\frac{1}{2}$ ක් එංගලන්තයේ වැඩි වී, මෙහෙ යන්තම් ශතයක් විතර වැඩි වී තිබෙන විට, රේගුවේ සඳහන් වී තිබෙන ගණන ශත 6 කින් බැහැලා තිබෙනවා; එනම් රු. 2.39යි. කවුද මේ දෙකට මැද්දෙන් ඉඳගෙන මේවා සාක්කුවලට දාගන්නේ කියා සොයා බැලීමට අපි පරීක්ෂණයක් පටන්ගෙන තිබෙනවා. අසු වුණ දාට දඩුවම් දෙන්නට අපි සූදානම් විය යුතුයි. 1969 පෙබරවාරි මාසයේ එංගලන්තයේ ගණන පැන්ස $43\frac{1}{2}$යි; 1970 පෙබරවාරි මාසයේ පැන්ස $51\frac{1}{2}$යි. ඒ කියන්නේ පැන්ස 8ක් නැඟ තිබෙනවා. එහෙත් ලංකාවේ තත්ත්වය මොකක්ද? 1969 පෙබරවාරි මාසයේ රු. 1.72යි. 1970 පෙබරවාරි මාසයේ රු. 1.74යි. අතන පැන්ස 8ක් නගිද්දී මෙතන ශත 2යි. රේගුවෙ ගණන තවත් පුදුමයි. 1969 පෙබරවාරි මාසයේ රු. 2.42යි. දෙපොළෙම ශතයක් දෙකක්වත් නගින වෙලාවෙදි 1970 පෙබරවාරි මාසයේ රේගුවේ ගණන රු. 2.39යි. ශත 3ක් බැහැලා.

මේ සල්ලි කොහේද ගියේ? 1969 මාර්තු මාසයේ එංගලන්තයේ පැන්ස 42.3යි; 1970 දි පැන්ස 52.9යි. ඒ කියන්නේ පැන්ස $10\frac{1}{2}$ක් වැඩි වී තිබෙනවා. නමුත් අපේ රටේ වැඩි වී තිබෙන්නෙ කීයද? 1969දි රු. 1.66යි; 1970 දි රු. 1.78යි. ශත 12යි. එනම් පැන්ස 2ක් පමණයි. රේගුවේ පුදුම දෙයක්. මට පේන්නේ රේගුවේ සෑම වෙලාවෙම ගණන් බැහැලා තිබෙන බවයි. 1969 පෙබරවාරි මාසයේදී රේගුවේ ගණන රු. 2.53යි. එහෙත් 1970 දි අරෙහෙ ගණන නගිද්දී මෙහෙ රේගුවේ ගණන රු. 2.45යි. ශත 8ක් බැහැලා. කවුරු මොනවා කිව්වත්, මෙතන මොකක් හෝ හොරයක් යනවා. 1969 අප්‍රේල් මාසයේ එංගලන්තයේ පැන්ස 43.6යි; 1970 දි

පැන්ස $54\frac{1}{2}$යි. ඒ කියන්නේ පැන්ස 11කට වඩා—ශත 66කට වඩා—එහෙ නැග්ගා. අපේ රටේ 1969 අප්‍රේල් මාසයේ රු. 1.62යි; 1970 අප්‍රේල් මාසයේ රු. 1.75යි. ශත 13යි නැග්ගෙ; පැන්සයට ශතය පමණ බැගින්. මෙතන රේගුවේ තත්ත්වය මොකක්ද? 1969 අප්‍රේල් මාසයේ රු. 2.47යි; 1970 දී රු. 2.43යි. ශත 4ක් බැහැලා. මට පේන්නෙ හැම තිස්සෙම මුහුදෙ ගිලෙනවා වගෙයි.

1969 මැයි මාසයේ එංගලන්තයේ පැන්ස 48.9යි; 1970 පැන්ස 57.8යි. පැන්ස 9ක් වැඩි වී තිබෙනවා. අපේ රටේ 1969 මැයි මාසයේ රු. 1.40යි; 1970 රු. 1.62යි. අනේ අපට ටිකක්වත් ලැබී තිබෙනවා. ශත 22ක් ලැබී තිබෙනවා. රේගුවේ තත්ත්වය මොකක්ද? 1969 මැයි මාසයේ රු. 2.41යි. මේ සැරේ ශත 8ක් වත් නැගලා, 1970 දී රු. 2.49ක් වී තිබෙනවා. 1969 ජූනි මාසයේ ලන්ඩන් නගරයේ වෙන්දේසියේ අපේ ලංකාවේ තේ රාත්තලක ගණන පැන්ස $52\frac{1}{2}$යි. 1970 දී පැන්ස 55.9යි. අපේ රටේ 1969 ජූනි මාසයේ රු. 1.27යි. 1970 දි රු. 1.53යි. අනේ ටිකක් හරියට ගණන ඇවිත් තිබෙනවා. නමුත් රේගුවේ 1969 ජූනි මාසයේ රු. 2.35යි; 1970 දි රු. 2.40යි. අතන අවිචර වැඩි වෙද්දී මෙහි ශත 5ක් පමණක් වැඩි වෙලා තිබෙනවා. 1969 වර්ෂයේ ජූලි මාසයේදී එංගලන්තයේ තේ වෙන්දේසියේදී ලංකා තේ රාත්තලක මිළ පැන්ස 51යි. 1970 ජූලි මාසයෙදී පැන්ස 53.2යි. ඒ කාලය තුළ අපේ රටේ තේ රාත්තල රුපියල් 1.32 සිට 1.71 දක්වා නැඟ තිබුණා. මෙතැනදී රේගුවේ යන්තම් ටිකක් සතුටුදායක තත්ත්වයක් පේන්නට තිබෙනවා. 1969 දී රුපියල් 2.11යි. 1970 රුපියල් 2.36යි. මේ සියල්ල එකතු කර ගණන හැදූ විට 1969 දී පැන්ස 47.3ට තිබුණු තේ රාත්තල 1970 ඒ මාස හතර තුළ පැන්ස 54.1ක් වුණා. ඒ කියන්නේ පැන්ස 7කට ටිකක් අඩු වූ වැඩි වීමක් ඇති වී තිබෙනවා. එහෙත් ලංකාවේ තේ රාත්තලක මිළ රුපියල් 1.52 සිට රුපියල් 1.67 දක්වායි නැඟ තිබෙන්නෙ. රේගුවේ නැඟ තිබෙන්නේ රුපියල් 2.39 සිට 2.42 ටයි. පෙනෙන්නේ තුට්ටු දෙකක නැග්මක් පමණයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

[ගරු ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා]

මේ ගණන් හිලව් දෙස බලන විට පෙනී යන්නේ කවුරුන් හෝ බලසම්පන්න කොටසක් එක එක තැන සිට අපේ රට නැති වන ආකාරයේ සෙල්ලමක් දිගටම කරන බවයි. මේ විධියට අපේ බෙල්ල මිරි කන්නේ කවුරුන්දැයි සොයා ගෙන, සමා දානයෙන් ඒ මිරිකන අත බුරුල් කරන්නට බැරි නම් අපට තිබෙන ශක්තිය පාවිච්චි කරමින් ඒ අත කඩන්නටත්, එසේ ඒ අත කඩන්නට බැරි නම් එහි ඇඟිලි තුඩු තුවාල කිරීමටත් ඉදිරිපත් වීම මගේ ඇමති අංශයටත් අපේ විදේශ වෙළඳ කටයුතු භාර ඇමති අංශයටත් අදාළ කර්මාන්තය සම්බන්ධයෙන් කරන්නට ඇති කටයුතු අතර ප්‍රධානම කටයුත්ත කියි මා විශ්වාස කරනවා. වෙළඳ පොළේදී මේ විධියට කථා කිරීම වැරදි යයි කවුරුන් හෝ කල්පනා කරනවා නම්, මේ බෙල්ල මිරිකීම ඊට වඩා නරක බව ඒ අය මතක තබා ගන්නට ඕනෑ. අපේ රටේ කර්මාන්තයට සම්බන්ධ මුළු වෙළඳ ක්‍රමයේ කොහේ හරි වැරදි වගයක්, අඩු පාඩු හා දුර්වලකම් කිපයක් තිබෙන බව මේ ඉලක්කම්වලින් අපට පෙනී යනවා. මේ අඩුපාඩුකම්, මේ දුර්වලකම් තිබෙන්නේ මොන මොන තැන්වලදැයි මා විරුඬ පාර්ශ්වයේ සිටින කාලයේදී කළ කථාවලින් සැක සහිතව පෙන්නා දුන්නා. එදා මා විරුද්ධ පාර්ශ්වයේ සිටිමින් සැක කළ කාරණා හරි බව අද මට කියන්නට ශක්තිය තිබෙනවා. ඒ සැක සහිත කාරණා හරි බව අද ඔප්පු වී තිබෙනවා. මා මේවා ගැන කළයුතු ක්‍රියාව කුමක්දැයි කල්පනා කරන විට නොයෙක් පැතිවලින් නොයෙක් ක්‍රියා වුවමනා බව මතක් කරන්නට සතුටුයි. එහෙත් ගන්නා පිය වරවල් ගන්නා තුරු ඒවා ගැන වැඩිය කථා කිරීම නුවණට හුරු නැතැයි මා හිතනවා. අපට කරුවලේ ගහද්දී අප එළියක් පත්තු කරගෙන ගහන්නට ලෑස්ති වන විට, අප පාවිච්චි කරන්නට යන්නේ කුමන එළියදැයි කලින් ප්‍රකාශ කළහොත් අපේ ඒ එළියටත් පහර ගසා නැවතත් අප කරුවලටම දාන්නට ඉඩ තිබෙන නිසා, මේ අංශයේ මේ පැත්තෙන් ගන්නා පියවරවල් බොහොම ප්‍රවේසමෙන් කල්පනාකාරීව ගත යුතුයි.

කල් තැබීම

කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා
(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

ගරු ඇමතිතුමා තව හුගක් වේලා ගන්නවාද?

ගරු ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(கௌரவ கலாநிதி கொல்வின் ஆர். த சில்வா)
(The Hon. Dr. Colvin R. de Silva)

ඉදිරිපත් කරන ලද කාරණාවලට පිළිතුරු දිය යුතු නිසා විවාදය හෙටට කල් දැමීම සුදුසුයයි මා කල්පනා කරනවා.

එකල්හි වේලාව අ. භා. 7 වූයෙන්, කටයුතු අත්හිටුවා විවාදය කල් තබන ලදී.

එතැන් සිට විවාදය 1970 සැප්තැම්බර් 11 වන සිකුරාදා පවත්වනු ලැබේ.

அப்போது பி. ப. 7 மணியாகிவிடவே சபையின் நடவடிக்கைகள் இடை நிறுத்தப்பட்டு, விவாதம் ஒத்திவைக்கப்பெற்றது.

1970 செப்ரம்பர் 11, வெள்ளிக்கிழமை விவாதம் மீள ஆரம்பமாகும்.

It being 7 P.M., Business was interrupted, and the Debate stood adjourned.

Debate to be resumed on Friday, 11th September 1970.

කල් තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

යෝජනාව ඉදිරිපත් කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී:

"මන්ත්‍රී මණ්ඩලය දැන් කල් තැබිය යුතුය".—[ගරු ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා].

"சபை இப்பொழுது ஒத்திவைக்கப்பெறுமாக" [கௌரவ கலாநிதி கொல்வின் ஆர். த சில்வா] எனும் பிரேரணை பிரேரிக்கப்பட்டு, விஞ்ஞை எடுத்தியம்பப்பெற்றது.

Motion made, and Question proposed,

"That the House do now adjourn".—[*The Hon. Dr. Colvin R. de Silva*].

හේමචන්ද්‍ර සිරිසේන මයා.
(திரு. ஹேமச்சந்திர சிறிசேன)
(Mr. Hemachandra Sirisena)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසුගිය දිනක මේ ගරු සභාවේ නැගූ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් අපේ ගරු අගමැතිනිය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කියා ඇති කරුණක් ගැන ප්‍රශ්නයක් අසන්නට කැමතියි. මගේ ඡන්ද කොට්ඨාශයේ වැරැල්ලගම ඉතාමත්ම වැදගත් පවුලක විශාල ඥාති සම්බන්ධකම් ඇති උගත් තරුණයෙක් ඉතියෝපියාවේ ගුරු තනතුරක යෙදී සිටින අතර ඒ මහත්මයා විසින් ප්‍රවෘත්ති පත්‍රයක පළ කරන ලද ලිපියක් කරණකොටගෙන ඉතියෝපියාවේ රජය නීත්‍යානුකූලව ඔහුට දඬුවම් දී හිර අඩස්සියට පත් කර තිබෙන කාරණය ගැන ගරු අගමැතිනිය ප්‍රකාශ කළා, එතුමිය ලුසාකා සම්මේලනයට සහභාගි වන්නට බලාපොරොත්තු වන නිසා එතුමිය එහි සැපත් වූ විට ඉතියෝපියා රජයේ රාජ්‍ය නායකයින් සමග සාකච්ඡා කර නන්ද රණවීර නමැති එම තරුණයා නිදහස් කර ගැනීමට උත්සාහ කරන බවට. එතුමිය එවැනි ප්‍රතිඥාවක් දුන්නා. ඒ අනුව ගරු අගමැතිනිය කිසියම් පියවරක් අරගෙන තිබෙනවා නම්, ගනු ලැබූ ඒ පියවර පිළිබඳව කිසියම් තොරතුරක් ගරු රාජ්‍ය නායකතුමාට හෝ ගරු අගමැතිනියගේ පාර්ලිමේන්තු ලේකම්තුමාට හෝ ලැබී තිබෙනවා නම් එය මේ ගරු සභාවට හෙළි කරන්නය කියා මා ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිනවා. නන්ද රණවීර මහතා පිළිබඳව උද්ගත වී ඇති තත්ත්වය ගැන ගරු අගමැතිනිය කොතරම් දුරට ක්‍රියා කර තිබෙනවාද යන බව කරුණාකර මේ ගරු සභාවට ප්‍රකාශ කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)
පත්තරේ තිබෙනවා නිදහස් කළා කියා.

අ. භා. 7.5

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டபிள்யு. தஹநாயக்க)
(Dr. W. Dahanayake)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉතා මත්ම වැදගත් සහ අවශ්‍යම ප්‍රශ්නයක් ගරු නැපැල් ඇමතිතුමාගෙන් අහන්නට කැමතියි; නැත්නම් නැපැල් ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් අහන්නට කැමතියි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තමුන්නාන්සේට මතක ඇති මා මෙම ගරු සභාවේදී ප්‍රශ්නයක් ඇසූ බව, විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු අංශයට ශිෂ්‍යයින් ගැනීමේ විභාගය ගැන. ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ නියමය අනුව ඒ ගැන දැන් වැදගත් සෝදිසියක් කරගෙන යනවා. එමෙන්ම වැදගත් ප්‍රශ්නයක් තැපැල් ස්ථානාධිපතිවරුන් සහ සංඥකරුවන් බඳවා ගැනීමේ විභාගය ගැනත්—Postmasters and Signallers Examination—අහන්නට සිදු වී තිබෙනවා. ඒ විභාගයේ ප්‍රතිඵල නිකුත් කරන්නට දැන් ඔන්න මෙන්න කියලයි තිබෙන්නේ. හෙට අනිද්දා ප්‍රතිඵල නිකුත් වේවි. එහෙත් ඒ විභාගය පිළිබඳව භයානක ආරංචියක් ලැබී තිබෙනවා. එනම්, ඒ විභාගයේ ප්‍රතිඵල අනුව උසස්ම ලකුණු අරගෙන ඉහළින් සමත් වී සිටින ශිෂ්‍යයින්ගෙන් සියයට 75 ක් හෝ 80 ක් පමණම ද්‍රවිඩ ජාතිකයින්ය කියා දැනගන්නට ලැබී තිබෙනවා. එහෙනම් මේ ප්‍රතිඵල අනුව තැපැල් ස්ථානාධිපතිවරුන් හා සංඥකරුවන් සිය යක් බඳවා ගන්නවා නම් එයින් 80 ක් පමණම ගන්නට වන්නේ ද්‍රවිඩ ජාතිකයින්ගෙන්. එවිට සිංහල හා අනෙකුත් ජාතීන් අතරින් ගැනෙන්නේ 20 ක් පමණයි. දෙසීයක් ගත්තත්, පණහක් ගත්තත් ඒ අසාධාරණය ඒ විදියට සිදු වෙනවා.

මා ජාති භේදය අවුස්සනවාය යි සමහරකුට හිතෙන්නට පුළුවනි. එහෙත් මා කරන්නේ ජාති භේදය ඇවිස්සීමක් නොව විශේෂයෙන් සිංහලයන්ට සිදු වන්නට යන අසාධාරණයක් පෙන්වා දීමක් බව තැපැල් හා විදුලි සන්දේශ කටයුතු පිළිබඳ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්තුමාට පෙන්වා දෙන්නට කැමතියි.

රජයේ සේවකයන් බඳවා ගැනීමේදී සිංහල හා දෙමළ යන මාධ්‍ය දෙකින්ම විභාග පැවැත්වෙන බව තමුන්නාන්සේලා දන්නවා. ඒ විභාග සඳහා සිංහලයන්ට හා සිංහල ඉගෙන ගත් අයට සිංහල මාධ්‍යයෙන් පෙනී සිටිය හැකි අතර, ද්‍රවිඩයන්ට දෙමළ මාධ්‍යයෙන් පෙනී සිටින්නට ඒ අනුව පුළුවන්කම ලැබී තිබෙනවා. එසේ මාධ්‍ය දෙකකින් ලියවෙන උත්තර පත්‍ර පරීක්ෂා කිරීමට යැවෙන්නේ එකම පිරිසකට නොව දෙපිරිසකටයි. එහෙත් මාධ්‍ය දෙකකින් සැපයුණු මේ උත්තර පත්‍ර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavahaham.org

කල් තැබීම

[ආචාර්ය ඩබ්ලිව්. දහනායක]

පරීක්ෂා කරන දෙපිරිස ඒවාට ලකුණු දෙන්නේ දෙවිදියකටයි. මාධ්‍ය දෙකේම උත්තර පත්‍රවලට සමාන විධියට ලකුණු දැමීමේ ක්‍රමයක් තවම ඇති කර නැහැ. එම නිසා ද්‍රවිඩ මාධ්‍යයෙන් උත්තර සැපයූ අයැදුම්කරුවන්ට අයුක්ති සහගත ලෙස වැඩි ලකුණු ලැබෙන බවට චෝදනාවක් තිබෙනවා. ඒ හේතුවෙන්, අයැදුම්කරුවන් අතුරින් දෙසීය දෙනකු බදවා ගත හොත් ඉන් 140 ක්ම ද්‍රවිඩ මාධ්‍යයෙන් පිළිතුරු සැපයුවන් වීම වළක්වන්නට අමාරුයි. සියයක් බදවා ගතහොත් ද්‍රවිඩ මාධ්‍යයෙන් පිළිතුරු සැපයුවන් 75 ක් පමණ තේරෙනවා. මෙසේ මාධ්‍ය දෙකින් සැපයෙන උත්තර පත්‍ර අසාධාරණ ලෙස සමාන්තර විධියට පරීක්ෂා නොකොට සමානව පරීක්ෂා කිරීමට වැඩ පිළිවෙළක් සකස් කරන්නට ඕනෑ. එසේ සමානව උත්තර පත්‍ර පරීක්ෂා නොකිරීම නිසාමයි, ද්‍රවිඩ මාධ්‍යයෙන් පිළිතුරු සැපයූවන් සියයට 80 ක් පමණම තේරෙන්නේ.

ලකුණු දැමූ ක්‍රමය පිළිබඳව කිසිම වග විභාගයක් නොකොට ඇස්කන් පියාගෙන මේ ප්‍රතිඵල ලේඛනය පිළිගන්නා ලෙස සමහරුන් කියන්නට පුළුවනි. එහෙත් මා කලින් විස්තර කළ පරිදි අසාධාරණ අන්දමට දෙවිධියකට ලකුණු දමා තිබෙන නිසා, එකම ක්‍රමයකට මේවාට ලකුණු දමා ඒ අනුව සකස් කරන ප්‍රතිඵල ලේඛනය අනුව ඒ සේවකයන් බදවා ගන්නා ලෙස මා ඉල්ලා සිටිනවා. මුළු සංඛ්‍යාවෙන් සියයට 80 ක් පමණම ද්‍රවිඩ මාධ්‍යයෙන් පෙනී සිටියවුන් අතුරින් තේරෙන මේ අසාධාරණ සමාන්තර ක්‍රමයට ඒ පත්වීම් දුන් නොත්, එය බරපතල අයුක්තියක් බව මා තරයේම කියා සිටිනවා.

අ. භා. 7.12

කේ. ඩබ්ලිව්. දේවනායගම් මයා. (කල්කුඩා)

(திரு. கே. டபிள்யு. தேவநாயகம்—கல்குடா)

(Mr. K. W. Devanayagam—Kalkudah)

Mr. Deputy Chairman, I should like to raise a very important matter regarding the communal trouble that is now going on at Eravur.

කල් තැබීම

The incident is said to have arisen out of the town council elections. Many people on both sides—Tamils and Muslims—have been injured, and I believe one person has been done to death. Furthermore, extensive damage has been caused to the Muslims living in that area.

The reason why I want to raise this matter is to bring to the notice of this House the cause of this communal trouble.

After the 1970 General Election, in the Batticaloa area there was trouble generally among the Muslim community. The Muslims of Kattankudy were persecuting the Muslims of Eravur and *vice versa*. There were a number of Muslims from Kattankudy living at Eravur. Their houses and boutiques were burnt, and their boutiques were looted. Up to now, however, not a single person has been arrested even on suspicion.

The cause of all this is that the defeated candidate has been given the power to transfer police officers immediately after the General Election. Not only did he transfer them, but when they fell at his feet he immediately cancelled the transfers. Thereafter they became his slaves.

He persecuted the entire Kattankudy Muslim community of fifteen families who were living in Eravur, the area of this candidate who happened to contest this election. The police were unable to do their duty through fear that they would be transferred or otherwise victimized.

This general build-up erupted when this same gentleman, Mr. M. C. Rahuman, contested the town council elections. At the close of the election somebody had thrown a stone at his car. The name of a very respectable Tamil gentleman was given, and he was arrested and taken to the police station. When people went to bail him out, what did the police say ? They said, " Go and fall at the feet of Mr. Rahuman and beg his pardon if you want him to be released on bail. " They were so indignant that they started assaulting one

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

another. In this way a wedge was driven between the Muslims and the Tamil communities who had been living for hundreds of years in peace and amity.

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டபிள்யு. தஹநாயக்க)
(Dr. W. Dahanayake)
A party clash.

දේවනායගම් මයා.
(திரு. தேவநாயகம்)
(Mr. Devanayagam)
Not a party clash. It was a party clash that developed into a communal clash.

What has happened now is that the entire Muslim community has suffered. Extensive damage has been done to their property.

Apart from this, I would like to raise a very serious constitutional issue on this matter. When a defeated candidiate—he is therefore not an elected Member of this House—is given power and rights over elected Members of other constituencies, what is the position of Members of this House ?—[*Interruption*]. That does not matter. I am not concerned about it. I do not care what my party did. I am going on the principles which I hold. When we speak about transfers you throw that charge at us.

After the 1965 elections I was the one Member who did not have a single person who worked against me transferred. Even in 1970 it has been so, but now everyone has been transferred out. That is a different matter. —[*Interruption*]. I do not care what my party did, but I go upon the principles which I hold.

Apart from this, we come into this House as Members elected by the people and when you want to create a Republic you invite us to the Constituent Assembly because we are Members elected by the people. The one basic principle here is that you go from the voter to the Member. Without that this House has no existence. If in theory that principle is recognized, I should like to know what in practice is the principle that you are going to follow ? Today you are going to provide a Constitution—a very serious thing—and everybody is looking up to it. They hope that in that Constitution you will enshrine all freedoms and liberties. But if you recognize a defeated candidate, who has no standing in a democratic set-up, and if he is allowed to come up against elected Members and get people transferred while there is a Member for that constituency, then you will be creating situations like what we are now experiencing in this area. I can tell you that by discrediting a democratic principle you will only create a situation where the entire community can flare up.

This is what I would most emphatically wish to point out, and I hope the Acting Head of the Government will take serious note of this problem and find a solution to it.

Apart from that, because the Muslim people in that area cannot get the defeated candidate to plead for them, I have to plead for them. They have suffered extensively and their stacks have been burnt. I hope they will be given some remedy.

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டபிள்யு. தஹநாயக்க)
(Dr. W. Dahanayake)
The appropriate remedy is to abolish the party system.

අ. භා. 7.19

අසිස් මයා.
(ஜனாப் அஸீஸ்)
(Mr. Aziz)
Mr. Deputy Chairman, I have to draw the attention of the hon. Parliamentary Secretary to the Minister of Defence and External Affairs to a very serious matter that has taken place in the Badulla area, on an

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අසිස් මයා.]

estate called Keenagala Estate. On this estate there was a strike for a considerably long period. The members of the Ceylon Workers' Congress on one of the divisions of the estate returned to work and as a result of that—at least that is what the police appear to say—the management invited police protection to be given to the estate.

Sir, it may not be out of place to mention here that unfortunately in Ceylon this is the third occasion on which, because the C.W.C. members have tried to break a strike, workers have been killed by police action. But it may not be very necessary for me to dwell upon the C.W.C. while referring to this question of police firing at Keenagala Estate.

When I met the Superintendent of Police I pointedly asked him whether there was any report or complaint of an assault on a worker by a non-worker. I was told that there were reports of intimidation but no report of actual assault. In spite of that a police party consisting of a baton party, a tear-gas party, and a rifle party went in a van to the estate. On the estate, the workers lay down before the van and told the police that whatever force was already on the estate was enough and it was not necessary for any more police to come to the estate. Despite the pleading by the workers, the first remedy which the police had at their disposal, the baton charge, they did not use. They resorted to tear gas and thereafter they resorted to shooting. As a result of this shooting one worker died and another was seriously injured, and he too died the next day.

On this matter some representations have already been made to the Hon. Prime Minister also by the union that was concerned in the strike. What is horrible about this matter is this. The dead bodies of the workers who died in the Badulla Hospital were not handed over to the parents or relatives but were taken by the police and buried in the Badulla cemetery.

I wish to know from the hon. Parliamentary Secretary why it is that every time, wherever it is, in matters pertaining to estate workers the bullets rain on the workers unnecessarily? This is not the first time that it has happened. It has happened several times. Whenever an estate superintendent wants to break a strike, the easiest thing for him to do is to ask the police to come to the spot. The police then come to the estate and frighten the workers. There have also been complaints that fowl belonging to the workers have been stolen by police personnel for the purpose of feeding themselves.

This is a horrible state of affairs, and I would like the hon. Parliamentary Secretary to look into it, because I feel that the shooting was unjustified and the killing of the workers more unjustified. What was horrible was the fact that the dead bodies of these workers were not handed over to the relatives. I would ask the hon. Parliamentary Secretary to give us an explanation on this matter. I wish to tell the hon. Parliamentary Secretary that this is a very, very serious matter and, therefore, my organization demands that there should be a commission of inquiry to go into this matter, because, unless these matters are brought to light and made public, the easy summoning of police to the estates and the use of bullets will not stop. Therefore I request the hon. Parliamentary Secretary to consider the question of appointing a commission to look into this matter.

අ. භා. 7.24

එල්. සී. ද සිල්වා මයා.

(திரு. எல். சீ. த சில்வா)

(Mr. L. C. de Silva)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ආණ්ඩුව පිහිටුවනු ලබනවාත් සමගම එතෙක් වෘත්තීය සමිති නොතිබුණු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කම්කාන්තශාලා බොහොමයකම කම්කරුවන් වෘත්තිය සමිති පිහිටුවන්නට පටන් ගත් බව තමුන්නාන්සේ දන්නවා ඇති. එහෙත් අද වෙලා තිබෙන්නේ කුමක්ද? අද ඒ ආයතනවල වෘත්තිය සමිති පිහිටුවන්නට කටයුතු කළ කම්කරුවන් සියලු දෙනාම දොට්ට දමන්නට පටන් ගෙන තිබෙනවා.

බෙන්තොට ඉලස්ටෝ කර්මාන්ත ආයතනයේ අවුරුදු ගණනාවක් තිස්සේ වෘත්තිය සමිතියක් පිහිටුවන්නට බැරිව තිබුණු නමුත් මේ ආණ්ඩුව බලයට පත් වුණාට පස්සේ, තමන්ට මේ ආණ්ඩුවෙන් නිසි ආරක්ෂාව ලැබේය යන විශ්වාසය උඩ, පසුගිය අගෝස්තු 15 වැනිදා ගරු වැව්ලි කර්මාන්ත ඇමතිතුමාගේ ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගේද සහ භාෂිත්වයෙන් විශාල රැළියකුත් පැවැත් වූවා. ඊට පසු කම්කරුවන් විශාල සංඛ්‍යාවක් කිසිම හේතුවක් නැතිව ඒ ආයතනයෙන් දොට්ට දමා තිබෙනවා.

මා නියෝජනය කරන අම්බලන්ගොඩ මැතිවරණ කොට්ඨාශයේ මීටියාගොඩ වීවිං මිල්ස් කර්මාන්ත ආයතනයේ වෘත්තිය සමිතියක් ඇති කළා. ඒ සමිතියේ නිලධාරීන් සියලු දෙනාම කිසිම හේතුවක් නැතිව දොට්ට දමා තිබෙනවා. කොළඹ යුනයිටඩ් මෝටර්ස් නැමැති වෙළෙඳ ආයතනයේත් මෙවැනි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. මෙවැනි තත්ත්වයක් තව දුරටත් ඇති වෙන්නට ඉඩ දුන්නොත් අපේ රටේ වෘත්තීය සමිති ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම නැති වන්නට පුළුවනි. ඒ නිසා මේ ගැන ගරු කම්කරු ඇමතිතුමාගේ අවධානය යොමු කළ යුතුව තිබෙනවා. මේ ප්‍රශ්නය ගැන දැඩි ක්‍රියා මාර්ගයක්—කම්කරුවන් සහ වෘත්තීය සමිති ආරක්ෂා වන අන්දමේ ක්‍රියා මාර්ගයක්—ගන්නා ලෙස මම ඉල්ලා සිටිනවා. මේ ගැන ගරු කම්කරු ඇමතිතුමාට දන්වන මෙන් මම එතුමාගේ ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් අවධාරණයෙන්ම ඉල්ලා සිටිනවා.

අ. භා. 7.28

ලක්ෂ්මන් ජයකොඩි මයා. (අග්‍රාමාත්‍ය, රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)

(திரு. லக்ஷ்மன் ஜயகொடி—பிரதம அமைச்சரதும் பாதுகாப்பு, வெளிவிவகார அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசி)

(Mr. Lakshman Jayakody—Parliamentary Secretary to the Prime Minister and Minister of Defence & External Affairs)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු කර්මාන්ත ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමාත්, ගරු කම්කරු ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමාත් නන්දරණවීර මහත්මයා සම්බන්ධයෙන් ඉදිරිපත් කළ කාරණය පිළිබඳව මීට පෙරත් ගරු අගමැතිනියට වරින්වර මතක් කර තිබෙන බව තමුන්නාන්සේට මතක ඇති. මේ කාරණය පසුගිය 20 වැනිදා විරුද්ධ පාර්ශ්වයේ ගරු නායකතුමා ඉදිරිපත් කළ අවස්ථාවේ ගරු අගමැතිනිය මේ ගැන සොයා බලන බවටත්, රණවීර මහත්මයා නිදහස් කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන බවටත් පොරොන්දු වූ බව තමුන්නාන්සේට මතක ඇති. ඒ පොරොන්දුව අනුව, ගරු අගමැතිනිය ලුසාකා සම්මේලනයට පැමිණි ඉතියෝපියානු අගරජතුමත් සමග සාකච්ඡා කළ බවත්, ඉන් පසු සැප්තැම්බර් 7 වැනිදා රණවීර මහත්මයා නිදහස් කළ බව බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලය මාර්ගයෙන් ලංකා නියෝජිත පිරිසට දැනුම් දී තිබෙන බවත් කියන්නට කැමතියි. නුදුරු අනාගතයේදී රණවීර මහත්මයා ලංකාවට සම්ප්‍රාප්ත වෙනවා ඇතැයි මා විශ්වාස කරනවා.

එරාවූර් ප්‍රදේශයේ තිබෙන කලබලකාරී තත්ත්වය ගැන කල්කුඩාවේ ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා. එහි මුස්ලිම් ද්‍රවිඩ භේදයක් ඇතැයි කියන කියමනට මම එකඟ වන්නේ නැහැ. පසුගිය මැතිවරණයට ඉස්සර වෙලා—එරාවූර්හි නගරසභා මැතිවරණයට ඉස්සර වෙලා—ඒ නගර සභාවේ ආසන පහෙන් තුනකට මුස්ලිම් වරුන් සිටියා. ඒ වාගේම ද්‍රවිඩ මහතුන් දෙදෙනෙක්ද සිටියා. අගෝස්තු ඡන්දයෙන් පස්සේ මුස්ලිම්වරුන් හතර දෙනෙක් ඉන්නවා. ඒ හතර දෙනාම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ උදවියයි. අන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයකොඩි මයා.]

ඒ කාරණය නිසා එක අතකින් එතුමා කී කාරණයට එකඟ වන්නට මට බැහැ. හැබැයි ඊට පසු ගැටුම් ඇති වෙලා තිබෙනවා. ඒ ගැන සම්පූර්ණ පොලිස් වාර්තාවක් මා ළඟ තිබෙනවා. ඒ පොලිස් වාර්තාව අනුව ගැටුම් 67 ක් සිදු වී තිබෙන බව කියන්නටත් කනගාටුයි. ඒ ගැටුම් 67 න් සමහර එවා පහර දීම් වන අතර සොරකම් සහ නිවාසත් කඩ සාප්පුත් ගිනි තැබීම්ද තිබෙනවා. ප්‍රදේශයේ වැසියන්ගේ ආරක්ෂාව සඳහා පොලිස් සංවිධානයක් එහි තබන්නට ඕනෑ. පොලිස් සංවිධාන යොදා තිබෙන්නේ මිනිසුන්ට තර්ජනය කරන්නට යයි එතුමා සිතනවා නම් වැරදියි. පොලීස් සංවිධාන යොදා තිබෙන්නේ සාමය ආරක්ෂා කිරීමටයි. එතුමාත් මඩකලපු ප්‍රදේශයේ අනික් මන්ත්‍රීවරුත් ප්‍රදේශයේ සැරිසරා සාමය ආරක්ෂා කරන ලෙස මහජනයාගෙන් ඉල්ලා සිටියා වගේම අපිත් පොලිසිය යොදා තිබෙන්නේ සාමය ආරක්ෂා කරන්නටයි. ඒ රාවූර්හි තිබෙන කලබල කාරී තත්ත්වය දැන් ක්‍රමානුකූලව අඩුවේ ගන යනවා. ගැටුම් ආදිය දැන් නැති තරමයි. පොලීසිය නිකම්ම නිදාගෙන සිටින බව එතුමා කියන්නට යෙදුණත්, එහෙම තත්ත්වයක් නැහැ. ලැබී ඇති සාක්ෂි අනුව වැරදි කර තිබෙන හැම කෙනෙකුටම විරුද්ධව නඩු පවරන්නට පොලීසිය සූදානම් බව මා කියන්නට කැමතියි. ඒ පරීක්ෂණ දෙස බලන විට ඇතැම් සිද්ධීන් සම්බන්ධයෙන් උසාවි මගින් ක්‍රියා කිරීමට ඉඩ තිබෙන බව පෙනී යනවා. ඒ නිසා එතුමා ප්‍රකාශ කළ අන්දමට මේ රජය හෝ පැරදුණු මන්ත්‍රීන් හෝ පොලීසිය හෝ කළ වරදක් නැති බව මා මේ අවස්ථාවේදී කියන්නට ඕනෑ.

පත් කරන ලද මන්ත්‍රී අසීස් මහත්මයා තවත් ප්‍රශ්නයක් මතු කළා. 1970 සැප්තැම්බර් 1 වැනිදා කීනගල්ල වත්තේ ඉතාමත් කනගාටුදායක සිද්ධියක් ඇති වුණු බව ඇත්තයි. රාමයියා සහ අළඟ සාමි යන දෙදෙනෙකු වෙඩි වැදී මියගිය බව සත්‍යයක්. මේ අවස්ථාවේදී පොලීසිය ඉදිරිපත් කරන කරුණු කියන්නට මා අදහස් නොකරන්නේ දැනට ඒ ගැන මහෙස්ත්‍රාත් විභාගයක් පවත්වාගෙන යන නිසයි.

